

#MINORMATTERS

# ශ්‍රී ලංකාවේ ආගමික නිදහසේ තත්ත්වය පිළිබඳ සමාලෝචනයක්

# ශ්‍රී ලංකාවේ ආගමික නිදහසේ තත්ත්වය පිළිබඳ සමාලෝචනයක්

# පටුන


| | |
|---|---|
| හැඳින්වීම | 4 |
| ක්‍රමවේදය | 5 |
| අධ්‍යයනයට අදාල කාලය තුළදී ජාතික මට්ටමෙන් ඇතිවූ ප්‍රධාන සිදුවීම් | 6 |
| ආගමික නිදහසට අදාල නීති සහ රෙගුලාසි | 15 |
| ආගමික නිදහස හා ඊට ඇති අභියෝග | 21 |
| නිර්දේශයන් | 42 |
| ඇමුණුම | 46 |

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන්ට ආගම් ඇදහීමේ හෝ ආගමික විශ්වාසයක් දැරීමේ නිදහස නීතියෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකමක් වන අතර එය රටේ සියලුම ආගමික ප්‍රජාවන්ට සමානව අදාළ වේ. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ ආගමික නිදහස උල්ලංඝනය වීමේ ප්‍රවණතාවයක් සහ ආගමික නිදහස උල්ලංඝනය වීම ප්‍රචණ්ඩකාරී ස්වරූපයක් ගත් අවස්ථා කීපයක් ද පසුගිය දශකය තුළ අපට දැකගත හැකි විය.

2021 අගභාගයේදී, ජාත්‍යන්තර ආගමික නිදහස පිළිබඳ එක්සත් ජනපද කොමිසම (USCIRF) සහ එක්සත් රාජධානියේ පිහිටා ඇති ක්‍රිස්තියානි සංවිධානයක් වන "ක්‍රිස්ටියන් සොලිඩරිටි වර්ල්ඩ්වයිඩ්" (CSW) යන ආයතනයන් විසින් ප්‍රකාශයට පත් කර ඇති වාර්තාවලින් අනාවරණය වන්නේ හඳුනාගත් ප්‍රජාවන් සඳහා ආගමික නිදහස සීමා කරන නීතිමය සහ ප්‍රතිපත්තිමය බාධාවන් ශ්‍රී ලංකාව තුළ පවතින බවයි. මෙම වාර්තා දෙක මගින් ආගමික නිදහස උල්ලංඝනය වීමේ ප්‍රවණතා ගණනාවක් මෙන් ම සාවද්‍ය නෛතික භාවිතයන් නිසාවෙන් ඇති වී තිබෙන ප්‍රතිවිපාක කරණ කොටගෙන ආගමික නිදහස තවදුරටත් උල්ලංඝනය වීමේ තර්ජනයක් ද පවතින බව වාර්තා කරයි.[1]

තවද, 2022 මාර්තු මාසයේදී, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ ආගමික නිදහස පිළිබඳ විශේෂ වාර්තාකරුවකු වන අහමඩ් ෂහීඩ්, ශ්‍රී ලංකාවේ මුස්ලිම් සහ ක්‍රිස්තියානි ආගමික ප්‍රජාවට එරෙහිව සිදුවන වෙනස් කොට සැලකීම පිළිබඳ අවධානයක් යොමු කළේය.[2] මෙහිදී ඔහු පෙන්වා දුන්නේ නැගෙනහිර පුරාවිද්‍යාඋරුම කාර්ය සාධක බලකාය පිහිටුවීම, ත්‍රස්තවාද වැළැක්වීමේ පනත යටතේ සුළු ජාතිකයන් බිය ගැන්වීම සහ අත්තඩංගුවට ගැනීම සහ කෝවිඩ් 19 නිසාවෙන් අවමංගල්‍ය සහ භූමදාන කටයුතු සීමා කිරීම වැනි ක්‍රියාවන් මගින් සුළු ආගමික ප්‍රජාවන්ගේ අයිතීන් සීමාවට ලක්වන බවයි.

ශ්‍රී ලංකාවේ ආගමික නිදහස උල්ලංඝනය කුමන ආගමික ප්‍රජාවන් ඉලක්කගතව සිදු වන්නේ ද, ඔවුන්ගේ ආගමික නිදහස උල්ලංඝනය වන ආකාරය කෙබඳු ද සහ ආගමික නිදහස උල්ලංඝණය කිරීමට මූලික වන කාරකයන් මොනවාද යන්න ගැන සොයා බැලීම රට තුළ ආගමික නිදහස පවතින ආකාරය පිළිබඳව අවබෝධයක් ගැනීමෙහිලා වැදගත් වේ. ඒ අනුව, ප්‍රථමයෙන් මෙම වාර්තාවෙන් ශ්‍රී ලංකාවේ 2018 සිට ආගමික නිදහසට බලපාන ආකාරයෙන් සිදු වූ දේශපාලන වර්ධනයන් ඉදිරිපත් කිරීමත්, ආගමික නිදහසට

[1] Thames, K., 2021. *Shrinking Space for Religious Minorities in Sri Lanka*. [online] The Diplomat. Available at: https://thediplomat.com/2021/10/shrinking-space-for-religious-minorities-in-sri-lanka/

[2] United Nations Human Rights Council. 2022. *A/HRC/49/44: Rights of persons belonging to religious or belief minorities in situations of conflict or insecurity - Report of the Special Rapporteur on freedom of religion or belief*. [online] Available at: https://www.ohchr.org/en/documents/thematic-reports/ahrc4944-rights-persons-belonging-religious-or-belief-minorities

අදාළ  නීතිමය සහ ප්‍රතිපත්ති රාමුව ඉදිරිපත් කිරීමත් තුළින්  මූලික සන්දර්භය පිළිබඳ අදහසක් ලබාදීම සිදුකරන ලදී.

ඉන් අනතුරුව මෙම වාර්තාවෙන් 2018 දී සහ ඉන් පසුව සිදු කරන ලද අධ්‍යයනයන් මගින් එකතු කර ගන්නා ලද ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ද්විතීක දත්ත හරහා ප්‍රාදේශීය සහ ජාතික මට්ටමේ ආගමික නිදහස උල්ලංඝනය සිදුවන ආකාරය සහ ඒවායේ ස්වභාවය පැහැදිලි කිරීමත් එහිදී හඳුනා ගනු ලැබූ හිඩැස් පිරවීම සඳහා මෙන් ම ද්විතීක දත්ත යාවත්කාලීන කිරීමත් සිදු කරන ලදී. තවද, මෙම වාර්තාවේ අවසානයේ දී අවදානමට ලක්විය හැකි ආගමික ප්‍රජාවන්ගේ ආගමික නිදහස තවදුරටත් උල්ලංඝනය කිරීම්වලින් ආරක්ෂා කර ගන්නේ කෙසේද යන්නට  සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම ද සිදු කර ඇත.

මෙහිදි විශේෂයෙන් අවධාරණය යොමු කළ යුතු කාරණයක් වන්නේ, මෙම අධ්‍යයනය සඳහා පැවැති සම්පත් සහ කාලය පිළිබඳ සීමාවන්ට යටත්ව මෙම පර්යේෂණය, පෙර සිදු කරන ලද පර්යේෂණයන්ට අනුව සිය අගමික නිදහසට බාධාවක් ඇතැයි ප්‍රධාන වශයෙන්ම හඳුනා ගන්නා ලැබූ ආගමික කණ්ඩායම් තුනක් වන මුස්ලිම්, ක්‍රිස්තියානි සහ හින්දු යන ආගම් තුනට නාභිගත කළ බවයි.

## ක්‍රමවේදය

ඉහතින් සඳහන් කළ පරිදි මෙම අධ්‍යනයේ මූඛ්‍ය අරමුණ වුයේ ශ්‍රී ලංකාවේ ආගමික නිදහස පිළිබඳ අදහසක් ලබා ගැනීමයි. ඒ සඳහා MinorMatters ආයතනයේ අවශ්‍යතාව පරිදි මෙම අධ්‍යයනය මූලික වශයෙන් ම ද්වීතීක දත්ත පදනම් කරගෙන සිදු කිරීම සැලසුම් කරන ලදී. ඒ අනුව 2018 සිට 2022 දක්වා සිදු කර ඇති ගුණාත්මක සහ ප්‍රමාණාත්මක දත්ත මේ අධ්‍යයනය සඳහා භාවිතා කළේය. මෙම අධ්‍යයන වාර්තාව සැකසීම සඳහා 2018 වසරේ සිට සිදු කරන ලද අධ්‍යයන වාර්තා, ශ්‍රී ලංකාවේ ආගමික නිදහසට අදාළ නීති රාමූන් සහ අදාළ සමාජ, සංස්කෘතික සහ දේශපාලන වර්ධනයන් පිළිබඳ අවධානය යොමු කරන ලදී. කෙසේ නමුත් මෙම පර්යේෂණය කටයුතු සිදුකරන අතරතුර ප්‍රාථමික දත්ත එකතු කිරීමේ අවශ්‍යතාවයක් අප පර්යේෂණ කණ්ඩායමට මතු විය. ඊට ප්‍රධාන වශයෙන් හේතුවු කාරණ වන්නේ  ද්විතීක දත්ත වල යම් යම් හිඩැස් පිරවීමේ අවශ්‍යතාවය සහ රට තුළ  වර්තමානයේ ඇති වූ සමාජ, ආර්ථික සහ දේශපාලන අර්බුද හේතු කොට ගෙන ද්වීතීක දත්ත විශ්ලේෂණයට යොදාගත් දත්ත වල අදාළත්වයට කිසියම් බලපෑමක් ඇති වී ඇත්ද යන්න සොයා බැලීමටය.  ඒ සඳහා පර්යේෂණ කණ්ඩායම් විසින් මාතෘකාවට අදාළව ප්‍රාදේශීය මට්ටමේ විශේෂඥයින් සමග සම්මුඛ සාකච්ඡා  සිදු කළේය. එහිදී ප්‍රාදේශීය මට්ටමේ සිවිල් සමාජ ක්‍රියාකාරීන් (CSOs) , ආගමික නායකයින් සහ කොළඹ, මීගමුව, නුවරඑළිය, වවුනියාව, මඩකලපුව මොණරාගල, මහනුවර, පුත්තලම, යාපනය, කුරුණෑගල සහ කළුතර යන ප්‍රදේශවල රාජ්‍ය නිලධාරීන් ඇතුළු අන්තර් ආගමික සහජීවනය පිළිබඳ දිස්ත්‍රික් මට්ටමේ විශේෂඥයින් සමග සම්මුඛ සාකච්ඡා 13 ක් පැවැත්වීමෙන් මෙම අධ්‍යයට අදාළ දත්ත එක්රැස් කිරීම සිදු කරන ලදී. එම සම්මුඛ සාකච්ඡාවට සහභාගී වු පුද්ගලයන් තෝරා ගැනිමේදී කාරණා කිහිපයක් සලකා බලනු ලැබීය. ඒවා නම්, අදාළ ප්‍රතිචාරකයන් මෙම අධ්‍යයනයට භාජනය වන ආගමික කණ්ඩායම් නියෝජනය කිරීම, ඔවුන්ට

ප්‍රාදේශීය වශයෙන් ආගමික නිදහස පිළිබඳ පරිචයක් තිබීම, අධ්‍යනයන කිරීමේ කාලය තුළ පහසුවෙන් සම්බන්ධ කරගත හැකි වීම සහ ඔවුන් ක්‍රියාත්මක වන භූගෝලීය ප්‍රදේශය ආගමික නිදහස සීමා වීම සම්බන්ධයෙන් අවධාණයක් ලබා ගෙන තිබීම යනාදියයි.

## අධ්‍යයනයට අදාල කාලය තුළදී ජාතික මට්ටමෙන් ඇතිවූ ප්‍රධාන සිදුවීම්

2018 සිට 2022 මැයි මැද යන කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ ආගමික නිදහසට බලපෑ හැකි ආකාරයෙන් සිදු වු දේශපාලනික සිදුවීම මෙම පරිච්ඡේදයෙන් ඉදිරිපත් කරනු ලැබේ.

| | | |
|---|---|---|
| *2018* | *පෙබරවාරි 22* | *මැද මහනුවර, අම්බල ප්‍රදේශයේ සිංහල ලොරි රථ රියදුරෙකුට තෙල්දෙණිය, කරලියද්ද ප්‍රදේශයේදී මුස්ලිම් තරුණයින් හතර දෙනෙකු විසින් පහර දෙන ලදී.*[3] |
| | *පෙබරවාරි 27* | *අම්පාරේ අලුයම ඇති වූ ගැටුමකින් කඩසාප්පු හතරකට සහ මුස්ලිම් දේවස්ථානයකට හානි සිදුවිය. මෙම ගැටුමෙන් අවම වශයෙන් පුද්ගලයින් තිදෙනෙකුට වඩා තුවාල ලබා ඇති බව වාර්තා වේ.*[4] |
| | *මාර්තු 2* | *පෙබරවාරි 22 වැනිදා සිංහල ජාතික ලොරි රථ රියැදුරකු පහරකෑමට ලක්ව මියයාමේ සිද්ධියට විරෝධය පළ කරමින් යම් පිරිසක් විසින් පාරේ ටයර් පුලුස්සමින් විරෝධතාවයක නිරත විම සිදු කළ අතර උඩිස්පත්තු ප්‍රදේශයේ මුස්ලිම් කඩ සාප්පු ඉලක්ක කරගත් ප්‍රචණ්ඩ ක්‍රියා කිහිපයක් ද පිළිබඳ එදින වාර්තා විය.*[5] |
| | *මාර්තු 5* | *දිගන ප්‍රදේශයේදී විශාල මැර පිරිසක් නගරයට එක්රැස් වී මුස්ලිම් පල්ලියකට, සාප්පු හා නිවාසවලට ගිනි තැබූහ. උදෑසන දිගන දක්වා පැතිර ගිය මෙම නොසන්සුන්තාව අනෙකුත් ප්‍රදේශවලට ද පැතිර යන ලදී.*[6] |

[3] *2018 Anti-Muslim Riots in Sri Lanka*. [online] Available at: https://en.wikipedia.org/wiki/2018_anti-Muslim_riots_in_Sri_Lanka
[4] Ibid.
[5] Ibid.
[6] Ibid.

| | | |
|---|---|---|
| | *මාර්තු 6* | *මහනුවර දිස්ත්‍රික්කයේ මුස්ලිම් විරෝධී කෝලාහලවලට ප්‍රතිචාර වශයෙන් රජය දින 10 ක රටපුරා හදිසි තත්වයක් ප්‍රකාශයට පත් කර, සමාජ මාධ්‍ය වෙත ප්‍රවේශය සීමා කළ අතර පුද්ගලයන් 100 කට වැඩි පිරිසක් අත්අඩංගුවට ගන්නා ලදී.*[7] |
| | *ඔක්තෝම්බර් 26* | *ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා හිටපු ජනාධිපති සහ පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද රාජපක්ෂ මහතා අගමැති ලෙස පත් කිරීමත් සමග ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාමය අර්බුදයක් ආරම්භ විය. මෙහිදී එවක අගමැති රනිල් වික්‍රමසිංහ නිල වශයෙන් නෙරපා හැරීමට ප්‍රථමයෙන් ඒ හා සමගාමී අගමැතිවරුන් දෙදෙනෙකු පත් ව සිටිම දැකගත හැකි විය.*[8] |
| | *දෙසැම්බර් 26* | *කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රදේශයේ බුදු පිළිමයකට ප්‍රහර දීම හා අලාභ හානි සිදු කිරීමේ සිද්ධියක් වාර්තා විය*[9] |
| ***2019*** | *අප්‍රේල් 21* | *පල්ලි තුනක් සහ තරු පහේ හෝටල් තුනක් ඉලක්ක කර ගනිමින් පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පුද්ගලයන් 269 දෙනෙකු මිය ගොස් 500කට පමණ තුවාල සිදු විය.*[10] |
| | *අප්‍රේල් 26* | *ශ්‍රී ලංකාවේ හිටපු ආරක්ෂක ප්‍රධානී ගෝඨාභය රාජපක්ෂ සිකුරාදා ප්‍රකාශ කළේ තමා මේ වසරේ ජනාධිපතිවරණයට ඉදිරිපත් වන බවයි.*[11] |
| | *මැයි 14* | *ජාතික තව්හිද් ජමාත් (NTJ), ජමාතේ මිල්ලතේ ඊබ්‍රාහිම් (JMI) සහ විල්ලයත් අස් සේය්ලානි (WAS) යන සංවිධාන තහනම් කරමින්* |

[7] Ibid.
[8] *2018 Sri Lankan Constitutional Crisis*. [online] Available at: https://en.wikipedia.org/wiki/2018_Sri_Lankan_constitutional_crisis#:~:text=A%20constitutional%20crisis%20began%20in,in%20two%20concurrent%20Prime%20Ministers.
[9] Colombo Telegraph. 2018. *Several Buddha Statues Attacked In Mawanella: Police Arrest Two Suspects*. [online] Available at: https://www.colombotelegraph.com/index.php/several-buddha-statues-attacked-in-mawanella-police-arrest-two-suspects/
[10] CNN. 2019. *Terror in Sri Lanka*. [online] Available at: https://edition.cnn.com/interactive/2019/04/world/sri-lanka-attacks/
[11] Reuters. 2019. *Exclusive: Sri Lankan ex-defense chief Gotabaya says he will run for president, tackle radical Islam*. [online] Available at: https://www.reuters.com/article/us-sri-lanka-blasts-gotabaya-exclusive-idUSKCN1S21UF .

| | |
|---|---|
| | ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන විසින් අතිවිශේෂ ගැසට් නිවේදනයක් නිකුත් කරන ලදී.[12] |
| මැයි 23 | බොදු බල සේනා (BBS) මහ ලේකම් ගලගොඩඅත්තේ ඥානසාර හිමියන්ට ජනාධිපති සමාව හිමි විය.[13] |
| මැයි 25 | 42 හැවිරිදි වෛද්‍යවරයකු වන වෛද්‍ය සේගු සියාබ්දීන් මොහොමඩ් ෂාෆි පසුගිය මැයි 25 වැනිදා කුරුණෑගල පොලිසිය විසින් අත්අඩංගුවට ගනු ලැබීය. ත්‍රස්තවාදී කණ්ඩායමකට සම්බන්ධ ධනය රැස්කරන බව සහ සිංහල කාන්තාවන් බලහත්කාරයෙන් වන්ධ්‍යාකරණ සැත්කම් කළ බවට එල්ල වූ මූලික චෝදනා මත සැකපිට අත්අඩංගුවට ගනු ලැබීය.[14] |
| ජූනි 4 | පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයෙන් පසු සමාජයේ ඇති වූ මුස්ලිම් විරෝධී තර්ජනයන් හෙළා දකිමින් ඊට එරෙහිව සාමූහික නැගීසිටීමක් වශයෙන් ශ්‍රී ලංකාවේ මුස්ලිම් මන්ත්‍රීවරුන් විසින් කැබිනට් නිලයන් දැරූ හතර දෙනෙකු ඇතුළුව අමාත්‍යවරුන් නව දෙනෙකු සඳුදා ඉල්ලා අස්විය.[15] |
| ජූලි 26 | මැයි 25 වැනිදා අත්අඩංගුවට ගත් මුස්ලිම් වෛද්‍යවරයකුට අධිකරණය මගින් බ්‍රහස්පතින්දා ඇප ලබා දුන්නේය.[16] |
| අගෝස්තු 21 | මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත සංශෝධනය කිරීමේ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇත. එම යෝජනාව මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය අබ්දුල් හලීම් සහ අධිකරණ |

---

12 The Economic Times. 2019. *Sri Lanka President bans NTJ, two other Islamist extremist organisations*. [online] Available at: https://economictimes.indiatimes.com/news/international/world-news/sri-lanka-president-bans-ntj-two-other-islamist-extremist-organisations/articleshow/69322882.cms?from=mdr

13 Daily FT. 2019. *President pardons Gnanasara Thero*. [online] Available at: https://www.ft.lk/Front-Page/President-pardons-Gnanasara-Thero/44-678714

14 NDTV. 2019. *Doctor Arrested For "Sterilising" Women In Sri Lanka Was Framed: Probe*. [online] Available at: https://www.ndtv.com/world-news/doctor-arrested-for-sterilising-women-in-sri-lanka-was-framed-probe-2064837

15 New York Times. 2019. *All 9 of Sri Lanka's Muslim Ministers Resign, as Bombing Backlash Intensifies*. [online] Available at: https://www.nytimes.com/2019/06/03/world/asia/sri-lanka-muslim-ministers-resign.html

16 Aneez, S., 2019. *Sri Lanka court grants bail for doctor accused of sterilizing Buddhist women*. [online] Available at: https://www.reuters.com/article/us-sri-lanka-doctor-idUSKCN1UK2SN .

| | | |
|---|---|---|
| | | *හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය තලතා අතුකෝරළ විසින් සභාගත කරන ලදී.*[17] |
| | *ඔක්තෝබර් 25* | *ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ (SLPP) ජනාධිපති අපේක්ෂක ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරණය ඉලක්ක කොටගෙන ආර්ථිකය වැඩි දියුණු කිරීමට සහ ජාතික ආරක්ෂාව මෙන් ම "එක රටක් - එක් නීතියක්" යන සංකල්පයට ප්‍රමුඛත්වය දෙමින් "සෞභාග්‍යයේ දැක්ම" යන්නෙන් ප්‍රතිපත්ති ප්‍රකාශය නිකුත් කළේය.*[18] |
| | *නොවැම්බර් 16* | *ශ්‍රී ලංකා ජනාධිපතිවරණය පැවතුණි.*[19] |
| | *නොවැම්බර් 17* | *ශ්‍රී ලංකා ජනාධිපතිවරණයෙන් ගෝඨාභය රාජපක්ෂ ජයග්‍රහණය කරන ලදී.*[20] |
| | *නොවැම්බර් 18* | *ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ අපේක්ෂක ගෝඨාභය රාජපක්ෂ ශ්‍රී ලංකාවේ 7 වැනි විධායක ජනාධිපතිවරයා ලෙස නොවැම්බර් 18 දින අනුරාධපුර රුවන්වැලි මහා සෑයේදී දිවුරුම් දුන්නේය.*[21] |
| ***2020*** | *මාර්තු 27* | *සංඝ සමුළුව ඒකමතිකව එකඟ වුවහොත් පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසු අන්‍යාගමිකකරණයට එරෙහි පනතක් ඉදිරිපත් කළ හැකි බව ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ නිවේදනය කළේය.*[22] |

[17] The Morning - Sri Lanka News. 2019. *Cabinet nod for MMDA reforms*. [online] Available at: http://www.themorning.lk/cabinet-nod-for-mmda-reforms/

[18] Colombo Gazette. 2019. *Gotabaya releases manifesto giving priority to economy, security*. [online] Available at: https://colombogazette.com/2019/10/25/gotabaya-releases-manifesto-giving-priority-to-economy-security/

[19] 2019. *2019 Sri Lankan Presidential Election*. [online] Available at: https://en.wikipedia.org/wiki/2019_Sri_Lankan_presidential_election

[20] Ibid.

[21] Ibid.

[22] New Europe. 2020. *Sri Lankan PM promises to introduce new anti-conversion bill to protect Buddhists*. [online] Available at: https://www.neweurope.eu/article/sri-lankan-pm-promises-to-introduce-new-anti-conversion-bill-to-protect-buddhists/

| | | |
|---|---|---|
| | *අප්‍රේල් 12* | *රටේ මුස්ලිම් සහ කතෝලිකයන්ගේ විරෝධතා නොසලකා හරිමින් කොරෝනා වෛරසයට ගොදුරු වූවන් ආදාහන කිරීම අනිවාර්ය කිරීමේ ගැසට් නිවේදනයක් නිකුත් කරන ලදී .*[23] |
| | *ජූනි 2* | *ශ්‍රී ලංකා ජනාධිපතිවරයා විසින් නැගෙනහිර පළාතේ පුරාවිද්‍යා උරුම කළමනාකරණය සඳහා වූ ජනාධිපති කාර්ය සාධක බලකාය අති විශේෂ ගැසට් පත්‍රය මගින් පිහිටුවන ලදී.*[24] |
| | *අගෝස්තු 5* | *ශ්‍රී ලංකාවේ 16 වැනි පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුන් 225ක් තෝරා පත් කර ගැනීම සඳහා 2020 අගෝස්තු 5 වැනි දින  පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්විණි.*[25] |
| | *සැප්තැම්බර් 8* | *මස් සඳහා ගව ඝාතනය තහනම් කිරීමට අගමැති මහින්ද රාජපක්ෂ මහතා යෝජනා කළ බව පාලක පක්ෂය වන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ප්‍රකාශ කරන ලදී.*[26] |
| | *ඔක්තෝබර් 22* | *20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවේ $\frac{2}{3}$ බහුතරයකින් සම්මත විය.*[27] |
| ***2021*** | *ජනවාරි 27* | *බදාදා ප්‍රකාශයට පත් කරන ලද නව එක්සත් ජාතීන්ගේ වාර්තාව මගින් අනතුරු අඟවන්නේ ශ්‍රී ලංකාව අතීතයේ සිදු වූ අයිතීන් උල්ලංඝනයන් ආමන්ත්‍රණය කිරීමට අපොහොසත් වීම සහ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් නැවත සිදුවීමේ අවදානම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති බවයි. එනම් නීතිය ඉදිරියේදී වරදකරුවන්වූවන් නිදහස්* |

[23] The Times of India. 2020. *Sri Lanka makes cremation compulsory for Covid-19 deaths*. [online] Available at: https://timesofindia.indiatimes.com/world/south-asia/sri-lanka-makes-cremation-compulsory-for-covid-19-deaths/articleshow/75109273.cms

[24] Tamil Guardian. 2020. *All Sinhala task force for Sri Lanka's 'archaeology' in East*. [online] Available at: https://www.tamilguardian.com/content/all-sinhala-task-force-sri-lanka%E2%80%99s-%E2%80%98archaeology%E2%80%99-east

[25] Wikipedia. 2020. *2020 Sri Lankan Parliamentary Election*. [online] Available at: https://en.wikipedia.org/wiki/2020_Sri_Lankan_parliamentary_election

[26] TRT World. 2020. *Why is Sri Lanka planning to ban cattle slaughter?*. [online] Available at: https://www.trtworld.com/magazine/why-is-sri-lanka-planning-to-ban-cattle-slaughter-39643

[27] Parliament of Sri Lanka – News. 2020. *"20th Amendment to the Constitution" passed in Parliament*. [online] Available at: https://www.parliament.lk/news-en/view/1943

| | |
|---|---|
| | *කිරීම , රජයේ කාර්යයන්හි මිලිටරිකරණය වැඩි වීම, වාර්ගික-ජාතිකවාදය සාව්‍ය කථනයන් සහ සිවිල් සමාජය බිය ගැන්වීම වැනි සිද්ධීන් පසුගිය වසර පුරා දැකිය හැකි ප්‍රවනතාවන් ලෙස මෙම වාර්තා මගින් පෙන්වා දෙයි.*[28] |
| *පෙබරවාරි 3* | *"පොතුවිල් සිට පොලිකන්ඩිය දක්වා රැලිය" නොහොත් 'P2P' නැගෙනහිර අම්පාර දිස්ත්‍රික්කයෙන් ආරම්භ වී උතුරු පළාතේ යාපන දක්වා එම මාර්ගයේ නගර කිහිපයක් ආවරණය කරමින් පැවැත්විණි. දෙමළ හා මුස්ලිම් ප්‍රකට දේශපාලනඥයන්, ක්‍රියාකාරීන්, ශිෂ්‍යයන් සහ ප්‍රදේශවාසීන් පාගමනට සහභාගි වූහ. දෙමළ ප්‍රදේශවල සිදුවන ඉඩම් කොල්ලය, "රජයේ අනුග්‍රහය ලබන" සිංහල ජනාවාසකරණය , බලහත්කාරයෙන් පුද්ගලයන් අතුරුදන් කිරීම්, මිලිටරීකරණය, සමාජ ක්‍රියාකාරීන් සහ මාධ්‍යවේදීන් බිය ගැන්වීමට , ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අඛණ්ඩව භාවිතා කිරීම සහ දේශපාලන සිරකරුවන් නඩු විභාගයකින් තොරව රඳවා තබා ගැනීම යන කාරණා මෙම විරෝධතාව රැලියේ ඉල්ලීම් වේ. මෙහිදී තවදුරටත් ක්‍රියාකාරීන් රජයෙන් ඉල්ලා සිටියේ මුස්ලිම්වරුන්ට බලපාන බලහත්කාර ආදාහන ප්‍රතිපත්තිය ආපසු හැරවිය යුතු අතර වතු කම්කරුවන්ට සාධාරණ වැටුපක් සහතික කරන ලෙසයි.*[29] |

[28] United Nations Human Rights – Office of the High Commisioner for Human Rights. 2021. [online] Available at: https://www.ohchr.org/en/press-releases/2021/01/sri-lanka-alarming-path-towards-recurrence-grave-human-rights-violations-un

[29] The Hindu. 2021. *Analysis | A long march in Sri Lanka — to register protest, forge a new alliance*. [online] Available at: https://www.thehindu.com/news/international/a-long-march-in-sri-lanka-to-register-protest-forge-a-new-alliance/article33792547.ece

| | |
|---|---|
| පෙබරවාරි 14 | නේපාලයේ සහ ශ්‍රී ලංකාව තුළ ඉන්දියාවේ භාරතීය ජනතා පක්ෂ ආණ්ඩු පිහිටුවීමට අමිත් ෂා  සැලසුම් ඇති බව ත්‍රිපුර මහ ඇමති බිප්ලාබ් ඩෙබ් ප්‍රකාශයක් කරයි.[30] |
| පෙබරවාරි 18 | පුද්ගලයන් සදාචාර විරෝධී ලෙස විවිධ ආගම්වලට හරවා ගැනීමට එරෙහිව (අන්‍යාගමිකකරණයට එරෙහිව) නීතිමය රාමුවක් සකස් කිරීම ආරම්භ කර ඇති බව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය පවසයි.[31] |
| පෙබරවාරි 26 | ශ්‍රී ලංකාව විසින්  කෝවිඩ් 19 හේතුවෙන් මියගිය අයගේ සිරුරු අනිවාර්යයෙන් ආදාහනය කිරීමේ නියෝගය සංශෝධනය කර ඇති අතර, කෝවිඩ් 19 හේතුවෙන් මියගිය අයගේ සිරුරු භූමදානය සහ ආදාහන කටයුතු යන දෙකටම මේ නිසා ඉඩ සැලසිණි.[32] |
| මාර්තු 13 | ආගමික අන්තවාදයට එරෙහිව කටයුතු කිරීම සඳහා මානව හිමිකම් ආරක්ෂකයින් විසින් 'කුරිරු' ලෙස හඳුන්වන ආන්දෝලනාත්මක ත්‍රස්තවාදය වැළැක්වීමේ (PTA) නීතිය, සැකකරුවන් රඳවා තබා ගැනීමට පුළුල් බලතල සහිතව මින් ඉදිරියේ දී භාවිතා කරන බව මහජන ආරක්ෂක අමාත්‍ය සරත් වීරසේකර පැවසීය. එසේම ශ්‍රී ලංකාව තුළ බුර්කාව තහනම් කිරීමට සහ ලියාපදිංචි නොකළ මද්‍රාසා පාසල් වසා දැමීමට පියවර ගන්නා බව ද ඔහු නිවේදනය කරන ලදී.[33] |
| මාර්තු 23 | ශ්‍රී ලංකාවට එරෙහි එක්සත් ජාතීන් විසින් ඉදිරිපත්කළ යෝජනාව මගින් ප්‍රධාන වශයෙන් "ආණ්ඩුවේ ක්‍රියාකාරකම් තුළ මිලිටරිකරණය වීම |

[30] The Wire. 2021. *'Amit Shah Has Plans to Form BJP Govts in Nepal, Sri Lanka': Tripura CM Biplab Deb*. [online] Available at: https://thewire.in/politics/amit-shah-has-plans-to-form-bjp-govts-in-nepal-sri-lanka-tripura-cm-biplab-deb

[31] Fonseka, R., 2021. *New laws against unethical conversions*. [online] The Morning - Sri Lanka News. Available at: http://www.themorning.lk/new-laws-against-unethical-conversions/

[32] BBC News. 2021. *Covid-19: Sri Lanka reverses 'anti-Muslim' cremation order*. [online] Available at: https://www.bbc.com/news/world-asia-56205737 .

[33] Srinivasan, M., 2021. *Sri Lanka announces burqa ban, to shut 1,000 madrasas*. [online] The Hindu. Available at: https://www.thehindu.com/news/international/sri-lanka-to-ban-burqa-shut-many-islamic-schools-minister/article34061652.ece

| | | |
|---|---|---|
| | | *වැඩිවීම, අධිකරණයේ ස්වාධීනත්වය බිඳ වැටීම සහ දිවයින පුරා උග්‍ර වී ඇති" දෙමළ හා මුස්ලිම් සුළුතරයන් ආන්තිකකරණයට ලක් වීම වැඩි වීම යන හේතූන් ඉස්මතු කරන ලදී. කෝවිඩ් 19 වසංගතයට ගොදුරු වීමෙන් මිය යන මුස්ලිම් ජතිකයින් සහ වෙනත් ආගම්වල සාමාජිකයින්ගේ භූමදානය කිරීමේ ආගමික අයිතිය වැළැක්වීම සම්බන්ධයෙන් ද මෙහිදී අවධානයට ලක් විය.*[34] |
| | *ඔක්තෝබර් 27* | *ශ්‍රී ලංකා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ විසින් "එක් රටක් එක නීතියක්" සංකල්පය ස්ථාපිත කිරීම සහ පනත් කෙටුම්පතක් සකස් කිරීම සඳහා 13 දෙනෙකුගෙන් යුත් කාර්ය සාධක බලකායක් පත් කර ඇත.*[35] |
| ***2022*** | *පෙබරවාරි 25* | *ශ්‍රී ලංකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්ගේ වාර්තාව මගින් මෙරට මානව හිමිකම් පරිහානියට පත්වන තත්ත්වය පෙන්නුම් කරන අතර රජය විසින් එය වැළැක්වීමට නිසි පියවරක් නොගන්නා බව මෙම වාර්තා මගින් අනාවරණය කරයි.*[36] |
| | *මාර්තු 8* | *පාස්කු ඉරිදා ප්‍රහාරය මහා දේශපාලන කුමන්ත්‍රණයක කොටසක් බව* UNHRC *වෙත කාදිනල්තුමා පවසයි.*[37] |

[34] UN News. 2021. *Human Rights Council strengthens rights office probe into Sri Lanka's long civil war*. [online] Available at: https://news.un.org/en/story/2021/03/1088122

[35] Crisis Group. 2021. *"One Country, One Law": The Sri Lankan State's Hostility toward Muslims Grows Deeper*. [online] Available at: https://www.crisisgroup.org/asia/south-asia/sri-lanka/%E2%80%9Cone-country-one-law%E2%80%9D-sri-lankan-states-hostility-toward-muslims-grows-deeper

[36] Human Rights Watch. 2022. *Sri Lanka: UN Report Describes Alarming Rights Situation*. [online] Available at: https://www.hrw.org/news/2022/03/03/sri-lanka-un-report-describes-alarming-rights-situation#:~:text=The%20report%2C%20issued%20on%20February,past%20abuses%20has%20been%20blocked.

[37] The Hindu. 2022. *Easter attacks was a 'grand political plot', Sri Lanka cardinal tells UNHRC*. [online] Available at: https://www.thehindu.com/news/international/easter-attacks-was-a-grand-political-plot-sri-lanka-cardinal-tells-unhrc/article65201574.ece

| | |
|---|---|
| *මාර්තු* | *ආර්ථික අර්බුදයට ප්‍රතිචාර වශයෙන් ගෝඨාභය රාජපක්ෂගේ ආණ්ඩුවට එරෙහිව දිවයින පුරා විරෝධතා ආරම්භ විය.*[38] |
| *අප්‍රේල් 30* | *මහා සංඝරත්නය අග්‍රාමාත්‍යවරයාට සහ පාලක පක්ෂය වන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ (SLPP) මන්ත්‍රීවරුන්ට වහාම අමාත්‍ය මණ්ඩලයෙන් ඉවත් වන ලෙස හෝ එහි ප්‍රතිවිපාකවලට මුහුණ දෙන ලෙසට අවසාන නිවේදනයක් නිකුත් කරයි. එසේම මහා සංඝරත්නයේ ජ්‍යෙෂ්ඨයන් විසින් නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියේ දේශපාලන පක්ෂවලින් සභය පළ කරන ලෙසයි.*[39] |
| *මැයි 6* | *රට තුළ උත්සන්න වන විරෝධතා මධ්‍යයේ ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා හදිසි නීතිය ප්‍රකාශ කරන ලදි.*[40] |
| *මැයි 9* | *රටේ පවතින වර්තමාන ආර්ථික හා දේශපාලන අර්බුදය සම්බන්ධයෙන් ජනතාවගේ අප්‍රසාදය පෙන්නුම් කරමින් රට පුරා පැන නැගුනු මහජන විරෝධතා සහ ප්‍රචණ්ඩත්වය මධ්‍යයේ අගමැති මහින්ද රාජපක්ෂ අගමැති ධූරයෙන් ඉල්ලා අස්විය.*[41] |
| *මැයි 12* | *රනිල් වික්‍රමසිංහ ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍යවරයා ලෙස දිවුරුම් දෙන ලදී.*[42] |

[38] Reuters. 2022. *Protests flare in crisis-hit Sri Lanka as govt readies for IMF talks*. [online] Available at: https://www.reuters.com/world/asia-pacific/sri-lanka-begin-official-talks-with-imf-next-month-protests-grow-2022-03-15/

[39] Business Standard. 2022. *Sri Lanka's powerful Buddhist clergy threatens to issue anti-govt decree*. [online] Available at: https://www.business-standard.com/article/international/sri-lanka-s-powerful-buddhist-clergy-threatens-to-issue-anti-govt-decree-122043000368_1.html

[40] Wikipedia. 2022. *2022 Sri Lankan Protests*. [online] Available at: https://en.wikipedia.org/wiki/2022_Sri_Lankan_protests#March

[41] Ibid.

[42] Ibid.

## ආගමික නිදහසට අදාල නීති සහ රෙගුලාසි

ශ්‍රී ලංකාවේ විවිධ ආගමික ප්‍රජාවන්ගේ ආගමික නිදහසට සෘජුව සහ වක්‍රව බලපාන මෑත කාලීනව පනවන ලද විවිධ නීති රීති පිළිබඳ සමාලෝචනයක් මෙම පරිච්ඡේදයෙන් ඉදිරිපත් කරයි. මෙම පරිච්ඡේදයෙන් දැනට පවතින නීති සම්පාදනය පමණක් නොව, ආගමික නිදහස සීමා කරන යෝජිත නීති, රෙගුලාසි, චක්‍රලේඛ, රාජ්‍ය භාවිතයන් සහ ගැසට් පිළිබඳව ද විමර්ශනය කරනු ලබයි.

### ව්‍යවස්ථාමය විධිවිධාන

ආගම සම්බන්ධ ව්‍යවස්ථාමය විධිවිධාන 9, 10, 12 සහ 14 (1) (ඉ) වගන්තිවල දක්නට ලැබේ. 9 වැනි වගන්තිය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය ලබා දෙන අතර බුද්ධාගම ආරක්ෂා කිරීම සහ පෝෂණය කිරීමට රාජ්‍යයේ වගකීමක් ඇති බව තහවුරු කරයි. එසේම 9 වන වගන්තිය මගින් 10 සහ 14 (1) (ඉ) වගන්ති මගින් ඇති අයිතීන් සියලු ආගම්වලට සහතික කරයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථවේ 10 වැනි වගන්තිය පුරවැසියන්ට "ඔහු කැමති ආගමක් හෝ විශ්වාසයක් දැරීමේ හෝ පිළිගැනීමේ නිදහස ඇතුලුව සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ සහ ආගමේ නිදහස" ලබා දෙයි. එසේ ම මෙම වගන්තිය පුරවැසියන්ට හිමි පරම අයිතියකි. 14 (1) (ඉ) යන වගන්තිය මගින් පුරවැසියන්ට තමන් විසින් හෝ අන් අය සමඟ ඇසුරු කිරීමට, ප්‍රසිද්ධියේ හෝ පුද්ගලිකව තම ආගම හෝ නමස්කාර හෝ වැඳුම් පිදුම් පිළිපැදීමට සහ පිළිපැදීමට අවශ්‍යය නිදහස ලබා දෙයි. කෙසේ වෙතත් 14 (1) (ඉ) ව්‍යවස්ථාව 15 (7) යටතේ නීතියෙන් පනවනු ලබන යම් යම් සීමාවන්ට යටත් වේ. එම සීමාවන් නම් ජාතික ආරක්ෂාව, මහජන සාමය සහ මහජන සෞඛ්‍ය හෝ සදාචාරය ආරක්ෂා කිරීම හෝ අරමුණ සඳහා අන් අයගේ අයිතිවාසිකම් සහ නිදහස සඳහා නිසි පිළිගැනීමක් සහ ගෞරවයක් ලබා ගැනීම හෝ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයේ පොදු සුබසාධනයේ සාධාරණ අවශ්‍යතා සපුරාලීම විය හැකිය.

ගුණතිලක (2015) අනුව ශ්‍රී ලංකාවේ පුළුල් ව්‍යවස්ථාමය රාමුව ආගමික නිදහස තහවුරු කරන අතරම එම නිදහසේ ප්‍රකාශනයට අදාළ සීමාවන් සම්බන්ධයෙන් තරමක දෙගිඩියාවෙන් සිටින බව පෙනේ . නිදසුනක් වශයෙන් ඇතැම් ව්‍යාස්ථාමය විධිවිධානවලට ලබා දී ඇති අර්ථකථන අනුව ආගම ප්‍රචාරය කිරීම ශ්‍රී ලංකාවේ සියලුම ආගම්වලට එක හා සමානව ලබාදී ඇති අයිතියක් නොවේ.[43] එපමණක් නොව බුදුදහමට පැහැදිළිව ප්‍රමුඛස්ථානයක් ලබාදීමෙන් ව්‍යවස්ථාව මගින් "අනෙකා" යන ප්‍රවර්ගය නිර්මාණය කර ඇති බව ද ඇතැම් විද්වතුන්ගේ මතයයි.[44] මෙම වෙනස නිර්මාණය කිරීම බහුත්වවාදී සමාජයක් තුළ වෙනස් කොට සැලකීමට සහ සමානත්මතාවයේ මුලික මූලධර්මය යටපත් කිරීමට හැකියාවක් ඇත.[45]

---

[43] Gunatilleke, G., 2015. *The Chronic and the Acute Post War Religious Violence in Sri-Lanka*. [online] International Centre for Ethnic Studies. Available at: https://ices.lk/wp-content/uploads/2016/01/The-Chronic-and-the-Acute-Post-War-Religious-Violence-in-Sri-Lanka.pdf

[44] Welikala, A., 2013. *The Sri Lankan Republic at 40*. Colombo, Sri Lanka: Centre for Policy Alternatives (CPA).

[45] Ibid.

## ජාත්‍යන්තර නීතිය

ජාත්‍යන්තර තලය තුළ ශ්‍රී ලංකාව මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (UDHR) ඇතුලුව ආගමික නිදහස පිළිගන්නා ජාත්‍යන්තර ගිවිසුම් කිහිපයකට බැඳී ඇත. මෙහිදී මානව හිමිකම් විශ්ව ප්‍රකාශනයෙහි 18 වැනි වගන්තියේ සෑම අයෙකුටම සිතීමේ නිදහසට, හෘදය සාක්ෂියට සහ ඕනෑම ආගමක් ඇදහීමට අයිතියක් පවතී. එසේ ම, තවදුරටත් සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියෙහි (ICCPR) 18 වැනි වගන්තියේ සඳහන් වන්නේ පුද්ගලයකුගේ ආගමික නිදහසට ඔහු කැමැති ආගමක් හෝ විශ්වාසයක් දැරීමට හෝ පිළිගැනීමට ඇති නිදහස සහ තනි තනිව හෝ වෙනත් අය සමග ප්‍රජාව තුළ ප්‍රසිද්ධියේ හෝ පුද්ගලිකව වැඳුම් පිදුම් කිරීමට, පිළිපැදීමට සහ ඉගැන්වීමට ඔහුගේ හෝ ඇයගේ ආගම විශ්වාස කිරීමට අයිතිය තිබිය යුතු බවයි

මෙයට අමතරව සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියෙහි (ICCPR) 20 (2) වගන්තියේ මෙසේ සඳහන් වේ, වෙනස්කොට සැලකීම, සතුරුකම හෝ ප්‍රචණ්ඩත්වය සඳහා උසිගැන්වීමක් වන ජාතික, වාර්ගික හෝ ආගමික වෛරය වෙනුවෙන් පෙනී සිටීම නීතියෙන් තහනම් වේ . ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකාව මෙබඳු ගිවිසුම් වලට අත්සන් කර ඇති බැවින් ආගමික නිදහස ආරක්ෂා කිරීමට සහ එය ප්‍රවර්ධනය කිරීමට සහ ඉටු කිරීමට බැඳී සිටිනු ඇත.

## ජනවාර්ගික ප්‍රජාවට විශේෂිත වූ නීති

මෙහිදී දික්කසාදය, ළමයින්ගේ භාරකාරීත්වය සහ දේපළ උරුමය ඇතුලු පවුල් / සිවිල් නීතියට අදාළ කාරණා ඒ ඒ ජනවාර්ගික හෝ ආගමික කණ්ඩායමේ චාරිත්‍රානුකූල නීතිය හෝ රටේ සිවිල් නීතිය යටතේ විනිශ්චය කරනු ලැබේ. 1951 මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතට අනුව ඉස්ලාම් පුද්ගලික නීතිය මුස්ලිම්වරුන්ගේ විවාහ සහ දික්කසාද පාලනය කරන අතර සිවිල් නීතිය බොහෝ දේපොළ අයිතිවාසිකම් සඳහා අදාළ වේ . උතුරු පළාතේ සිවිල් නීතිය විවාහ පාලනය කරන අතර තේසවලමෛ නීතිය (දෙමළ චාරිත්‍ර නීතිය) බොහෝ විට දේපල බෙදීම පාලනය කරයි. සමහර සිංහලයන් සඳහා උඩරට නීතිය (යටත්විජිත සමයේ උඩරට රාජධානියේ සම්ප්‍රදායන් මත පදනම් වූ) උරුම ගැටලු වැනි සිවිල් කාරණා පාලනය කරන අතර එය කුල ක්‍රමය මත ක්‍රියාත්මක වේ.[46]

## ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ශ්‍රී ලංකාව තුළ 1979 දී හඳුන්වා දෙනු ලැබුවේ කිසියම් ආකාරයක භාවිතයක් ප්‍රවර්ධනය කිරීම හෝ අනුබල දෙන එම සමාජයේ කණ්ඩායමක් හෝ පුද්ගලයන් හෝ සංවිධාන විසින් ඇති කළ හැකි තර්ජනයන් විසඳීමේ අරමුණ ඇතිවය. නමුත් මෙය තාවකාලික නීති සම්පාදනයක් වශයෙන් ආරම්භ විය. මෙමගින් රට තුළ බලහත්කාරයෙන් හෝ සාපරාධී ක්‍රියාකාරකම්වල යෙදීම වැළැක්වීමට

[46] *Sri Lanka 2020 International Religious Freedom Report*. [online] Available at: https://lk.usembassy.gov/wp-content/uploads/sites/149/2020-INTERNATIONAL-RELIGIOUS-FREEDOM-REPORT-SRI-LANKA.pdf

අවශ්‍යය පසුබිම සකස් කිරීම මෙහි මූලික අරමුණු විය.[47] ඓතිහාසික වශයෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ජාතික හදිසි අවස්ථා තුනකදී බහුලව භාවිතා විය.[48] නිදර්ශනයක් ලෙස මෑත කාලීනව 2019 පාස්කු ප්‍රහාරයෙන් පසුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත භාවිතා කරන ලදී. එතැන් සිට නීතිය අත්තනෝමතික ලෙස භාවිතා කිරීම මෙන්ම ඉලක්කගත ආගමික සුළුතරයන්ගේ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පමණක් නොව විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ආරක්ෂා කර ඇති සුළුජාතීන්ගේ ඇදහිලි , විශ්වාසයන් සහ පිළිපැදීමේ නිදහස උල්ලංඝණය වීම් පවතින බැවින් මේ පිළිබඳ පුලුල් විවාදයක් වර්තමානයේ පවතී.

## අන්‍යාගමිකරණ විරෝධී පනත් කෙටුම්පත

අන්‍යාගමිකරණ විරෝධී නීතිය ඇති කිරීමේ පසුබිම දශකයකට වඩා කාලයක් පුරා වරින් වර ඉස්මතු වුවකි. 2009 දී ජාතික හෙළ උරුම පක්ෂය විසින් පුද්ගලයන් සදාචාර විරෝධී ලෙස විවිධ ආගම්වලට හරවා ගැනීමට එරෙහිව පනත් කෙටුම්පතක් යෝජනා කරන ලදී.[49] ඔවුන්ගේ තර්කය වූයේ බලහත්කාරයෙන් අන්‍යාගමිකකරණය කිරීම නැවැත්වීම හෝ අන්‍යාගමිකකරණය කිරීම සඳහා යොදා ගන්නා ආර්ථික වාසි නැවැත්වීමටයි. කෙසේ වෙතත් 2004 දී මෙවැනි පනතක් ඉදිරිපත් කිරිමට යාමේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එම පනත ව්‍යවස්ථා විරෝධී ලෙස සලකනු ලැබීය. මෙම පනත ප්‍රොතෙස්තන්තවාදීන් සහ කතෝලික කණ්ඩායම් විසින් හෙළා දකින ලදී.[50] 2021 වසරේ මුල් භාගයේ බුද්ධ සාසන අමාත්‍යංශය විසින් රටේ විවිධ ආගම්වලට සදාචාර විරෝධී ලෙස පුද්ගලයන් අන්‍යාගමිකකරණය පත් කිරීමට එරෙහිව නීතිමය රාමුවක් කෙටුම්පත් කිරීම ආරම්භ කිරීම සිදු කළේ මේ මොහොතේ සිටම නීතිමය රාමුවක් ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාව පෙන්වා දෙමිනි.[51] නමුත් එය ක්‍රියාත්මක කළ හැකි නීතිමය ප්‍රතිපාදනයක් නොවීය. කෙසේ වෙතත් නීති විශාරදයන් මෙහිදි තර්ක කරන්නේ එවැනි නීති කෙටුම් පත් කිරීමේ දී ස්වේච්ඡාවෙන් ආගම වෙනස්කර ගැනීම (පුද්ගලික තේරීම හරහා අන්‍යාගමිකකරණය කිරීම) සහ බල කිරීම හරහා අන්‍යාගමිකකරණය අතර වෙනස හඳුනාගැනීම අවශ්‍ය බවය.[52] මෙයට අමතරව 14 (1) (ඉ) වගන්තිය යටතේ "ආගමික ප්‍රකාශනය" සැබෑ එවැන්ජලිස්තවාදය (true evangelism) ලෙස අධිකරණය පිළිගන්නා අතර අනිසි ලෙස අන්‍යාගමකට හැරවීම අධිකරණය විසින් පිළිනොගනී.

---

[47] Tegal, E., 2020. *Understanding Rule of Law, Human Security and Prevention Of Terrorism in Sri Lanka*. [online] Available at: https://lstlanka.org/images/publications/reports/2021/Understanding_Rule_of_Law_Human_Security_and_Prevention_of_Terrorism_in_Sri_Lanka_English.pdf

[48] Manoharan, N., 2006. *Counterterrorism Legislation in Sri Lanka: Evaluating Efficacy*. [online] Available at: https://www.eastwestcenter.org/publications/counterterrorism-legislation-sri-lanka-evaluating-efficacy

[49] Perera, M., 2009. *Anti-conversion bill: minorities fear restrictions on religious freedom*. [online] Available at: https://www.asianews.it/news-en/Anti-conversion-bill:-minorities-fear-restrictions-on-religious-freedom-14360.html

[50] Ibid.

[51] Liyanapathirana, N., 2021. *New laws against unethical conversions*. [online] Available at: https://www.themorning.lk/new-laws-against-unethical-conversions/

[52] Ibid.

## එක් රටක් එක් නීතියක් සඳහා වූ කාර්ය සාධන බලකාය

2019 ජනාධිපතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයේදී එක් රටක් - එක් නීතියක් යන සංකල්පය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ විසින් හඳුන්වා දෙන ලදී. 2021 ඔක්තෝම්බර් මාසයේදී එක් රටක් - එක් නීතියක් කෙටුම්පත් කිරීම සඳහා විශේෂ ජනාධිපති කාර්ය සාධන බලකායක් පත් කරන ලදී. මෙම සංකල්පය මගින් හඟනාගත් එක් සංකල්පයක් නම් එය පෙර පෙන්වා දුන් පරිදි වාර්ගික ප්‍රජාවන් තුනට විශේෂිත හා ප්‍රමුඛව භාවිතා කරන ලද චාරිත්‍රානුකූල අයිතීන් අහෝසි කිරීමට ගත් උත්සාහයකි. එක් රටක් එක් නීතියක් හඳුන්වා දීමේ සැලැස්ම මගින් රට තුළ වාර්ගික සහ ආගමික ප්‍රජාවන්ගේ විවිධ සංස්කෘතික භාවිතයන්හි සූක්ෂමතාවයන් සඳහා ඇතුළත් කිරීමේ අවශ්‍යතාවය බැහැර කරයි. තවද සිංහල බහුතර අවශ්‍යතා ප්‍රචාරණය කිරීමේ සහ සහාය දැක්වීමේ ප්‍රකට ඉතිහාසයක් ඇති මුස්ලිම් විරෝධී ව්‍යාපාරයේ ඉදිරියෙන්ම සිටි බව කියන බෞද්ධ භික්ෂුවක් විසින් මෙහෙයවන ලද මෙම කාර්ය සාධන බලකායේ නායකත්වය පිළිබඳ බොහෝ දෙනාගේ අවධානය යොමු විය. කෙසේ වෙතත් මෙම පියවර 2012 සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියෙහි (ICCPR) 26 වැනි වගන්තියට ද පටහැනිය[53].

එහි සඳහන් වන්නේ වාර්ගික - ආගමික හෝ භාෂාමය සුලු ජාතීන් සිටින ප්‍රාදේශවල එවැනි සුළු ජාතීන්ට අයත් පුද්ගලයන්ට ඔවුන්ගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයන් සමග ප්‍රජාව තුළ ඔවුන්ගේ භුක්ති විදිමේ අයිතිය ප්‍රතික්ෂේප නොකළ යුතු බවයි. එසේම තමන්ගේ සංස්කෘතිය තමන්ගේ ආගම ප්‍රකාශ කිරීම සහ පිළිගැනීම හෝ තමන්ගේ භාෂාව භාවිතා කිරීමට අයිතිය හිමි වන බවයි. කෙසේ නමුත් දිවයිනේ සියලුම පළාත් ආවරණය වන පරිදි මහජනතාවගේ සහ විද්වතුන්ගේ අදහස් විමසීමට කාර්ය සාධන බලකායට ලබාදී ඇති කාලය ප්‍රමාණවත් නොවන බව පවසමින් 2022 මාර්තු මාසයේදී ජනාධිපතිවරයා විසින් කාර්ය සාධන බලකායේ නිල කාලය තවත් මාස තුනකින් දීර්ඝ කරන ලදී[54].

## ආදාහන ප්‍රතිපත්තිය

2020 අප්‍රේල් මාසයේදී කෝවිඩ් 19 ආරම්භයත් සමඟ රටවල් 190 කට අධික සංඛ්‍යාවක් නිශ්චිත මාර්ගෝපදේශය යටතේ පුද්ගලයන් භූමදානයට අවසරය දී තිබුණි. නමුත් කෝවිඩ් 19 හේතුවෙන් මියගිය අය අනිවාර්යෙන් ආදාහනය කිරීමට ප්‍රතිපත්තියක් ශ්‍රී ලංකා රජය විසින් පනවන ලද[55]. මෙම ආදාහනය සම්බන්ධ ප්‍රතිපත්තිය මුස්ලිම් ප්‍රජාවගේ මූලික ආගමික අයිතීන් අහිමි කිරීමක් ලෙස සැලකේ. ආගමික චාරිත්‍ර යටතේ භූමදානය කිරීම හුදෙක් කෝවිඩ් වෛරසය භූගත ජලයට එකතු වීම හා ඉදිරියේදී එය තවදුරටත් පැතිරීමට උපකාර වේ යැයි ප්‍රකාශ කරමින් මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ලදී. මෙම

---

[53] Palansuriya, N., 2021. *One Country, One Law – What Does It Mean for Justice and Democracy?*. [online] Available at: https://www.cepa.lk/blog/one-country-one-law-what-does-it-mean-for-justice-and-democracy/

[54] Economy Next. 2022. *Sri Lanka president extends tenure of controversial 'One Country, One Law' task force*. [online] Available at: https://economynext.com/sri-lanka-president-extends-tenure-of-controversial-one-country-one-law-task-force-91025/

[55] BBC News. 2021. *Covid-19: Sri Lanka reverses 'anti-Muslim' cremation order*. [online] Available at: https://www.bbc.com/news/world-asia-56205737

තත්ත්වයෙන්  මුස්ලිම් ප්‍රජාව අපහසුතාවයටත් කලකිරීමටත් පත් කළ අතරම රජය විසින් ගත් මෙම පියවර කෙරෙහි ඔවුන්ගේ අතෘප්තිය විරෝධතා මගින් ප්‍රසිද්ධියේ පළ කිරීම දැකිය හැකි විය. මෘත දේහ ආදාහනය කිරීම කෝවිඩ් 19 රෝගය පැතිරීම වළක්වන බවට කිසිදු සාක්ෂියක් නොමැති බව ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් 2020 ආරම්භයේ සිටම නැවත නැවතත් ප්‍රකාශ කර ඇත. මෙහිදී 2020 අප්‍රේල් 20 වන දින ලෝක සෞඛ්‍ය සංවිධානය ද ඔවුන්ගේ නිළ ට්විටර් (Twitter) පිටුවෙන් ප්‍රකාශ කර තිබුණේ "බෝවන රෝගයකින් මියගිය පුද්ගලයින් ආදාහනය කළ යුතුය යන්න සාමාන්‍ය මිථ්‍යාවකි, නමුත් එය සත්‍ය නොවේ. ආදාහනය සංස්කෘතික තේරීමක් සහ පවතින සම්පත් පිළිබඳ කාරණයකි" යන්නයි.[56] ඒසේම ශ්‍රී ලංකා ප්‍රජා වෛද්‍යවරුන්ගේ විද්‍යාලය (College of Community Physicians of Sri Lanka) සහ ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය ප්‍රකාශ නිකුත් කරමින් කියා සිටියේ ද කෝවිඩ් 19 මළ සිරුරු මිහිදන් කිරීම මහජන සෞඛ්‍යයට තර්ජනයක් වන බවට කිසිදු සාක්ෂියක් නොමැති බවයි.[57] කෙසේනමුත් භූමදානය මගින් කෝවිඩ් අවධානමක් ඇති නොවන බවට විද්‍යාත්මක සාක්ෂි සහිතව පෙන්වා දෙමින් කෝවිඩ් මළ සිරුරු අදාහන ප්‍රතිපත්තිය ආපසු හැරවීමට උත්සාහ කළ ද කෝවිඩ් හේතුවෙන් මියගිය මළ සිරුරු ආදාහනය කිරීම දිගින් දිගටම සිදු විය. නමුත් 2021 පෙබරවාරි මස මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙන් වසරක පමණ පසු ආපසු හැරවීමට එනම් අවලංගු කිරීමට රජය විසින් තීරණය කළේ ය.[58]

## බුර්කාව සහ මදසා තහනම

2021 මාර්තු මාසයේදී බෞද්ධ විහාරස්ථානක පැවැති උත්සවයකදී හිටපු මහජන ආරක්ෂක අමාත්‍ය සරත් විරසේකර මහතා ප්‍රකාශ කළේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් යැයි තර්ක කරමින් බුර්කාව යන ඇඳුම රට තුළ තහනමට ලක් කිරීමට ඔවුන් උත්සාහ ගන්නා බව ප්‍රකාශ කරන ලදී . මෙම ප්‍රකාශයට ආමන්ත්‍රණය කරමින් 2019 දී සිදු වු පාස්කු ප්‍රහාරය සමග රට තුළ තාවකාලිකව බුර්කා තහනමක් ක්‍රියාත්මක විය. මෙම බුර්කා තහනම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1) (ඉ) වගන්තියට මෙන්ම නිදහසේ ආගමික අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය පිළිබඳ ජාත්‍යන්තර නීතිවලට ද පටහැනි වේ.[59]

මීට අමතරව  ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය අනුගමනය නොකරන බව පවසමින් සහ ලියාපදිංචි වී නොමැති මදසා පාසල් දහසක් පමණ තහනමට ලක් කිරීමට අපේක්ෂා කරන බව හිටපු මහජන ආරක්ෂක අමාත්‍ය සරත් විරසේකර මහතා විසින් එම උත්සවයේදී ප්‍රකාශ කරන ලදී. මීට ප්‍රතිචාර දක්වමින් ජාතික සාම මණ්ඩලය කියා සිටියේ ලියාපදිංචි නොකළ මදසා පාසල් වසා දැමීම වෙනුවට අවශ්‍යය අධීක්ෂණයකට

---

[56] World Health Organization via Twitter. 2020. [online] Available at: https://twitter.com/who/status/1248611493320392709

[57] *Sri Lanka: Compulsory cremation of COVID-19 bodies cannot continue, say UN experts*. 2021. [online] Available at: https://www.ohchr.org/en/press-releases/2021/01/sri-lanka-compulsory-cremation-covid-19-bodies-cannot-continue-say-un?LangID=E&NewsID=26686

[58] France 24. 2021. *Sri Lanka ends forced cremations after Imran Khan's visit*. [online] Available at: https://www.france24.com/en/live-news/20210226-sri-lanka-ends-forced-cremations-after-imran-khan-s-visit

[59] The Guardian. 2021. *Sri Lanka to ban burqa and close 1,000 Islamic schools*. [online] Available at: https://www.theguardian.com/world/2021/mar/13/sri-lanka-to-ban-burka-and-close-1000-islamic-schools

ලක් කිරීමට පියවර ගත යුතු බවයි. එසේම අනෙකුත් ආගම්වලට අයත් දහම්පාසල් ද වෙනස් කොට සැලකීමකින් තොරව ලියාපදිංචි කිරීම සඳහා සමාන ප්‍රතිපාදන තිබිය යුතු බව ද සාම මණ්ඩලය තවදුරටත් අවධාරණය කරන ලදී.[60]

## වෛරී ප්‍රකාශනය පිළිබඳ නීතිමය රාමුව

ආගම ඉලක්ක කරගනිමින් වෛරී ප්‍රකාශ කරන්නට එරෙහිව නඩු පැවරිය හැකි නීති කිහිපයක් ශ්‍රී ලංකාවේ පවතී. මෙහිදී ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ 291 (අ) වගන්තියෙන් ආගමික හැඟීම්වලට හිතාමතා රිදවීමේ අදහසින් වචන ප්‍රකාශ කිරීම සහ 291 (ආ) යන වගන්තියෙන් ආගමික විශ්වාසයන්ට ගරහා ,යම් කණ්ඩායමක ආගමික හැඟීම් ප්‍රකෝප කිරීමේ අදහසින් හිතමතා සහ ද්වේෂ සහගතව කරන ක්‍රියා වෛරී ප්‍රකාශන සම්බන්ධ නීති ලෙස අර්ථ දක්වයි. එසේ ම XV වන පරිච්ඡේදයෙන් හිතාමතා සහ ද්වේෂසහගත ක්‍රියාවන් ආගමික ඇදිහීම් වෛරීව ඉදිරිපත් කිරීම, වෛරී සහගත ප්‍රකාශ ලෙස අර්ථ දක්වයි. මීට අමතරව තුන්වන වගන්තිය හරහා බලාත්මක කරන ලද සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති (ICCPR) පනතේ 20 වැනි වගන්තිය වෙනස්කොට සැලකීම/ සතුරුකම් කිරීම හෝ ප්‍රචණ්ඩත්වයට උසිගැන්වීමක් වන ජාතික /වාර්ගික හෝ ආගමික වශයෙන් වෛරය වෙනුවෙන් පෙනී සිටීම නීතියෙන් තහනම් කරනු ලැබේ. කෙසේ වෙතත් 2018 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ප්‍රකාශයට පත් කරන ලද වාර්තාවට පෙන්වා දෙන්නේ වෛරී ප්‍රකාශන සිදුකල වැරදිකරුවන්ට එරෙහිව නඩු පැවරීමට හෝ නීතිය ක්‍රියාත්මක කිරීමේ දී නීතිමය අඩු ලුහුඩුකම් පවතින බව යි.[61]

## පූජනීය ස්ථාන ලියාපදිංචි කිරීම පිලිබඳ 2008 චක්‍රලේඛය

2008 ඔක්තෝම්බර් මාසයේදී බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් අලුතින් පූජනීය ස්ථාන ඉදිකිරීම පිළිබඳ චක්‍රලේඛනයක් නිකුත් කරන ලදී. මෙම චක්‍ර ලේඛනයට අනුව අලුතින් ඉදිකරන ඕනෑම ආගමික ස්ථානයක් ලියාපදිංචි කළ යුතුය. නමුත් 2018 දී ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදුන් තීන්දුවක් අනුව 2008 වසරේ ආගමික පහසුකම් සහ අවශ්‍යතා ලියාපදිංචි කිරීම සහ ඉදිකිරීම පිලිබඳ චක්‍රලේඛය බෞද්ධ ආගමික ස්ථාන සඳහා පමණක් අදාළ වන බව තහවුරු කර ඇත. මේ අනුව ශ්‍රී ලංකාවේ නීතියට අනුව ආගමික ස්ථාන ලියාපදිංචි කිරීමට නීතිමය අවශ්‍යතාවයක් නොමැත. එහෙත් 2008 චක්‍රලේඛය උපුටා දක්වමින් පවතින හෝ නව ආගමික ස්ථාන ලියාපදිංචි කරන ලෙස විවිධ පළාත් පාලන ආයතන විසින් වෙනත් ආගමික කණ්ඩායම්වල ආගමික නායකයින්ගෙන් ඉල්ලා සිටින බවට වාර්තා කිහිපයක් මගින් අනාවරණය කරේ. කෙසේ වෙතත්, චක්‍රලේඛය නීතියක් ලෙස තහවුරු වූ අවස්ථා ද පසුගිය කාලයේ දක්නට ලැබුණි. උදාහරණයක් ලෙස, 2017 ජුනි 28 වන දින ශ්‍රී ලංකාවේ ශේෂ්ඨාධිකරණය මදසාවක් ඉදිකිරීම සම්බන්ධයෙන් තීන්දුවක් ලබා දුන්නේ ය. එහිදී 2008 චක්‍රලේඛයේ අවශ්‍යතාවලට

[60] The Island. 2021. *Banning burqas and madrasas would have impacted rights – NPC*. [online] Available at: https://island.lk/banning-burqas-and-madrasas-would-have-impacted-rights-npc/

[61] Centre for Policy Alternatives. 2018. *Confronting Accountability for Hate Speech in Sri Lanka: A Critique of the Legal Framework*. [online] Available at: https://www.cpalanka.org/wp-content/uploads/2018/09/Confronting-Accountability-for-Hate-Speech-in-Sri-Lanka-2018.pdf

පෙත්සම්කරුවන් අවනත වී නොමැති බවත් චක්‍රලේඛය නීතියක් ලෙස අර්ථ දැක්විය හැකි බවත් අධිකරණය මෙහිදි තීන්දු කළේය.[62]

## ආගමික නිදහස හා ඊට ඇති අභියෝග

මෙම පරිච්ඡේදය තුළ ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කරන්නේ ශ්‍රී ලංකාවේ ආගමික නිදහස පිළිබඳව වැඩිදුර අවබෝධයක් ලබා ගැනීමයි. ඒ තුළ විශේෂයෙන්ම හඳුනා ගනු ලැබුවේ ආගමික කණ්ඩායම් තුනක ආගමික නිදහස පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමයි. මෙහිදී ආගමික නිදහස පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා තෝරා ගන්නා ලද ආගමික කණ්ඩායම්වල ආගමික නිදහසට ඇති බාධාවන් අධ්‍යයනය කිරීමක් එම බාධාවන් එල්ල වන්නේ කුමන පසුබිමකද හා කුමන පාර්ශවයන්ගෙන් දයන්න පිළිබඳ වැඩිදුර අධ්‍යයනය කරනු ලබයි. ඊට අමතරව තෝරා ගන්නා ලද ආගමික කණ්ඩායමික කණ්ඩායම්වල කාන්තාවන් තමන් එම කණ්ඩායමේ කාන්තාවක් නිසා සිය ආගමික කණ්ඩායම තුළින් සහ බාහිර සමාජයෙන් සිය ආගම ඇදහීමේ අයිතියට එල්ල වල අභියෝගයන් පිළිබඳවද මෙහිදී සැකවින් අධ්‍යයනය කරයි.

ශ්‍රී ලංකාවේ ආගමික නිදහස සම්බන්ධයෙන් අදහසක් ගත හැකි අධ්‍යනයන් කිහිපයක්ම මෑතකාලීව විවිධ පර්යේෂණ ආයතන මගින් සිදු කර ඇත. ඒ අනුව 2018 දී ජාතික සාම මණ්ඩලය විසින් ආගමික නිදහස පිළිබඳ  සිදු කරන ලද අධ්‍යයනයේ දත්ත මගින් ප්‍රාදේශීය සහ ජාතික මට්ටමේ විවිධ ආගමික කණ්ඩායම් විසින් අත්විදින මෙරට ආගමික නිදහසේ තත්ත්වය පිළිබඳ වැදගත් කරුණු කිහිපයක් හඳුනා ගැනීමට හැකි ය.[63] මෙම අධ්‍යයනයෙන් හඳුනාගත හැකි එක් කරුණක් නම් ශ්‍රී ලංකාවේ බහුතරයක් (62.5%) රට තුළ ආගමික නිදහස පවතින බව විශ්වාස කරන බවයි (ඇමුණුමේ  ප්‍රස්තාර 1 බලන්න). අනෙක් අතට මෙම අධ්‍යනයේ දත්ත විශ්ලේෂණය කිරීමේදී පෙනී ගියේ ආගමික කණ්ඩායම් පහම එකම ආකාරයකට සිය ආගමික නිදහස පිළිබඳව විනිශ්චය නොකරන බවයි.

ආගම අනුව බැලුවිට මුස්ලිම්, ක්‍රිස්තියානි(රෝමානු කතෝලික නෙවන ක්‍රිස්තියානි සභාවන්) සහ හින්දු යන සුළුතර ආගමික කණ්ඩායම් තුනම ඔවුන්ගේ ආගමික නිදහස රට තුළ අභියෝගයට ලක්ව ඇති බව විශ්වාස කරන බව මෙම සමීක්ෂණය  මගින් ඉස්මතු වන වැදගත් කරුණකි. ශ්‍රී ලංකාව තුළ මුස්ලිම්වරුන්ගෙන් අඩකට වඩා වැඩි පිරිසක් තම ආගමික නිදහසට යම් ආකාරයකට බාධාවක් ඇති බව විශ්වාස කරන බව දත්ත මගින් පැහැදිලි වුවකි. එසේම ක්‍රිස්තියානි ප්‍රජාවගෙන් 41.9% සහ හින්දු ප්‍රජාවගෙන් 37.2% විශ්වාස කරන්නේ රට තුළ ආගමික නිදහස සම්බන්ධයෙන් කුමන හෝ බාධාවක්  පවතින බවයි (ඇමුණුමේ  ප්‍රස්තාර 2 බලන්න).

[62] Available at: https://www.minormatters.org/storage/app/uploads/public/5b5/5a4/4be/5b55a44be214a270694958.pdf

[63] මෙම දර්ශකය මෙම ක්ෂේත්‍රයට සම්බන්ධ ප්‍රවීණයන්ගේ සහභාගීත්වයෙන් සිදු කරන ලද සමීක්ෂයකි. මෙහිදී ආගමික කණ්ඩායම් පහේම ආගමික නායකයින් /රජයේ නිලධාරීන් /පොලිසිය සහ ආගමික කණ්ඩායම් පහකට අයත් ප්‍රාදේශීය ප්‍රජා නායකයින 823 දෙනෙකුන්ගෙන් ඔවුන්ට අදාළ ප්‍රදේශවල ආගමික නිදහසේ තත්ත්වය පිළිබද අදහස් විමසීම  මගින් මෙම සමීක්ෂණය මෙහෙයවන ලදී.

කෙසේ වෙතත් මුස්ලිම්, හින්දු සහ රෝමානු කතෝලික නොවන ක්‍රිස්තියානි ආගමික කණ්ඩායම් සිය ආගමික නිදහස උල්ලංඝනය වීමේ ස්වභාවය අත්විඳින ආකාරය පිළිබඳ සිත්ගන්නා සුළු කරුණක් මෙම අධ්‍යයනයෙන් අනාවරණය විය. එනම්, මෙම සුළු ආගමික කණ්ඩායම් තුන විසින් ඔවුන්ගේ ආගමික නිදහසට රට තුළ යම් බාධාවක් ඇති බව විශ්වාස කළ ද ප්‍රාදේශීය මට්ටමින් සිය ආගම ඇදහීමේ නිදහස පිළිබඳ විමසූ විට ඊට බාධාවක් ඇති බව මූලිකවම ප්‍රකාශ කර ඇත්තේ ක්‍රිස්තියානි ප්‍රජාව (28.4%) සහ හින්දු ප්‍රජාව (19.8%) විසින් ය (ඇමුණුමේ ප්‍රස්තාර 3 බලන්න).

යථෝක්ත සන්දර්භය සැලකිල්ලට ගනිමින් මෙම සුළුතර ආගමික කණ්ඩායම් ත්‍රිත්වය ආගමික නිදහස අත්විඳින ආකාරය මෙන්ම එම අත්දැකීම් එක් ආගමික කණ්ඩායමකින් අනෙක් ආගමික කණ්ඩායමට වෙනස් වන්නේ කෙසේද සහ කෙතරම් දුරට වෙනස් වන්නේ ද යන්න ඉස්මතු කිරීමට මෙම අධ්‍යනයේ ඉදිරි පරිච්ඡේද මගින් උත්සාහ කරනු ඇත.

## මුස්ලිම් ප්‍රජාව

ශ්‍රී ලංකාවේ මුස්ලිම් විරෝධී කෝලාහලවල ඉතිහාසය 1915 තරම් ඈත අතීතයකට දිවයයි. මෙම මුස්ලිම් විරෝධී කෝලාහලවල ප්‍රධාන කාරකයන් හඳුනාගැනීමේ දී ආර්ථිකය හා දේශපාලනය මූලික වන අතරම විශේෂිත ආගමික වතාවත් සහ සිරිත් විරිත් ඇදහිලිවල සිට පුද්ගලයන් අතර පවතින මතභේද/ ආරවුල් දක්වා ව්‍යාප්ත වෙයි. පශ්චාත් යුධ ශ්‍රී ලංකාවේ මුස්ලිම් ප්‍රජාවට එරෙහිව ප්‍රධාන කැරලි /ගැටුම් කිහිපයක් හඳුනා ගතහැකිය. මෙහිදී බේරුවල[64] , දිගන සිදුවූ ගැටුම් [65] සහ පාස්කු ඉරුදින ප්‍රහාරයෙන[66] පසු සිදුවූ

[64] 2014 ජූනි 15 වැනිදා අළුත්ගම දර්ගා නගරය ප්‍රදේශයෙදි සිංහල බෞද්ධ සහ මුස්ලිම් ජන කණ්ඩායම් අතර මෙම ගැටුම ඇති විය. මෙයට ප්‍රධාන හේතුව වුයේ 2014 ජූනි 12 වැනි පොසොන් පොහෝ දින අයගම සමිත හිමි ගමන් කළ රථයට බාධා කිරිමක් සම්බන්ධයෙන් මුස්ලිම් තරුණයෙක් සමග ඇති වූ සිද්ධියකි. මෙම සිද්ධිය පිළිබදව සාදාරණ පරික්ෂණයක් සිදු නොකළ බවට චෝදනා කරමින් සිංහල බෞද්ධ සංවිධාන සහ ප්‍රදේශවාසින් අළුත්ගම පොලිසිය ඉදිරිපිට විරෝධය දැක්වූ අතර මුස්ලිම් ව්‍යාපාරික ස්ථාන කිහිපයකට පහර දීම සිදු විය. ජූනි 15 වැනිදා බොදු බල සේනා ඇතුළු බෞද්ධ සංවිධාන 'අවදිවච් බොදු මහ සමුළුව' නමින් අළුත්ගම නගරයේ පැවති සමුළුවෙන් පසුව පෙරහැරකින් මුස්ලිම් ජනතාව බහුතරයක් වෙසෙන දර්ගානගරය හරහා ගමන් කිරිමේදි දෙපාර්ශවය අතර ගැටුමක් ඇති විය. මෙය අළුත්ගම සහ බේරුවල ප්‍රදේශ කිහිපයක පැතිර ගිය අතර දැඩි දේපළ හානි සහ ජිවිත හානි කිහිපයක් වාර්තා විය.
BBC News සිංහල. 2014. *අලුත්ගම සිට බේරුවලටත් ඇඳිරි නීතිය*. [online] Available at:
https://www.bbc.com/sinhala/sri_lanka/2014/06/140615_aluthgama_clashes_video
BBC News සිංහල. 2014. *අළුත්ගම සන්සුන්*. [online] Available at:
https://www.bbc.com/sinhala/sri_lanka/2014/06/140613_aluthgama_muslim_shops_attacked

[65] 2018 පෙබරවාරි 22 නුවර තෙල්දෙණිය ප්‍රදේශයෙදි මුස්ලිම් තරුණයන් පිරිසක් පහර දීම හේතුවෙන් රෝහල්ගතව සිටි සිංහල බෞද්ධ පුද්ගලයෙකු 2018 මාර්තු 04 මියයෑමත් සමග කටුගස්තොට , අඹතැන්න,පූජාපිටිය ,අලදෙණිය ආදි ප්‍රදේශවල මුස්ලිම් විරෝධි ප්‍රචණ්ඩකාරි සිදු විම් වාර්ථා විය. එහිදි මුස්ලිම් පල්ලි 17 , ව්‍යාපාරික ස්ථාන 91 සහ නිවාස 62 සම්පුර්ණයෙන්ම විනාශ වු බව ශ්‍රී ලංකා මුස්ලිම් කවුසිලය නිවේදනය කරන ලදි. බෞද්ධ භික්ෂුන් සහ මහසෝන් බලකාය වැනි මුස්ලිම් විරෝධි සිංහල බෞද්ධ සංවිධාන සැළසුම් සහගත ලෙස මැදිහත් විම සිදු වු අතර ඒවායේ නායකයන් අත්අඩංගුවට ගැනිම සිදුවිය. මෙම තත්වය පාලනය කිරිමට දිගන මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයට ඇදිරි නිතිය පැනවිම සහ සමාජ මාධ්‍ය තහනමක් පනවනු ලැබිය.
BBC News සිංහල. 2018. '*මහසෝන් බලකායේ' ප්‍රධානියා අත්අඩංගුවට*. [online] Available at:
https://www.bbc.com/sinhala/sri-lanka-43333317
BBC News සිංහල. 2018. "*මේක ජාතිවාදය නෙමේ, මෙතන ආවේ මංකොල්ල කන්න*". [online] Available at:
https://www.bbc.com/sinhala/world-43351793

[66] 2019 වසරේ අප්‍රේල් මස 21 වන පාස්කු ඉරුදින කටුවාපිටිය ශාන්ත අන්තොනි දේවස්ථානය මඩකලපුව සියෝන් දේවස්ථානය සහ කොච්චිකඩේ ශාන්ත සෙබස්තියන් යන දේවස්ථාන සහ කොළඹ පිහිටි ෂැන්ග්‍රි-ලා හෝටලය, කොළඹ

කැරලිකාර තත්ත්වයන් ප්‍රධාන වේ.මෙවැනි කැරලි අවස්ථා හැරෙන්නට මුස්ලිම් සමාජය ඉලක්ක කර ගත් වෛරය හා සැකය වැපිරීමේ ගැටුම්කාරී අවස්ථා පශ්චාත් යුද්ධ ශ්‍රී ලංකාව තුළ කැපි පෙනෙන කරුණක් ලෙස හඳුනාගත හැකිය. මෙම ගැටුම්කාරී අවස්ථා මෙන් ම විටින් විට ඇති වූ මුස්ලිම්වරුන් ඉලක්ක කරගත් කැරලි සහ විවිධ සිද්ධීන් මුස්ලිම් සමාජයේ ආගමික නිදහසට අභියෝගයක් එල්ල කරන්නට සමත් විය.

ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ ආගමික නිදහසට ඇති අභියෝගයන්හි මූලික ලක්ෂණයක් වන්නේ ඒවා බොහෝවිට දෛනිකව ජීවිතයේ දී අනෙකුත් ආගමික කණ්ඩායම් සමග ගණුදෙනු කිරීමේ දී නිර්මාණය වූ දෙයකට වඩා මෙය ජාතික මට්ටමේ නිර්මිතියක් ලෙස  පැවතීමය. නිදසුනක් ලෙස හලාල් ප්‍රමිතිකරණය සම්බන්ධයෙන් එල්ලවූ විරෝධතා, බුර්කා තහනම, මුස්ලිම් ප්‍රජාව මහාජාතිය වීමට උත්සහා ගන්නා බවට එල්ල වන චෝදනා හා අනෙකුත් ජනවර්ග සිය ආගමට හරවා ගැනීමට හෝ සිංහල ජාතිය වඳභාවයට පත්කිරීමට උත්සහා ගන්නා බවට ඇති චෝදනා මෙන් ම මුස්ලිම් ප්‍රජාව හා ත්‍රස්තවාදය අතර ඇති සම්බන්ධතා හුවා දක්වන චෝදනා ආදීය මූලික වශයෙන් ජාතික මට්ටමේ දී ඇති වූ කථිකාවෝ වෙති. ජාතික මට්ටමේදි සිදුවන මෙම නිර්මිතයන් බොහෝ විට දේශපාලන හා ආර්ථික කරුණු අරභයා සිදුවන බව  අප විසින් කරන ලද සම්මුඛ සාකච්ඡා මගින් අනාවරණය විය .ඒ අනුව දේශපාලන අවශ්‍යතා සහ ආර්ථිකය අවශ්‍යතා යන සාධක මුස්ලිම් ප්‍රජාවගේ ආගමික නිදහසට බලපාන ආකාරය පිළිබඳ වෙනවෙන ම සාකච්ඡා කිරීම මෙහිදී වැදගත් වෙයි.

**දේශපාලන අවශ්‍යතා**

ජාතික මට්ටමේ මුස්ලිම් විරෝධී මතවාදයන් චිරස්ථායී කිරීම සඳහා පක්ෂ දේශපාලනය සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරන බව ප්‍රාදේශීය මට්ටමේ ආගමික සංහිඳියාව සම්බන්ධයෙන් කටයුතු කරන සිවිල් සමාජ සංවිධාන සමග කරන ලද සාකච්ඡා වලින් පැහැදිලි වේ.  පශ්චාත් යුධසමයේ දී විවිධ බෞද්ධ අන්තවාදී කණ්ඩායම්වල ක්‍රියාකාරකම් විසින් පාස්කු ඉරිදා ප්‍රහාරය වැනි සිදුවීම් මුස්ලිම්වරුන් කෙරෙහි මහජන විරෝධයක් ගොනු කිරීමට යොදාගත හැකි පරිසරයක් නිර්මාණය කර තිබූ අතර එකී වාර්ගික දේශපාලනය පසුබිම මැතිවරණ වාසි ලබා ගැනීමට ඔවුන් භාවිතා කළ බව ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රතිචාරකයෙක් නිරික්ෂණය කොට තිබුණි. මෙහිදී අප හා සම්බන්ධ වූ ප්‍රතිචාරකයෙක් කියා සිටියේ බෞද්ධ අන්තවාදී සංවිධාන බොහෝ විට නඩත්තු වුයේ යම් යම් දේශපාලන හස්තයන් යටතේ බවයි. එපමණක් නොව  පසුගිය කාලය තුළ බොහෝවිට සිංහල සහ මුස්ලිම්වරුන් අතර ඇති වන සුළු සිද්ධීන් පවා සමාජ මාධ්‍ය සහ ජන මාධ්‍ය හරහා ප්‍රචාරය කළ අතරම ඉන් මහා ජාතිය වන සිංහල බෞද්ධයන් තුළ අවිශ්වාසය සහ ජාතික වශයෙන් සුරක්ෂිතභාවය පිළිබඳ සැක සංකා ඇති කිරීමට සමත් විය .අන්තර්

---

සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයල ද කින්ග්ස්බරි හෝටලය ඉලක්ක කර ගනිමින් මෙම ත්‍රස්ත ප්‍රහාරය එල්ල විය . මෙහිදි පුද්ගලයන් 270 කට වැඩි පිරිසක් ජීවිතක්ෂයට පත් වූ අතර 300 කට වැඩි පිරිසක් තුවාල ලැබිය .මෙම ප්‍රහාරය ඉස්ලාම් අන්තවාදි සංවිධානයක් විසින් එල්ල කළ බව ආරක්ෂක අංශ නිවේදනය කළ අතර ප්‍රහාරය වළක්වා නොගැනිම සහ යුක්තිය ඉටු නොවිම පිළිබදව රජයට සහ ආරකෂක අංශ වලට චෝදනා එල්ල විය .

BBC News සිංහල. 2021. *අප්‍රේල් 21 අනතුරු ඇඟවීම් ගැන දැන සිටියේ කවුද?*. [online] Available at: https://www.bbc.com/sinhala/sri-lanka-56777369

ආගමික වශයෙන් ක්‍රියාකාරී සාමාජිකයෙකු කියා සිටියේ පසුගිය කාල වකවානුව තුළ හටගත් සැක සංකා අලු යට පවතින ගිනි පුපුරු මෙන් පවතින බවත් ඒවා මොනයම් මොහොතක හෝ ඇවිලිය හැකි බවත්ය.[67]

මුස්ලිම් විරෝධී කෝලාහල සහ ජාතික මට්ටමේ දේශපාලනය අතර තවත් සම්බන්ධතාවක් ඇත. එනම්, අන්තර් ආගමික ආතතීන් සහ අන්තර් ආගමික ගැටුම් ශ්‍රී ලංකාවේ මැතිවරණ රටාව හා සම්බන්ධ බව සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගේ අදහසයි. මෙපරිද්දෙන් පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාර වැනි සිද්ධීන් බොහෝ විට මැතිවරණයට පෙර ප්‍රයෝජනයට ගත් බව ඔවුහු නිරීක්ෂණය කරති. 2019 සිදු වූ පාස්කු ප්‍රහාරයෙන් පසු දේව පිළිම සහ සුරුවම්වලට පහර දීම හා අලාභ හානි සිදු කිරීම තුළින් කතෝලික ප්‍රජාවට තර්ජනයක් පවතින බව මතක් කරවීම මගින් මැතිවරණ දේශපාලනයේ වාසි ගැනීමේ උත්සාහය ඔවුන් මෙයට ඉදිරිපත් කළ එක උදාහරණයකි. කෙසේ වෙතත් මෙම කථිකාවන් පිළිබඳ නැඹුරුතාවයන් මැතිවරණයෙන් පසු දියාරු වී ගිය බවද ඔවුන්ගේ නිරීක්ෂණයට ලක්ව තිබුණි. 2020 මහ මැතිවරණයෙන් පසු ප්‍රාදේශීය මට්ටමේ බොහෝ වාර්ගික ආතතීන් පහව ගියේ ප්‍රාදේශීය මට්ටමින් මිනිසුන් බලමුළු ගන්වමින් සිටි දේශපාලන තැරුව්කරුවන් මැතිවරණයෙන් පසු තරමක් උදාසීන බවට පත්වීම බව ද ඔවුන් තවදුරටත් නිරීක්ෂණය කර තිබුණි. මෙමගින් පෙනී යන්නේ පක්ෂ දේශපාලන අවශ්‍යතා සහ මුස්ලිම් විරෝධය අතර අන්‍යෝන්‍ය සම්බන්ධයක් පවතින බවත් එම මුස්ලිම් විරෝධය එම ජන කණ්ඩාමේ ආගමික නිදහසට අභියෝග එල් කරන බවත් ය.

**ව්‍යාපාරික අවශ්‍යතා**

මුස්ලිම් ප්‍රජාව කෙරෙහි සිංහල බෞද්ධයන් විසින් දක්වන ප්‍රතිවිරෝධතා පිටුපස ව්‍යාපාරික අවශ්‍යතාද පවතින බව මෙම අධ්‍යනයේදී පෙනී යයි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රතිචාරකයකු සමග සිදු කළ සම්මුඛ සාකච්ඡාවලදී අවධාරණය වූ පරිදි මුස්ලිම් ප්‍රජාව ඉලක්ක කරගත් ආතතීන් වැඩි ප්‍රමාණයක් සිදු වන්නේ නාගරික ප්‍රදේශවල බවත් සිංහල බෞද්ධ ව්‍යාපාරිකයින් සහ මුස්ලිම් ව්‍යාපාරිකයින් අතර පවතින තරඟය මීට හේතු වන බවත්ය. විශේෂයෙන් සිංහල හින්දු අලුත් අවුරුදු සමය වැනි වකවානුවල සිංහල ප්‍රජාව මුස්ලිම් වෙළඳසැල්වලට යාම අධෛර්යමත් කිරීම ඉලක්ක කොටගෙන විවිධ සැක සංකාවන් ප්‍රචලිත කිරීම දැකගත් හැකි බව ප්‍රතිචාරකයන් විසින් පෙන්වා දෙන ලදී. මෙමගින් මුස්ලිම් ප්‍රජාවට සිය ආගමික අනන්‍යතාවය සිය ව්‍යාපාර කටයුතුවලට අභියෝගයක් වන තත්ත්වයකට පත්වීම සිදුවේ. එම නිසා ව්‍යාපාරික අවශ්‍යතා සහ ව්‍යාපාරික තරඟය මුස්ලිම් ප්‍රජාවගේ ආගමික නිදහසට හානිදායක ලෙස බලපාන බව දැක්විය හැකිය. අනෙක් අතට ග්‍රාමීය ප්‍රදේශවල ගැටුම් අඩුවෙන් දකින්නට ලැබෙන්නේ කෘෂිකාර්මික කටයුතුවලදී සිංහල බෞද්ධයින් සහ වෙළඳමේ යෙදෙන මුස්ලිම්වරුන් යන කණ්ඩායම් දෙක එකිනෙකට වෙනස් භූමිකාවන් දරන නිසාය. එනම්, ආර්ථික සාධකය මූලික කරගෙන ඔවුනොවුන් එකිනෙකා මත යැපීම සිදුකරයි. නිදර්ශනයක් ලෙස අකුරණ ප්‍රදේශයේ සිදුකළ සම්මුඛ සාකච්ඡාවකදී සිංහල ව්‍යාපාරික ප්‍රජාව නියෝජය කළ ප්‍රතිචාරකයකු කියා සිටියේ ගම්මිරිස් වැනි කුලු බඩු වගා කරන සිංහල

[67] Moinudeen, S. (2021). Ethno-centric pandemic governance: The Muslim community in Sri Lanka's COVID response. In P. Peiris (Ed.), *Is the cure worse than the disease? Reflections on COVID governance in Sri Lanka* (pp. 111-128). Social Indicator, Centre for Policy Alternatives.

වැව්ලිකරුවන්ගේ අස්වැන්න මිලදී ගැනීමට මුස්ලිම් වෙළඳුන් ගමට පැමිණෙන බවත් ඒ මගින් ඔවුන්ගේ නිෂ්පාදන විකුණා ගැනීමට අවශ්‍යය වෙළඳපොල අවස්ථා පහසුවෙන් අත්පත්කර ගැනීමට හැකි බවත් ය.

ජාතික මට්ටම තුළ දේශපාලනය සහ ව්‍යාපාරික අරමුණු හේතු කොටගෙන බොහෝවිට නිර්මාණය වන මුස්ලිම් ප්‍රජාව ඉලක්ක කරගත් චෝදනා ප්‍රදේශිය මට්ටම තුළ මුස්ලිම් අනෙකා පිලිබදව අදහසක් ඇති කරගැනිමට සිංහල බෞද්ධයන් ඇතුලු අනෙකුත් ආගමික කණ්ඩායම් භාවිතා කරන බව පෙනේ. උදහරණයක් ලෙස නුවර දිස්ත්‍රික්කයේ ජීවත්වන සිංහල ප්‍රජාව 2018 දී පවත්වන ලද EPI පර්යේෂණයට[68] සහභාගී වෙමින් ප්‍රකාශ කළේ ප්‍රදේශයේ මුස්ලිම් ප්‍රජාව සමඟ සංහිදියාවෙන් සිටීමට නම් මුස්ලිම් ප්‍රජාව සිය ජනගහනය වර්ධනය කරගැනිම සදහා සිංහල ප්‍රජාව වද බවට පත්කිරිම නොකිරිම/ සිංහල ප්‍රජාවට එරෙහි සිදු කරන ත්‍රස්ත ක්‍රියාවන් නැවැත්විම වැනි දෑ සිදුකළ යුතු බවයි. මෙම අවශ්‍යතා ප්‍රාදේශීය මට්ටමේ මුස්ලිම් ප්‍රජාව විසින් සපුරාලිය යුතු බව සිංහල ප්‍රජාව ප්‍රකාශ කළ ද ඒවා බොහොමයක් ඒ වන විටත් ජාතික මට්ටමේ විවිධ කණ්ඩායම් විසින් සාකච්ඡා කර තිබුණු ඒවා වු අතර පර්යේෂණයට සහභාගී වුවන් ඒ පිළිබඳව දැනගෙන තිබුණේ සමාජ මාධ්‍ය ඔස්සේය.

මෙම පසුබිම තුල මුස්ලිම් ප්‍රජාවගේ ආගමික නිදහස පහත දක්වා ඇති ආකාරයන් වලින් බාධාවන්ට ලක් වීම දැකිය හැකිය.

- ***ආගමික අනන්‍යයතාවය හේතු කොට සිදුවන වෛරී ප්‍රකාශයන්ට ලක්වීම***

  දෛනික ජීවිතයේදී මුස්ලිම් ජාතිකයින් සිය අනන්‍යයනතාවය මුලික කොටගෙන වෛරී ප්‍රකාශනයට භාජනය වෙයි. මෙම තත්ත්වය පාස්කු ප්‍රහාරයට පසු අවදියේ දී බහුලවශයෙන් දැකගත හැකි විය. අප විසින් සිදුකරන ලද සම්මුඛ සාකච්ඡාවේදී ප්‍රකාශ වු එක් නිදර්ශනයක් වුයේ මුස්ලිම් ජාතිකයින් සිය රුවුල පවත්වාගන්නා ආකාරය අනුව වෛරී ප්‍රකාශනයට ලක් වු බවයි. මෙහිදී සිවිල් පුද්ගලයන්ගෙන් පමණක් නොව රාජ්‍ය නිලධාරීන්ගෙන් ද මුස්ලිම් ජාතිකයන් වෛරී ප්‍රකාශනයට ලක් වු බව වාර්තා විය.

  කලුතර ප්‍රදේශයේ සිදුකරන ලද සම්මුඛ සාකච්ඡාවකදී මුස්ලිම්වරුන් පලදින තොප්පිය හේතුකොටගෙන වෛරී ප්‍රකාශනයට ලක්වන සිද්ධියක් ප්‍රකාශ විය. එම සිද්ධිය නම් මුස්ලිම් පුද්ගලයකු පොදු ප්‍රවාහන බස් රථයක ගමන් කිරීමේදී ඔහු අසල සිටි සිංහල ජාතිකයකු විසින් මුස්ලිම් ජාතිකයා පැලද සිටි තොප්පිය කලු ගඟට විසි කර තිබීමයි. මෙම සිද්ධිය ද ඇති වී

[68] 2018 වසරේ සමාජ විද්‍යාඥයින්ගේ සංගමය විසින් සිදු කරන ලද අධ්‍යයනයකි. මෙමගින් ශ්‍රී ලංකාවේ සංහිදියාවේ වෙනස්කම් අවබෝධ කර ගැනීමට සහ නිරීක්ෂණය කිරීමට "එදිනෙදා ජීවිතයට" අදාළව පුද්ගලයන් සංහිදියාව හඳුනාගන්නා ආකාරය පිළිබඳ දර්ශක හඳුනාගැනීම මෙම අධ්‍යනයෙන් සිදුකරන ලදී. මෙම අධ්‍යයනය සඳහා අම්පාර, මඩකලපුව, මුලතිව්, කිලිනොච්චි, අනුරාධපුර සහ මහනුවර යන දිස්ත්‍රික්කවල ග්‍රාම නිලධාරී වසම් 30 ක මුස්ලිම්, සිංහල සහ දෙමළ ප්‍රජාවන් සමඟ කණ්ඩායම් සාකච්ඡා පැවැත්වීමෙන් අදාළ දර්ශක සැදීම සිදුකර ඇත. මෙම අධ්‍යයනයේ වාර්තාව අන්තර්ජාලය හරහා ලබා ගත නොහැකි නමුත් සමාජ විද්‍යාඥයින්ගේ සංගමයේ ලිඛිත අවසරයකින් ලබා ගත හැක.

තිබුණේ පාස්කු ප්‍රහාරයෙන් පසුව වන අතර ඒ අවස්ථාවේදී කිසිදු පුද්ගලයකු මේ සම්බන්ධයෙන් කිසිදු හඬක් නොනැගූ බව සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූ පුද්ගලයා ප්‍රකාශ කළ සිටියේය.

එමෙන්ම උතුරු හා නැගෙනහිර පළාතේ ජීවත්වන මුස්ලිම්වරුන් ගව මස් අනුභව කිරීමේ පුරුද්ද හේතුකොට ගෙන හින්දු භක්තිකයන්ගේ වෛරී ප්‍රකාශනයන්ට ලක්වන බව සම්මුඛ සාකච්ඡාවලින් වාර්තා විය. උදාහරණයක් ලෙස මුස්ලිම්වරුන්ට නිවසක් කුලියට දීම සම්බන්ධයෙන් හින්දු භක්තිකයන් බොහෝදුරට මැලිකමක් දක්වන බවත් ඊට හේතුව ලෙස තම නිවස තුළට ගව මස් ගෙන ඒමට ඇති අවස්ථා ගෙනහැර දක්වන බවත් වාර්තා විය. ඊට අමතරව හින්දු භක්තිකයන් මුස්ලිම්වරුන්ට නිවාස කුලියට දීම සම්බන්ධයෙන් මැලිකමක් දැක්වීමට බලපාන තවත් හේතුවක් ලෙස වාර්තා වුයේ මුස්ලිම්වරුන්ගේ අවමංගල්‍ය චාරිත්‍රයක් වන මෘතදේහය නිවස තුළ සේදීමේ චාරිත්‍රය හුවා දක්වමිනි. මීට අමතරව උතුරු පළාතේ හින්දු භක්තියන් සම්බන්ධ ප්‍රතිචාරකයෙක් සඳහන් කළේ මුස්ලිම් කඩවලින් ආහාර ගැනීම ප්‍රතික්ෂේප කරමින් හින්දු භක්තිකයන් විසින් වෛරී ප්‍රකාශ සිදුකරන බවයි. මීට හේතුව ලෙස ඔවුන් ඉදිරිපත් කරන්නේ මුස්ලිම් කඩවල ගවමස් පිළියෙල කිරීමයි.

- ***රැකියා කරන අවස්ථාවේදී ආගම ඇදහීමට සිදු වන බාධාවන්***

මුස්ලිම් ජාතිකයන්ට තම ආගමික නිදහස බාධා වන තවත් ආකාරයක් ලෙස රැකියා කරන අවස්ථාවේදී ආගම ඇදහීමට සිදු වන බාධාවන් හඳුනාගත හැකිය. අප හා සම්මුඛ සාකච්ඡාවේ නිරත වූ මුස්ලිම්වරයකු කියා සිටියේ  සමහර අවස්ථාවල දී සිකුරාදා පල්ලි යාමට සහ තම ආගම සිහි කිරීමට අවස්ථාවක් ඇතැම් සේවා ස්ථාන මගින් නොලැබෙන අතර  සමහර සේවා ස්ථාන මගින් සිකුරාදා නැමැදුම් සඳහා අවසරය ලබා දුන්න ද ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් එම සේවා ස්ථාන මගින් බොහෝවිට නොලැබෙන බවයි. අනෙක් අතට සමහර රාජ්‍ය ආයතන මගින් උදෑසන ආගම සිදු කිරීමේ දී ද  තම ආගම සිහි කිරීමට බොහෝවිට අවස්ථාවක් නොලැබෙන අවස්ථාවන් අත්දැක ඇති බව සම්මුඛ සාකච්ඡා මගින්  තවදුරටත් අනාවරණය විය.

- ***ආගමික අනන්‍යයතාවය හේතු කොට ගෙන සිදුවන ව්‍යාපාර වර්ජනයට ලක් වීම***

ආගමික අනන්‍යතාවය හේතුවෙන් මුස්ලිම් ව්‍යාපාර වර්ජනය කිරීම පසුගිය කාලය පුරාම දැකිය හැකි සුවිශේෂී තත්ත්වයක් විය. මෙම තත්ත්වය පාස්කු ප්‍රහාරයෙන් පෙර සහ පසු අවධින් දෙකේදීම හොඳින් දැකිය හැකි කරුණකි. මෙහිදී සිංහල කඩ සාප්පු නම් ලැයිතුවක් වෙනම මුද්‍රණය කර බෙදා හැරීම සිංහල බව සංකේතවත් කරන බුදු පිළිම සහ පිරිත් තම කඩ සාප්පුවේ ප්‍රචාරය කිරීම/ ප්‍රදර්ශනය කිරීම සහ මුස්ලිම් කඩවලට යන පාරිභෝගිකයන්ට සහ එම ව්‍යාපාරික ස්ථානයට "බිත්තර" වැනි දේ මගින් පහර දීම වැනි සිද්ධින් මෙම අවධියේ දී වාර්තා විය. විශේෂයෙන්ම පාස්කු ප්‍රහාරයෙන් පසු මුස්ලිම් ව්‍යාපාර වර්ජනය කිරීම සඳහා කතෝලිකයන් ද උනන්දු කරවීම සාකච්ඡාවල දී වාර්තා විය. මෙහිදී විශේෂයෙන් නත්තල සහ පල්ලි මංගල්‍යයන් ඉලක්ක කරගෙන

කිතුණු ප්‍රජාවගේ අවධානය ලබා ගැනීමට අදාළ සිංහල කඩ ලැයිස්තුව සහිත අත් පත්‍රිකා සහ " කිතුණු ඔබේත් සිංහල අපේත් නත්තල් ලෙස මුද්‍රිත පත්‍රිකා" සහ නත්තල් සැරසිරි කිරීම් එකල පැවැති බව කුරුණෑගල ප්‍රදේශයේ ප්‍රතිචාරකයකු අනාවරණය කළේය. කෙසේ වෙතත්, වර්තමානයේ පවතින ආර්ථික අර්බුදය සහ දේශපාලන අර්බුදය හමුවේ තවදුරටත් හලාල් ප්‍රමිතිකරණය/වඳ කොත්තු සහ වද බෙහෙත්/වඳ යට ඇඳුම් පිළිබඳ ඇති කර තිබූ භීතිකාව යම් තරමින් දියාරු වී ඇති බව සාකච්ඡාවන් වලදී වාර්තා විය. නමුත් ඉදිරියේදී වාර්ගික සංහිඳියාවට බාධා වන ආකාරයේ සිදු වීමක් ඇති වුවහොත් නැවතත් මෙම කථිකා සමාජය තුළ ප්‍රතිනිෂ්පාදනය විය හැකි බව මුස්ලිම් ප්‍රතිචාරකයකු අවධාරණය කළේය.

- ***තර්ජනය කිරීම් වලට ලක්කිරීම සහ කොන් කිරීම***

පාස්කු ප්‍රහාරයෙන් අනතුරුව මුස්ලිම්වරුන් වෙත තිබූ සැකය තවදුරටත් සිංහල- බෞද්ධ ජාතිකයන් අතර වර්ධනය විය. මෙම තත්ත්වය පාස්කු ප්‍රහාරයෙන් අනතුරුව එය වාර්ගික අන්තර් පුද්ගල සම්බන්ධතා වලට ද බලපෑම් එල්ල වී තිබිය දැකිය හැකි ය. ඔවුනොවුන් එකිනෙකා අතර තර්ජනය කර ගැනීම සහ වෙනස්කොට සැලකීම මෙම අවධියේ ද සිදු වූ බව මුස්ලිම් සහ සිංහල ජාතිකයින් සමග කළ සම්මුඛ සාකච්ඡාවේදී අනාවරණය විය. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රතිචාරකයකු විසින්, මුස්ලිම් සහ සිංහල - බෞද්ධයන් අතර පවතින සබඳතා බිඳ වැටී ඇති ආකාර විස්තර කළේ මෙසේය,

> "කුරුණෑගල සිද්දවුණු කෝලාහලේදී මුස්ලිම් තරුණයෙක්ගේ ගෙදරකට ගල් පාරක් ගැහුවේ එකම වයසේ ඔහුගේම සිංහල ජාතික යාලුවෙක්. ඒ සිංහල තරුණයා ඒවේලාවේ එහෙම හැසිරුණේ අනිත් සිංහල අය අතර තමන් කොන් වේවි යයි බයෙන්. ඒ වගේම සිංහල තරුණයක් මුස්ලිම් තරුණයක්ව ෆේස්බුක් එකේ ටැග් කරමින් එක එක ජාතිවාදී කතා ෂෙයාර් කරා ඒ විතරක් නෙවෙයි මුස්ලිම් ජාතිවාදය සමහර වට්ස්ඇප් ගෲප් වලත් තිබ්බා සමහර මුස්ලිම් මිතුරන් ඒ කාලේ මේ ගෲප් වලින් අයින් වුණා. ඒ වගේම මුස්ලිම් යාලුවෝ බොහොමයක් ඉස්සර වගේ අපිත් එක්ක එකතු වෙලා කරන පොදු වැඩකට සහභාගී වීමේ පවා අඩුවක් දකින්න ලැබුණා..."

මෙම පසුබිම තුළ ඇතැම් මුස්ලිම් ජාතිකයන් තමන්ගේ දෛනික නැමැදුම් සිදු කිරීම කරේ රහසින් බව ක්ෂෙත්‍ර සාකච්ඡා මගින් අනවරණය විය.

> "හැමතිස්සේම පල්ලි යන ඒ කියන්නේ ආගමික වතාවත් නිරන්තරයෙන් සිදු කරන මුස්ලිම් අය දිහා සිංහල අය බැලුවේ සැකයෙන්. සිංහල අය කිව්වේ ඔය යන්නේ සිකුරාදා පල්ලියේ දී මේ අන්තවාදී ක්‍රියා සංවිධානය කරලා සැලසුම් කරන්න කියලා. මේවා කරන්න තමයි මෙයාලා නිතරම පල්ලියටම රිංගන්නේ.... ඒ වගේම සමහර මුස්ලිම් අය තමන්ගේ කඩේ ඉඳලා සිකුරාදට නැමැදුම්වලට යන්නේ, මම පොඩ්ඩක් කරන්ට් බිල ගෙවලා

එන්නම් කියලා. මොකද එයාලා බයයි පල්ලියේ නැමැදුමට යනවා කියලා තමන්ගේ සිංහල පාරිභෝගිකයෝ ටික දැනගත්තොත් බිස්නස් නැති වෙයි කියලා"

මෙබඳු සන්දර්භයක මුස්ලිම් සමාජය දෛනිකව ඔවුන්ගේ වැඳුම් නමස්කාර කිරීම අවශ්‍යය නිදහස කප්පාදු වීමක් සිදුව ඇති බව පැහැදිලි වේ. තවද, මුස්ලිම් ප්‍රජාවට සිය ආගමික වතාවත් ඉටුකිරීමට ඇති බාධාවක් ලෙස පල්ලි අසල අලුතින් ඉදිකළ බුදු කුටි සහ පිරිත් විකාශනය ඔවුන් හඳුනාගන්නා ලදී. තරුණයෙක් මුස්ලිම් ප්‍රතිචාරකයකු හා සිදුකළ සම්මුඛ සාකච්ඡාවේ දී ඔහු කියා සිටියේ,

> "ටවුන් එක ලග තියෙනවා පටුමග පාරවල් හතරක් එකේ හැම පටුමග පාරක් ඉස්සරහදීම බුදු කුටි ගානේ අලුතින් ඉදිකරා පිරිත් දැම්මා. ඒ පාරේ එක පටුමගක පාරක ඉන්නේ සම්පුර්ණයෙන් මුස්ලිම් අය .ඒත් ඒ පටුමගෙත් අර විදියටම බුදුකුටි ඉදි කරලා පිරිත් දැම්මා මේ පිරිත් දැමීම අපේ යාඥා කරන වේලාවට විකාශය වීම අපේ නැමැදුමට බාධාවක්.... "

මෙම සිද්ධීන් මගින් පැහැදිලි වන්නේ ජාතික තලයේදී මෙන් ම දෛනික ජීවිතයේදී මුස්ලිම්වරුන්ගේ ආගමික නිදහසට සිදු වන බාධා ලෙස ඔවුන් වෙනස්කොට සැලකීමකට ලක් කිරීම/කොන් කිරිමකට සහ තර්ජනයට ලක් වීම තවදුරටත් සිදුවන බවයි.

- ***ආගමික ස්ථානවලට ව්‍යාපාරික හා ස්ථානවලට සිදුවන පහරදීම්වලට ලක් වීම***

2018 ට පෙර සහ පසු කාලය තුළ විවිධ අවස්ථා සහ සිද්ධීන් පදනම් කරගෙන මුස්ලිම් ආගමික ස්ථානවලට සහ ව්‍යාපාරික ස්ථානවලට පහරදීම සහ දේපල හානි සිදුවීම ක්ෂේත්‍ර දත්ත මගින් නිරීක්ෂණය වේ. මෙම ගැටුම් සහ සිද්ධීන් අධ්‍යයනය කිරීමේදී බොහෝදුරට පැහැදිලි වුයේ බාහිරින් පැමිණි පිරිස් විසින් ගැටුම් ඇති කර දේපල හානි සහ කඩවල භාණ්ඩ සොරා ගැනීම සිදු කළ බවයි. මෙහිදී විශේෂයෙන් මුස්ලිම්වරුන්ගේ ව්‍යාපාරික ස්ථානවලට හානි කිරීම සහ ඒවයේ භාණ්ඩ සොරා ගැනීම මුලික ඉලක්කයන් වු බව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රතිචාරකයකු සම්මුඛ සාකච්ඡාවේදී අනාවරණය කරන ලදී. කෙසේ නමුත් මෙම පහරදීම් සහ දේපල හානි නිසාවෙන් සිදු වුයේ මුස්ලිම්වරුන් තුළ අනෙකා පිළිබඳ බය සහ සැකය/ අනාරක්ෂිත බව බොහෝවිට වර්ධනය වීමයි. සම්මුඛ සාකච්ඡාවකදී ප්‍රතිචාරකයකු කියා සිටියේ,

> "තාමත් මුස්ලිම් අයගේ නිවසකට සිංහල අපි ගියාම එයාලා බයයි. ඒ වගේ ප්‍රාදේශීය සභාවේ ඉදගන්න තියෙන පුටුවක සිංහල කෙනෙක් ඉදගෙන ඉන්නවා නම් මුස්ලිම් කෙනෙක් ඒ ළග වාඩිවෙන්නේ නැහැ. ඒවගේම සිංහල කෙනෙකුත් මුස්ලිම් අය ළග වාඩිවෙන්නේ නැහැ"

මේ අනුව පැහැදිලි වන්නේ අනෙකා පිළිබඳ එකිනෙක ජාතීන් අතර බය, සැකය සහ අනාරක්ෂිතභාවය තවදුරටත් සමාජයේ පවතින බවයි. එය ඒ ඒ පුද්ගලයාගේ නිදහසට බාධා පුමුණුවන අතරම එය නිරායාසයෙන් ම ආගමිකත්වයට ද බලපෑම් කරන බව මෙහිදී පැහැදිලි වේ.

- ***කොවිඩ් සමය තුල මුස්ලිම් ජනතාවගේ ආගමික නිදහසට සිදුවූ බාධාවන්***

මුස්ලිම් ප්‍රජාවේ ආගමික නිදහසට අභියෝගයන් කිහිපයක්ම කෝවිඩ් සමය තුල උත්ගත විය. මේවා අතරින් කෝවිඩ් 19 වසංගතය නිසාවෙන් මිය යන පුද්ගලයන්ගේ දේහයන් අනිවාර්යයෙන් ආදාහනය කිරීමට නියෝග කිරීම දැක්විය හැකිය. මුස්ලිම් ජාතිකයන් ඔවුන්ගේ ආගමික විශ්වාසයට අනුව මළවුවන් භූමදානයට අවසර ලැබුණේ විරෝධතා කිහිපයක් සිදු කිරීමෙනි. කුරුණෑගල ප්‍රදේශයේදී සිදු කරන ලද සම්මුඛ සාකච්චාවකදී ප්‍රතිචරකයෙකු මේ බව සනාත කරන ප්‍රකාශයක් සිදු කළේය.

කොවිඩ් 19 රෝගය ව්‍යාප්ත කිරීමට මුස්ලිම් ජාතිකයන් මූලික වන බවට අනෙක් ආගමික ප්‍රජාවන් තුළ සැකයක් මෙම අවධියේදී පැවතිණි. කෝවිඩ් වෛරසය මුස්ලිම්වරුන් වෙතින් පැතිරීම සම්බන්ධයෙන් මතයක් ගොඩනැගිමෙහි ලා ජන මාධ්‍ය නාලිකා ද මැදිහත් වීමක් සිදු කළේය.[69] එසේම 2021 දී සෝෂල් ඉන්ඩිකේටර් (Social Indicator (SI)) විසින් සිදු කරන ලැබූ සමීක්ෂණ දත්ත[70] මගින් තවදුරටත් තහවුරු කරන්නේ කෝවිඩ් 19 රෝග ව්‍යාප්තිය සඳහා කිසියම් ජනවාර්ගික කණ්ඩායමක ක්‍රියා කලාපය හේතු වන බවටය

> "අපි ගියා කෝවිඩ් කාලයේදී මාස්ක් සහ ආරක්ෂිත සේෆ්ටි කිට් බෙදන්න කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට.මම මුස්ලිම් ජාතිකයෙක් කියලා එතන ඉදපු නිලධාරීන් දන්නේ නැහැ. එන්නත්කරණයක් තියෙනවා ලග තියෙන මුස්ලිම් ගමේ.දන්නේ නැද්ද එයාලා සුවර් නැහැ. මේ රෝගෙ බෝකරන්නේ ඕකුන් තමයි.... "

මෙම චෝදනාවට මුස්ලිම්වරුන් ලක්වීමට මූලිකවම බලපෑවේ මුස්ලිම් සමාජයේ පවතින ගති පැවැතුම්, ආගමික සිරිත් විරිත් පිළිබදව ඒ වන විටත් සමජය තුල පැලපදියම් තිබූ ආකල්පයන් බව මෙම අධ්‍යයනයේදී හෙළි විය. මේ ආකල්පයන් නිසාවෙන් මුස්ලිම් ප්‍රජාවගේ ආගමික නිදහසට අභියෝගයන් ඇතිවීම කොරෝනා සමය තුල සිදු විය.

[69] Moinudeen, S. (2021). Ethno-centric pandemic governance: The Muslim community in Sri Lanka's COVID response.

[70] Socio-Economic Index in the Face of COVID-19", a survey conducted to understand the extent to which the pandemic has affected the livelihoods, health, education and social relations of the Sri Lankan public – Social Indicator (Centre for Policy Alternatives), 2021

**ආගමික නිදහස සහ මුස්ලිම් කාන්තාව**

ආගමික නිදහස මුස්ලිම් කාන්තාවන්ට බලපාන්නේ දෙයාකාරකිනි. මින් පළමුවැන්න වන්නේ මුස්ලිම් කාන්තාවන්ගේ ආගමික නිදහසට වෙනත් ආගමික ප්‍රජාවන්ගෙන් සිදුවන බලපෑම්ය. දෙවැන්න වන්නේ, තම මුස්ලිම් ආගමික ප්‍රජාව තුළ ම නිදහසේ ආගම ඇදහීමේ හැකියාව කාන්තාවන්ට සීමා වී ඇති ආකාරයයි. වෙනත් ආගමික ප්‍රජාවන් මුස්ලිම් කාන්තාවන් ඉලක්ක කර ඇති මූලික ආකාරයක් වන්නේ ඔවුන්ගේ ඇඳුම් හා පැළඳුමෙහි තේරීමයි. මෙරට 2021 මාර්තු මාසයේදී යෝජනා වු බුර්කා තහනම ආගමික නිදහස සෘජුවම උල්ලංඝනය කිරීමකි. අන්තර් ආගමික සහජීවනය පිළිබඳ ප්‍රවීණයන් සමග කළ සම්මුඛ සාකච්ඡාවලට අනුව, යෝජිත බුර්කා තහනමට හේතුවෙන් මුස්ලිම් කාන්තාවන් මුහුණ දුන් අපහසුතාව මෙසේ විස්තර කරන ලදී.

> "පොඩි කාලේ ඉඳන් බුර්කාව ඇඳපු මුස්ලිම් කාන්තාවන් මේ බුර්කා තහනම එක්ක අපහසුතාවයකට පත් වුණා. මොකද එයාලා පොඩි කාලේ ඉඳලම බුර්කාව ඇන්ද නිසාත් වෙනත් ඇඳුමක් ඇඳන් එළියට යන්න ඔවුන් බය වුණා. සමහර වැඩිහිටි කාන්තාවන් මේ බුර්කා තහනම නිසා එළියට යාමට නොහැකිව හඬා වැටුණා.."

අන්තර් ආගමික සංහිඳියාව පිළිබඳ කටයුතු කරන සිවිල් සමාජ ක්‍රියාකාරියෙක් සමග සිදුකළ සම්මුඛ සාකච්ඡාවලට අනුව, බුර්කාව හෝ හිජාබය පැළඳ සිටින කාන්තාවන් පාසල් තුළ රැකියා කරන ස්ථානයේදී හෝ සෞඛ්‍ය සේවා ලබා ගැනීමේදී රෝහලේදී හෝ අත්‍යවශ්‍ය සේවාවන් වෙත ප්‍රවේශ වීම වැනි එදිනෙදා ජීවිතයේ කටයුතුවලදී තම ඇඳුම හේතුවෙන් වෛරී සහගත ප්‍රකාශවලට සහ ප්‍රසිද්ධියේ වෙනස්කම්වලට ලක්ව ඇති බව අනාවරණය විය. කුරුණෑගල ප්‍රදේශයේ ප්‍රතිචාරකයකු කියා සිටියේ,

> "බුර්කාව පැළඳී බොහෝ මුස්ලිම් කාන්තාවන් ඉලක්ක කරගෙන ගොනිබිල්ලෝ වැනි යෙදුම් ඔවුන් හැඳින්වීමට භාවිතා කළ බවයි. බුර්කාව අඳින මුස්ලිම් ගැහැණු අය ගොනිබිල්ලෝ කියලා තමයි හඳුන්වන්නේ. ඒ අර කලු පාට ගොනියක් වගේ ඇඳුම නිසා ඒ වගේම ඔවුන් කියනවා ඕවා මෙහෙ අඳින්නේ නැතුව අරාබියට ගිහිල්ලා අඳින්න කියලාත්..."

සිය ආගමික ප්‍රජාව තුලම පිරිමියාට සාපේක්ෂව අඩු ආගමික නිදහසක් බුක්ති වීඳීම මුස්ලිම් කාන්තාව මුහුණ දෙන අනෙක් අභියෝගයයි මෙහිදී ප්‍රජා නීතිවලට අනුව කාන්තාවන්ට යාඥාවන් සහ සුසාන භූමි සඳහා පල්ලිවලට පැමිණීම සීමා කර ඇත. තවද, ඔසප් වීමේදී කාන්තාවන්ට කිසිදු ආගමික වතාවත්වල යෙදීම තහනම්ය. මෙය සියලුම මුස්ලිම් කාන්තාවන්ගේ ආගමික නිදහසට බාධාවක් හෝ බාධාවක් ලෙස නොසැලකිය හැකි වුවද, ඇතැම් මුස්ලිම් කාන්තාවන්ට යාඥා කිරීමට හෝ මියයන සමීපතමයන්ගේ අවසන් කටයුතුවලට සහභාගී වීමට නොහැකිවීම මුස්ලිම් කාන්තාවන්ගේ නිදහසට බාධාවක් ලෙස දිස්ත්‍රික් මට්ටමේ අන්තර් සහජීවන ක්‍රියාධරයකු විසින් හෙළි කරන ලදී. මේ අනුව මුස්ලිම් කාන්තාවගේ ආගමික නිදහස මුස්ලිම් වීම නිසා මෙන් ම කාන්තාවක් වීම නිසා ද සිය සමාජය තුළ මෙන් ඉන් පිටතින් පැමිණෙන අභියෝග නිසා ද සීමාවට ලක්වන බව තේරුම් ගත හැකිය.

වර්තමාන ආර්ථිකය හා දේශපාලන අර්බුද හමුවේ සිංහල බෞද්ධයන් ජාතිකයින් සහ මුස්ලිම්වරුන් අතර පවතින සම්බන්ධය පිළිබඳ පවතින වත්මන් සාකච්ඡාව එතරම් නිෂේධනීය බවක් නිරීක්ෂණය නොවේ. මෙම ජන කොටස් දෙකම අල්ලස් සහ දූෂණයට එරෙහිව සටන් කිරීම වැනි පොදු අරමුණක් වෙනුවෙන් සටන් කරන බව විද්‍යමාන වන කරුණකි. එහෙත්, ඉතා හොඳ පාලනයක් අපේක්ෂාවෙන් මෙකී ජාතීන් අතර එකතුවීම ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ සන්දර්භය තුළ වාර්ගික දේශපාලනය මගින් රෝපණය කරන ලද සමහර බීජ සහ නිර්මාණය කරන ලද අගතීන් නිසා වියැකී යාමේ ඉඩ බොහෝදුරට ඇති බව ගම්‍යවන කරුණකි.

## ක්‍රිස්තියානි ප්‍රජාව

ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි ප්‍රජාව කාලාන්තරයක් තිස්සේ ඔවුන්ගේ ආගමික නිදහසට බාධා පමුණුවන විවිධ අභියෝගවලට මුහුණ දෙමින් සිටිම විද්‍යමාන වන කරුණකි. ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි එවැන්ජලිකල් සන්ධානය 1994 සිට ක්‍රිස්තියානි ප්‍රජාවගේ නිදහස අභියෝගයට ලක් වූ විශේෂිත සිදුවීම් පිළිබඳව එකතු කර ඇති දත්ත මීට සාක්ෂි සපයයි. එහෙත්, ශ්‍රී ලංකාවේ ආගමික නිදහස උල්ලංඝනය වීම සම්බන්ධයෙන් මුස්ලිම් ප්‍රජාව මුහුණ දෙන අභියෝග සහ බාධාවන් සඳහා ජාතික මට්ටමේ දී ලැබෙන අවධානයට සාපේක්ෂව ක්‍රිස්තියානි ප්‍රජාවගේ ආගමික නිදහස සහ විශ්වාසයන් උල්ලංඝනය කිරීමේ සිද්ධීන් සම්බන්ධයෙන් ජාතික මට්ටමේ අවධානයට ලක් වීම මෑත කාලයේ දී අවම මට්ටමක පවතී. තවද, 2018 වසරේ සිට සිදු කරන ලද ගුණාත්මක සම්මුඛ සාකච්ඡා සහ සමීක්ෂණ මගින් ගම්‍ය වන්නේ ක්‍රිස්තියානි විරෝධී හැඟීම් ප්‍රාදේශීය මට්ටමින් වඩාත් බහුලව පවතින බවයි.

2019 හි ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි එවැන්ජලිකල් සන්ධාන (NCEASL) වාර්තාවකට අනුව, ක්‍රිස්තියානි ප්‍රජාවගේ ආගමික නිදහස විවිධ උල්ලංඝනයන්ට යටත් වන අතර, ඒවායින් බහුතරයක් වාචික ස්වභාවය ගනී, එනම් තර්ජන, බිය ගැන්වීම්, වෙනස් කොට සැලකීමේ අවස්ථා සහ ප්‍රජාවට එරෙහිව වෛරී ප්‍රකාශ භාවිතා කිරීම යි.[71]

ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි එවැන්ජලිකල් සන්ධානය මගින් නිකුත් කළ වාර්තාවල දත්ත වලට අනුව බැලුවිට, ප්‍රදේශයන්හි රාජ්‍ය නිලධාරීන්ගේ සහ පොලිසියේ ක්‍රියාවන් ක්‍රිස්තියානි ප්‍රජාවගේ ආගමික නිදහස යටපත් කරන බව පැහැදිලි වන කාරණයකි. මෙම අධ්‍යයනයේ සොයාගැනීම්වලින් හෙළිදරව් වන්නේ පොලිසිය ඍජුව හෝ වක්‍රව සෙසු රාජ්‍ය නිලධාරීන්ගේ පැත්ත ගන්නා බවත්, පොලිසියේ එම ක්‍රියාවන් බොහෝ අවස්ථාවලදී ක්‍රිස්තියානි ප්‍රජාවට අහිතකර ලෙස බලපාන බවයි. එසේම ක්‍රිස්තියානි ප්‍රජාවට එරෙහි සිදුවන බරපතල සිද්ධියක දී මිස පොලිස් නිලධාරීන් ඊට එරෙහිව පියවර නොගන්නා බව ද මෙම අධ්‍යයන වාර්තාව අනාවරණය කරයි.[72] ක්‍රිස්තියානි ප්‍රජාව සුළුතරයක් සිටින ප්‍රදේශවල, ක්‍රිස්තියානි

---

[71] Schubert, M., 2019. *Restrictions and Violence against Religious Minorities: An Incident Analysis*. [online] Available at:
https://www.minormatters.org/storage/app/uploads/public/5d3/7fb/10c/5d37fb10ce12e404095654.pdf

[72] Verité Research. 2021. *Prejudice and Patronage: An Analysis of Incidents of Violence against Christians, Muslims, and Hindus in Sri Lanka (September 2019 – September 2020)*. [online] Available at:

ප්‍රජාවට එරෙහිව විශාල කණ්ඩායම් බලමුලු ගන්වන ප්‍රාදේශීය භික්ෂූන් වහන්සේලා විසින් ක්‍රිස්තියානි ප්‍රජාවගේ ආගමික නිදහස උල්ලංඝණය කිරීම්වලට ලක්වීමට වැඩි ප්‍රවණතාවක් ඇති බව මෙම වාර්තාව මගින් පැහැදිලි කරයි.

මෙම අධ්‍යයනය සඳහා ප්‍රතිචාරකයන් සමග කරන ලද  සම්මුඛ සාකච්ඡාවලින් ද අනාවරණය වන්නේ ක්‍රිස්තියානි ප්‍රජාවගේ ආගමික නිදහස උල්ලංඝනය කිරීමේ සිද්ධීන්වලට මැදිහත්වීමේදී  ප්‍රදේශයේ භික්ෂූන් වහන්සේලාට පාක්ෂිකත්වයෙන් යුතුව පොලිසිය කටයුතු  කරන බවයි.

2018 වසරේ ආගමික නිදහස් පිළිබඳ ජාතික සාම මණ්ඩලයෙන් සිදුකරන ලද අධ්‍යයනයෙන් ආගමික නිදහසට ඇති ප්‍රධාන තර්ජනයක් ලෙස අන්‍යාගමිකරණය දක්වයි (ඇමුණුමේ  ප්‍රස්තාර 4 බලන්න)[73] මෙම අධ්‍යයනයෙන් වැඩිදුරටත් හෙළි වන්නේ "අන්‍යාගමිකරණය " බෞද්ධ, හින්දු සහ කතෝලික යන ආගම් තුන විසින් ප්‍රධාන  අභියෝගයක් ලෙස හඳුනාගෙන ඇති බවයි. කෙසේ නමුත් ක්‍රිස්තියානි ප්‍රජාව සහ මුස්ලිම් ප්‍රජාවන් අන්‍යාගමිකරණය සම්බන්ධයෙන් තමන්ට ගැටලුවක් පවතින බව ප්‍රකාශ කරන්නේ සාපෙක්ෂව අඩුවෙනි (ඇමුණුමේ  ප්‍රස්තාර 5 බලන්න) . එමෙන්ම අනාගතයේ දී සිය ආගමේ අනුගමිකයන් සිය ආගම වෙනස් කරනු ඇතැයි යන්න පිලිබඳව කනස්සල්ලෙන් සිටියි ද යන්න පිළිබඳ ව ප්‍රශ්න කරන විට ද බෞද්ධ, හින්දු සහ කතෝලික ආගම් නියෝජනය කරන ලද ප්‍රතිචාරකයන් ඒ පිළිබඳව වැඩි කනස්සලකින් පසුව ඇති අතර මුස්ලිම් සහ ක්‍රිස්තියානි ආගම් නියෝජනය කරන ලද ප්‍රතිචාරකයන් ඒ පිළිබඳව අඩු කනස්සලකින් පසුව ඇති බව එම වාර්තාවේ සඳහන් වේ (ඇමුණුමේ  ප්‍රස්තාර 6 බලන්න). මෙම අධ්‍යයනය සඳහා ප්‍රතිචාරකයන් සමග සිදුකළ  සම්මුඛ සාකච්ඡා මගින් අනාවරණය වුයේ  ප්‍රාදේශීය මට්ටමින් සිදුවන අන්‍යාගමිකකරණය සඳහා මූලික වශයෙන් ක්‍රිස්තියානි සහ මුස්ලිම් ජාතිකයන්ට දොස් පැවරෙන බවයි. ඒ අතුරින් ද ක්‍රිස්තියානි ප්‍රජාව සම්බන්ධයෙන් මෙම චෝදනාව බහුලව ඇති බව අධ්‍යයනයට සහභාගි වු ක්‍රිස්තියානි පුජකයන් පිලිගත්තේ,  සුභාරංචිය දේශනාකිරීම (the good news or the gospel )[74] වරදවා වටහා ගැනීමක් මත සිදුවන්නක් ලෙසය.

ක්‍රිස්තියානි ප්‍රජාව සම්බන්ධයෙන් ගත් කල,  ප්‍රතිචාරකයකු සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡාවකින් හෙළි වුයේ ක්‍රිස්තියානි ප්‍රජාව සහ ඔවුන්ගේ අභිප්‍රායන් පිළිබඳව අනෙකුත් ආගමික කණ්ඩායම් අතර භීතියක් පවතින බවයි. ක්‍රිස්තියානි පූජකවරයකු සමඟ කළ සම්මුඛ සාකච්ඡාවකින් ද තහවුරු වූයේ මේ පදනම මත ක්‍රිස්තියානි ආගමට හැරවීමේ (අන්‍යාගමිකකරණය) ප්‍රශ්නය නාගරික ප්‍රදේශවලට වඩා ගම්බද ප්‍රදේශවල බහුලව පවතින බවයි. තවද මේ අන්‍යාගමිකකරණය කරණ කොට ගෙන ක්‍රිස්තියානි සමාජය

---

https://www.veriteresearch.org/wp-content/uploads/2021/06/VR_Eng_RR_Mar2021_Prejudice-and-Patronage-An-Analysis-of-Incidents-of-Violence-against-Christians-Muslims-and-Hindus-in-Sri-Lanka.pdf

[73] National Peace Council – Religious Freedom Index (2018)

[74] සුබාරංචිය යන්න පිළිබඳ බයිබලයේ තුළ පැහැදිලි කර ඇත. ඊට අනුව ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සිය ජීවිතය කුරුසය මත පුද කිරීම හා  යළි මරණයෙන් උත්ථානය වීම කේන්ද්‍රගත කොට මනුෂ්‍ය වර්ගයා ගලවා ගැනීම උදෙසා දෙවියන් වහන්සේගේ කටයුතු කිරීමට අදාළ පණිවිඩයයි.
Religion Wiki. n.d. *Good News (Christianity)*. [online] Available at: https://religion.fandom.com/wiki/Good_news_(Christianity)

පිළිබඳව නොරුස්සන බවක් බෞද්ධ, හින්දු මෙන්ම රෝමානු කාතෝලික ආගමිකයන්ට ද ඇති බව සම්මුඛ සාකච්ඡාවකදී සඳහන් විය.

කෙසේ වෙතත්, ක්‍රිස්තියානි පූජකවරුන් සමග සිදුකරන ලද සම්මුඛ සාකච්ඡාවලට අනුව ඔවුන් වෙනත් ආගමික කණ්ඩායම්වල සාමාජිකයන් ක්‍රිස්තියානි ආගමට හරවා ගැනීම සඳහා බලය හෝ බලපෑම භාවිතා කිරීමට විරුද්ධ වන බවත් එසේ කිරීමට තම ක්‍රිස්තියානි පූජකයන් අධෛර්යමත් කරන බව කියා සිටියේය. තවද, ඔවුන් කියා සිටියේ  බොහෝ අවස්ථාවලදී, ක්‍රිස්තියානි පල්ලි මගින් මිනිසුන්ට ද්‍රව්‍යමය ප්‍රතිලාභ ලබා දීමෙන් ක්‍රිස්තියානි නොවන අය තම ආගමට හැරවීමට අපේක්ෂා නොකරන නමුත් අන් අයට උපකාර කිරීම ඔවුන්ගේ ඇදහිල්ල, විශ්වාසයන් සහ ආගමික ඉගැන්වීම්වල වැදගත් අංගයක් නිසාවෙන් එය සිදු කරන බවයි.

මෙම පසුබිම තුල ක්‍රිස්තියානි ප්‍රජාවගේ ආගමික නිදහස පහත දක්වා ඇති ආකාරයන් වලින් බාධාවන්ට ලක් වීම දැකිය හැකිය.

- ***බැන වැදීම් සහ තර්ජනය කිරීම්***

  ක්‍රිස්තියානි ප්‍රජාව මුහුණ දෙන බැනවැදීම් අතරින් ප්‍රධාන හේතුවක් ලෙස දක්නට ලැබෙන්නේ අන්‍යාගමිකකරණයයි. මේ සම්බන්ධයෙන් විස්තර කරන ක්‍රිස්තියානි පූජකයෙක් සඳහන් කළේ කොරෝනා සමයේදී අසරණභාවයට පත් පවුල්වලට උදව් කිරීමට යාමේ දී මෙන් ම වත්මන් තෙල් / ගෑස් අර්බුදය හේතු කොට ගෙන දිගු පෝලිම්වල සිටින අයට සංග්‍රහ කිරීමට යාමේ දී පවා ඔවුන් යහපත් චේතනාවෙන් සිදුකරන ලද කර්තව්‍යය  ආගම වෙනස් කිරීමට දරන ලද  ප්‍රයත්නයක් ලෙස සලකා බැන වැදීමට ලක් වු බවයි. එමෙන්ම අන්‍යාගමිකකරණය අදාල සිදුවන බැනවැදීම් සම්බන්ධයෙන් මලෙෙහ දමිල ප්‍රජාව නියෝජනය කරමින් සම්බන්ධ වූ  ප්‍රතිචාරකයකු  ප්‍රකාශ කර සිටියේ සිය ප්‍රදේශයේ හින්දු භක්තියන් බොහෝ සෙයින් ක්‍රිස්තියානි ආගමට හැරෙන අතර එලෙස ආගම වෙනස් කරන පුද්ලගයින් සිය ගම තුළ ක්‍රිස්තියානි ආගම දේශනා කිරීම සිදු කළහොත් හින්දු භක්තිකයන් එකතු වී ඔවුන්ට බැන වැදීමට හා තර්ජනයට ලක් කරන බවයි.

  එමෙන්ම අන්‍යාගමිකකරණ යන චෝදනවට සමගාමීව ක්‍රිස්තියානි ප්‍රජාව බැන වැදීමට ලක්වන තවත් අවස්ථාවක් වන්නේ සුබාරංචිය දේශනා කිරීම සඳහා පිටත්සර ගම්මානවලට යෑමේදී ය. වව්නියා දිස්ත්‍රික්කයෙන් මෙම අධ්‍යයනයට සම්බන්ධ වු ප්‍රතිචාරකයෙක් ප්‍රකාශ කර සිටියේ පිටත්සර ගම්මානවලට යාමේ දී මුද්‍රිත පත්‍රිකා බෙදීම හේතු කොටගෙන ක්‍රිස්තියානි ප්‍රජාව බැනවැදීම්වලට ලක්වන බවයි.

  ඇතැම් ගම්මානවල ජීවත්වන ක්‍රිස්තියානි ප්‍රජාව බැනවැදීම්වලට ලක්වන කාරණයක් ලෙස මෙම අධ්‍යනයේ දී හෙළි වුයේ ගමට ආගන්තුකයන් ගෙන්වා ගන්නා බවට එල්ල වන චෝදනාව හේතුකොටගෙන ය. අධ්‍යයනයට සහභාගී වු තවත් ප්‍රතිචාරකයකු සඳහන් කළේ ක්‍රිස්තියානි භක්තිකයන්ගේ නිවාසවලට යම් යම් අවස්ථාවන් වලදී පූජකයන් යාඥා කිරීම සඳහා පැමිණෙන

බවත් මෙය ඇතැම් විට මසකට කීප වතාවක් සිදුවිය හැකි බවත් යම් අවස්ථාවලදී වෙනදා පැමිණෙන පුද්ගලයන්ට වඩා වෙනත් පුද්ගලයන් පැමිණෙන බවත් එය හේතුකොට ගෙන එම ගම්මානයේ සිටින අනෙකුත් ආගමිකයින් විසින් නන්නාදුරන පුද්ගලයන් ගම තුළට ගෙන්වා ගන්නා චෝදනාවෙන් මොවුන්ට බැන වදින බවයි. මේ සම්බන්ධයෙන් ප්‍රතිචාරකයන් තවදුරටත් ප්‍රකාශ කළ සිටියේ මෙය අනෙකුත් ආගම්වල ආගමික භාවිතාවන්ට වඩා වෙනස් නිසා ඒ පිළිබඳ සැකයෙන් ඔවුන් දෙස බලන බවයි.

තවද ක්‍රිස්තියානි භක්තිකයන් බැනවැදීම්වලට ලක්වන තවත් අවස්ථාවක් ලෙස දැක් වුයේ දෙන ලද ගම්මානයක එක දේවස්ථානකට වඩා වැඩි ප්‍රමාණයක් පවත්වා ගෙන යන්නේ යැයි යන චෝදනාව මතය. මේ සම්බන්ධයෙන් අදහස් දක්වන ලද උතුරු පළාතින් සම්බන්ධ වු ප්‍රතිචාරකයෙක් ප්‍රකාශ කර සිටියේ උතුරු පළාතේ ඇතැම් ගම්මානවල එක් ක්‍රිස්තියානි සභාවකට වඩා ක්‍රියාත්මක වන බවත් මෙම සභාවන් පිළිබඳ වෙනස්කම් නොදන්නා අනෙකුත් ආගම්වල පුද්ගලයන් ක්‍රිස්තියානි භක්තිකයන්ට බැන වදින්නේ සිය ආගමික කණ්ඩායමට එක් සිද්ධස්ථානයක් පමණක් තිබියදී ක්‍රිස්තියානි භක්තියන් සිද්ධස්ථාන කිහිපයක් පවත්වාගෙන යාම තුළින් ගම්මානය ක්‍රිස්තියානිකරණයට ලක් කිරිමට උත්සාහ ගන්නා බව පවසමිණි.

මෙම අධ්‍යනයේදී වාර්තා වු අනෙකුත් බැනවැදීම්වලට ලක් වීම වුයේ ක්‍රිස්තියානි ආගමික වතාවත්වලදී නිකුත්වල ශබ්දය හේතුකොට ගෙන අනෙකුත් ආගමිකයන් විසින් සිදුකරන බැන වැදීම් වලට ලක් වීමයි. මේ සම්බන්ධයෙන් අදහස් දක්වක්වමින් අධ්‍යයනයට සහභාගී වු ප්‍රතිචාරකයෙක් සඳහන් කළේ ක්‍රිස්තියානි ආගමික කණ්ඩායම් සිය ආගමික වතාවත් බොහෝවිට නිවෙස් තුළ පවත්වන බවත් එහිදී සංගීත භාණ්ඩ භාවිතා කිරීම ආගමික චාරිත්‍රවල ස්වභාවය වන බවත් එහිදී නැගෙන ශබ්දය සම්බන්දයෙන් ප්‍රධාන වශයෙන් අනෙකුත් ආගමිකයන්ගේ බැනවැදීම් වලට ලක් වන බවයි.

- ***වෙනස්කොට සැලකීම***

ක්‍රිස්තියානි ජන සමාජයෙන් සිය ආගමික නිදහසට අදාළ නැගෙන තවත් චෝදනාවක් වන්නේ ඔවුන් සිය ආගමික අනන්‍යතාවය හේතුකොටගෙන වෙනස්කම් කිරීමට භාජනය වීමයි. මේ සම්බන්ධයෙන් අදහස් දක්වන ප්‍රතිචාරකයෙකු විසින් දරුවන් පාසලට ඇතුලත් කිරීම උදාහරණයක් ලෙස ගෙන සඳහන් කරන්නේ ක්‍රිස්තියානි දරුවකු කතෝලික පාසලකට ඇතුලත් කිරීමේදී දරුවාගේ ආගමික අනන්‍යතාවය බාධාකාරී ලෙස බලපාන බවයි. එම ප්‍රතිචාරකයාට අනුව,

> "අපේ දරුවකු කතෝලික පාසලකට ඇතුලත් කරගන්න යන ඉන්ටර්විව් එකේදීම ඇප්ලිකේෂන් එක උඩින් විසි කරා. කතෝලික වෙන්න කිව්වා දරුවව ඇතුලත් කරගන්න ඕන නම්..."

එමෙන්ම ක්‍රිස්තියානි සමාජයේ පූජ්‍ය පක්ෂයද සිය ආගමික අනන්‍යතාවය හේතුකොට ගෙන අනෙකුත් ආගමික පූජකයන්ට සාපේක්ෂව පොදු ස්ථාන වලදී වෙනස්කම් කිරීම් වලට ලක්වන බව මෙම අධ්‍යයනයේදී හෙළි වේ. එම ප්‍රතිචාරකයාට අනුව,

> "කතෝලික ආගමික නායකයන් අදින ලෝගුවට කරන සැලකිල්ල අපිට සහ අපේ ඇඳුමට කරන්නේ නැහැ. ඒ වගේම සමහර හාමුදුරුවන් සහ පූජකයන් අපි අන්තර් ආගමික වැඩසටහනකට එනවා කිව්වා ම ඒකට සහභාගී වෙන්නේ නැහැ. අපි එනවා නම් ඒ පූජකයන් හා හාමුදුරුවන් ඒ වැඩසටහනට සහභාගී නොවන බව කෙලින්ම කියනවා .... "

මීට අමතරව ක්‍රිස්තියානි භක්තිකයන් වෙනස්කම් කිරීම්වලට ලක්වන තවත් අවස්ථාවක් ලෙස අලුතින් ආගමික ස්ථානයක් ආරම්භ කිරීම දැක්විය හැකිය. මේ සම්බන්ධයෙන් අදහස් දක්වන ප්‍රතිචාරකයන් සඳහන් කළේ එවන් අවස්ථාවකදී රෝමානු කතෝලික පල්ලිය සහ බෞද්ධ පන්සල යන දෙකම එකට එකතු වී ඊට විරෝධය දක්වන අවස්ථා ද ඇති බවයි. නව සිද්ධස්ථාන ආරම්භ කිරීම සම්බන්ධයෙන් අදහස් දක්වමින් තවත් ප්‍රතිචාරකයෙක් ප්‍රකාශ කර සිටියේ බෞද්ධ විහාරස්ථාන ආරම්භයට අදාළ 2008 චක්‍රලේඛය අවභාවිතා කරමින් බෞද්ධ සමාජය විසින් ක්‍රිස්තියානි කණ්ඩායම් නව ආගමික සිද්ධස්ථාන ආරම්භ කිරීමට බාධා කරනු බවයි. එමෙන්ම මධ්‍යම පළාතින් සම්බන්ධ වූ ප්‍රතිචාරකයකු සඳහන් කළේ පළාත් පාලන ආයතන නිළධාරීන් ද මෙම අවභාවිතා කිරීම සිදු කරනු ලබන බවයි.

- ***සමාජය තුළ ගොඩනැගී ඇති සෘණාත්මක මතවාද වලට ලක් වීම***

ක්‍රිස්තියානි ජන සමාජයේ ආගමික නිදහසට ඇති තවත් බාධාවක් වන්නේ ඔවුන් සම්බන්ධයෙන් පිටස්තර සමාජයේ ගොඩනැගී ඇති සෘණාත්මක මතවාදවලට මුහුණ දීමට සිදු වීමයි. මෙහිදී ප්‍රධාන ලෙසම සිදු වන්නේ ක්‍රිස්තියානි ප්‍රජාව "මිත්‍යා දෘෂ්ටිකයන් "සහ "මූලධර්මවාදීන් " ලෙස ලේබල් කිරීමයි.ඊට ප්‍රධාන හේතුව ලෙස ප්‍රතිචාරකයන් දක්වන්නේ ඔවුන් විසින් සිදුකරන සුවකිරීමේ මෙහෙයන් සහ අනෙකුත් ආගමික භාවිතයන්ය. සුව කිරීමේ මෙහෙයන්වල සම්බන්ධයෙන් ඇතැම් ක්‍රිස්තියානි පූජකවරුන් ද පවසන්නේ ක්‍රිස්තියානි සභාවන් අතර සුවකිරීමේ මෙහෙයවන් වල ස්වභාවන් සම්බන්ධයෙන් එකඟ නොවන අවස්ථාද පවතින බවයි. එම නිසා ඇතැම් ක්‍රිස්තියානි සභාවල ක්‍රියාකලාපය ද මෙම ලේබල්ගත වීමට හේතුවන බව වැඩිදුරටත් සඳහන් කරයි.

ක්‍රිස්තියානි සභා සම්බන්ධයෙන් බාහිර සමාජයේ ඇති තවත් සෘණාත්මක මතවාදයක් වන්නේ ඒවා ශක්තිමත් ආයතන ව්‍යුහයකින් තොර දිගුකාලීන පැවැත්මක් සහතික කළ නොහැකි ආගමික කණ්ඩායම් වර්ගයක් ලෙසයි. එක් ප්‍රතිචාරකයෙකුට අනුව

"ක්‍රිස්තියානි සභාවන් ඇති වෙන්නේ හතු පිපෙනවා වගේ . අපි කියමු එක කණ්ඩායමක් තියෙනවා කියලා. ඒ කණ්ඩායමේ ඉන්න එක්කෙනෙක් කණ්ඩායමේ මතයට වෙනස් මතයක් දැරුවහොත් ඒ කෙනා ඒ කණ්ඩායමෙන් අයින් වෙලා ගිහින් තවත් කණ්ඩායමක් පටන් ගන්නවා. ක්‍රිස්තියානි සභාවල තියෙන විශේෂත්වය තමයි මෙහෙම වෙන් වෙවී යන එක... "

ක්‍රිස්තියානි සභාවන් සම්බන්ධයෙන් බාහිර සමාජයේ පවතින තවත් සෘණාත්මක මතයක් වන්නේ එම සභාවන් මුදල් අරභයා පවත්වාගෙන යන බවයි. ඒ සම්බන්ධයෙන් අදහස් දක්වන ප්‍රතිචාරකයන් සඳහන් කරන්නේ ක්‍රිස්තියානි සභාවල සිදුවන මුදල් එකතු කිරීම අනෙකුත් ආගමික පුරුදුවලට වෙනස් වන බැවින් මේ සම්බන්ධයෙන් අනෙකුත් ආගම් තුළ වැරදි මතයක් පවතින බවයි. මේ හා සමානව පවතින තවත් මතයක් ලෙස ප්‍රතිචාරකයන් දක්වන්නේ ක්‍රිස්තියානි සභාවන් වලට අධික ලෙස විදේශ ආධාර ලැබෙන බවයි. නමුත් මෙම අධ්‍යයනයට සහභාගී වූ ක්‍රිස්තියානි පූජකයන්ට අනුව ඔවුන් සිදු කරනු ලබන සමාජ සේවාවන්ට අවශ්‍යය මූල්‍ය ප්‍රතිපාදන ලැබෙනුයේ සිය අනුගාමිකයන්ගෙන් ලැබෙන මූල්‍ය ආධාර වලිනි.

ක්‍රිස්තියානි ආගමේ ආගමික නිදහස සම්බන්ධයෙන් අවසාන වශයෙන් ප්‍රකාශ කළ හැක්කේ ඔවුන්ගේ ආගමික නිදහසට බාධාවන් සිදු වීම ක්‍රිස්තියානි ආගමේ ඇති භාවිතයන් ප්‍රාදේශීය මට්ටමේදී අනෙකුත් ආගමික භක්තිකයන් විසින් වරදවා වටහා ගැනීම මෙන්ම ආගමික භාවිතයන් අතර සිදුවන ඝට්ටනයේ ප්‍රතිඵලයක් ලෙස හටගන්නා බවයි. මෙහිදී  ආගම ප්‍රචාරය කිරීම සම්බන්ධයෙන් ඇති සැකයන් මූලික ලෙසම හේතුවන අතර ඒ සම්බන්ධයෙන් ක්‍රිස්තියානි සභාවන් ප්‍රතිචාර දැක්වීම අභියෝගයට ලක් කරන්නේ ආගම ප්‍රචාරය සිදුවන ආකාරය සම්බන්ධයෙන් යම් යම් සභා අතර ද එකඟ නොවන තැන් තිබීම නිසාය. කෙසේ නමුත් මෙහිදී සඳහන් කළ හැක්කේ ක්‍රිස්තියානි සමාජයේ ආගමික නිදහසට ප්‍රධාන බාධාවක් වී ඇති වාචික හිංසනයන් එම ආගමික ප්‍රජාවගේ ආගමික නිදහස සීමා කිරීම් සම්බන්ධයෙන් සැලකිය යුතු මට්ටමේ බලපෑමක් එල්ල කරල බවයි.

## හින්දු ප්‍රජාව

ජාතික සාම මණ්ඩලය විසින් 2018  දී සිදුකරන ලද ආගමික නිදහස පිළිබඳ අධ්‍යයනයෙන් හෙළි වූයේ තම ආගමික නිදහස පිළිබඳ වඩාත් සැලකිල්ලක් දක්වන ආගමික ප්‍රජාවන් තුන අතරින් හින්දු ප්‍රජාව ද ඇතුලත් වන බවයි. එම අධ්‍යයනයට අනුව හින්දු ප්‍රජාව අනෙකුත් ආගමික කණ්ඩායම්වලට සාපේක්ෂව සිය ආගමික හා සංස්කෘතික  තත්ත්වය පිළිබඳ වඩා වැඩි කනස්සල්ලකින් පසුවන බව හෙළිවේ (ඇමුණුමේ වගු 1 බලන්න). මෙම කනස්සලුභාවය ප්‍රකාශ කළ  හින්දු භක්තිකයන්ගෙන් 49% ක ගේ ම ප්‍රධාන අවධානය යොමු වී තිබුණේ  අන්‍යාගමිකරණයට ය (ඇමුණුමේ  ප්‍රස්තාර 5 බලන්න). එම අධ්‍යනය තුළින් සොයාගත් තවත් කරුණක් වුයේ අනාගතය සම්බන්ධයෙන් ද හින්දු භක්තිකයන් අනෙකුත් ආගමික කණ්ඩායම්වලට සාපේක්ෂව ආගමික හා සංස්කෘතිකමය වශයෙන්  දැඩි අනාරක්ෂිතභාවයකින් පෙළෙන බවයි. එලෙස

පිළිගන්නා හින්දු භක්තිකයන්ගෙන් වැඩි ප්‍රමාණයක් සිය ආගමික කණ්ඩායමේ ජනතාව අනාගතයේ දී නීතිය හා සාමය පවත්වාගෙන යනු ලබන ආයතන වලින් සමානව සැලකීම්වලට භාජනය නොවනු ඇතැයි (33%) ද ජාතික මට්ටමේ දේශපාලනය තුළ අවධානයට ලක් නොවනු ඇතැයි ද (33%) ක්‍රමානුකූලව අනෙකුත් ආගම්වලට හැරෙනු ඇතැයිද (29%)යන්න පිළිබඳව කණස්සල්ලෙන් පසු වේ (ඇමුණුමේ  වගු 2 බලන්න).

උතුරු, නැගෙනහිර සහ මධ්‍යම පළාත්වලින් සිදුකරන ලද සම්මුඛ සාකච්ඡාවලින් හැගෙන්නේ හින්දු ප්‍රජාවගේ ආගමික නිදහස උල්ලංඝනය වන ආකාරය දිස්ත්‍රික්කය අනුව වෙනස්කම් වලට ලක්වන බවයි. යාපනය, මඩකලපුව, ත්‍රිකුණාමලය, මධ්‍යම සහ අනෙකුත් ප්‍රදේශවල හින්දු ප්‍රජාව අතර ආගමික-සංස්කෘතික භාවිතයන්හි පවතින යම් යම් වෙනස්කම් මෙයට හේතුවක් වී ඇත. ක්‍රිස්තියානි , මුස්ලිම් මෙන් ම බෞද්ධයන්ගෙන් ද හින්දු භක්තිකයන්ගේ ආගමික නිදහස සඳහා තර්ජන පවතින නමුත් මෙම කණ්ඩායම්වලින් එල්ල වන අභියෝගවල ස්වභාවය බොහෝදුරට එකිනෙකට වෙනස් බව සම්මුඛ සාකච්ඡාවලින් අනාවරණය විය. බොහෝ හින්දු ප්‍රජාවේ සාමාජිකයින්  විසින් රෝමානු කතෝලික ප්‍රජාව, ඔවුන්ගේ ආගමික නිදහසට තර්ජනයක් ලෙස නොසලකන බව සම්මුඛ සාකච්ඡාවලින් වැඩිදුරටත් අනාවරණය වු වැදගත් කරුණකි. මෙහිදී කාලයාගේ ඇවෑමෙන්, හින්දු සහ කතෝලික ප්‍රජාවන්ගේ ආගමික භාවිතයන්වල පොදු බව සහ ඔවුනොවුන්ගේ සමාන පිළිවෙත් ඇති වීමට පටන් ගත් ආකාරය මෙම ස්වභාවයට පදනම සපයයි. එසේ ම මෙම අදහස තවදුරටත් තහවුරු කරමින් ප්‍රතිචාරකයකු කියා සිටියේ කතෝලිකයන් සහ හින්දු භක්තිකයන් සිටින ප්‍රදේශවල ඔවුන්ගේ වත්පිළිවෙත් අන්‍යෝන්‍ය වශයෙන් ඒකාබද්ධ වීම දෘෂ්‍යමාන වන කරුණක් යන්නය. නිදසුනක් ලෙස හින්දු භක්තිකයන් ජීවත්වන ප්‍රදේශවල ජීවත්වන කතෝලිකයන් හින්දු භක්තිකයන් මෙන් ම හින්දු කුල ක්‍රමය පිළිගන්න බවත් කතෝලික දේවස්ථාන වර්ණ ගන්වා ඇති ආකාරය අනුව එම දේවස්ථානය අයත් කුලය ගැන අදහසක් ගතහැකි බව දැක්විය හැකිය. තවද කතෝලික විවාහ මංගලවලදී තැල්ල බැදීම වැනි හින්දු චාරිත්‍ර සිදු වන බව තවදුරටත් වාර්තා විය. ඒ අනුව අනෙක් ආගමික ප්‍රජාවන්ට සාපේක්ෂව සහජීවනයක් සහ අන්තර් බැදියාවක් හින්දු සහ කතෝලික ප්‍රජාව තුළ පවතින බව මේ අනුව ගම්‍ය වන්නකි.

මෙම පසුබිම තුල හින්දු ප්‍රජාවගේ ආගමික නිදහස පහත දක්වා ඇති ආකාරයන් වලින් බාධාවන්ට ලක් වීම දැකිය හැකිය.

- ***අන්‍යාගමිකකරණය***

  බොහෝමයක් සම්මුඛ සාකච්ඡාවලින් හෙළි වන පරිදි හින්දු භක්තිකයන්ගේ ආගමික නිදහසට එල්ල වන ප්‍රධාන බාධාවක් ලෙස හඳුනාගන්නේ අන්‍යාගමිකකරණයයි. මෙහිදී බොහෝදුරට ක්‍රිස්තියානි සහ මුස්ලිම් ප්‍රජාවන් විසින් හින්දු භක්තිකයන් අන්‍යාගමිකකරණයට ලක් කිරීමට සිදුවන  බව මෙහිදී  ප්‍රකාශ විය.  මලෙෙහ දමිළ ප්‍රජාවේ සහ උතුරු නැගෙනහිර හින්දු භක්තිකයන් සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡා මගින් ඔවුන්ගේ ආගමික කණ්ඩායමේ සාමාජිකයන් ක්‍රිස්තියානි ආගමට හැරීමට හේතුවන මුලික සාධක කිහිපයක් දක්වන ලදී . ඉන් එකක් වන්නේ හින්දු සමාජය තුළ පවතින කුල භේදය  ඔවුන්ට සමාජ පිළිගැනීමක් ලබා ගැනීමට බාධාවක් ලෙස දැකීමයි.

නමුත් බොහොමයක් ක්‍රිස්තියානි සභාවන් කුලය මත සිදුවන වෙනස්කම් කොට සැලකීම් ප්‍රතික්ෂේප කරන බව ප්‍රතිචාරකයන්ගේ අදහසයි. මඩකලපුවේ ප්‍රතිචාරකයකු සඳහන් කරන්නේ ක්‍රිස්තියානි භක්තිකයන් එකිනෙකාට "සහෝදරයා / සහෝදරිය" යැයි කියමින් ආමන්ත්‍රණය කරන ආකාරය සහ ඔවුන්ට ආගමෙන් ලබා දී ඇති නායකත්ව තනතුරු හින්දු ප්‍රජාවේ පහත් කුලවල සාමාජිකයින්ට ඉතා ආකර්ශනීය වන බවයි. ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ ප්‍රජාව වාසය කරන මධ්‍යම පළාතේ සිදු කරන ලද සම්මුඛ සාකච්ඡාවට අනුව, ඔවුන්ගේම ආගමික නායකයන්ගෙන් නොලැබෙන ඇතැම් ද්‍රව්‍යමය ප්‍රතිලාභ ක්‍රිස්තියානි සභාවන් වලින් ලැබීම හින්දු භක්තිකයන්ට සිය ආගම මාරු කිරීමට අවශ්‍යය කරන උත්තේජනය ලබා දී ඇති බව පෙනී යයි.

එසේම නැගෙනහිර පලාතේ හින්දු ප්‍රජාවේ සාමාජිකයන් ඉස්ලාම් ආගමට හැරීමේ ප්‍රවණතාවයක් ඇති බව මඩකලපුව ප්‍රදේශයේ ප්‍රතිචාරකයකු හා සිදු කරන ලද සම්මුඛ සාකච්ඡාවකදී අනාවරණය වන ලදී. මෙහිදී අම්පාර සහ කල්මුණ වැනි ප්‍රදේශවල බොහෝ හින්දු ප්‍රජාවන් ඉස්ලාම් ආගමට හැරෙන ආකාරයන් දෙකක් පිළිබඳව තමන්ට නිරීක්ෂණය කළ හැකි බව ඔහු විසින් පවසන ලදී. ඒ අනුව හින්දු ප්‍රජාවේ කාන්තාවන් මුස්ලිම් පිරිමින් හා විවාහ වීමෙන් ඉස්ලාම් ආගමට හැරෙන අවස්ථා හා මුස්ලිම් ව්‍යාපාරික ප්‍රජාවගේ ව්‍යාප්තිය සහ මුස්ලිම්වරුන්ගේ ව්‍යාපාරය සාර්ථකත්වය හේතුකොටගෙන ද හින්දු ප්‍රජාව ඉස්ලාම් ආගමට ආකර්ශනය වීම සම්මුඛ සාකච්ඡාවේ දී වාර්තා වූ දෙයාකාරයයි.

- ***බෞද්ධාගමිකකරණය***

  සම්මුඛ සාකච්ඡා සඳහා සහභාගී වූ අය විසින් නිරීක්ෂණය කරන ලද තවත් හින්දු ආගමිකයන්ගේ ආගමික නිදහසට ඇති බාධාව වූයේ හින්දු ජනයා ජීවත් වන ප්‍රදේශවල බෞද්ධ සිද්ධස්ථාන ස්ථාපනය කිරීමයි. මෙහිදී හින්දු ප්‍රජාවේ සාමාජිකයින් එවැනි සිද්ධස්ථාන ස්ථාපනය කිරීම බෞද්ධ සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට ගන්නා උත්සාහයක් ලෙසය. මෙම තත්ත්වය ඔවුන්ගේ ප්‍රදේශවල හින්දු ආගමික සංස්කෘතික අනන්‍යතාවයට බොහෝවිට බලපෑමක් ඇති කළ හැකි බවට භියක් හින්දු භක්තිකයන්ට ඇති බව සාකච්ඡාවලදි වාර්තා විය. මේ පිළිබඳව අදහස් දැක්වූ එක් ප්‍රතිචාරකයෙකුට අනුව

> " හින්දු අය කතරගම දේවාලයේ පූජාවට ගිහින් කරන ප්‍රධාන චෝදනාවක් තමයි. එතන හින්දු සංස්කෘතියට වඩා සිංහල බෞද්ධ සංස්කෘතික බලපෑම වැඩි කියන්න එක. ඒ වගේම උතුරු පළාතේ ඉන්න හින්දු භක්තිකයන් බයයි උතුරු පළාතේ බෞද්ධ සිද්ධස්ථාන හැදීම නිසා හින්දු සංස්කෘතිය විකෘති වෙයි කියලා"

ත්‍රිකුණාමලය, පොතුවිල් වැනි ප්‍රදේශවල වසර ගණනාවක් සිට හින්දු භක්තිකයන් වැඳුම් පිදුම් සිදුකළ ස්ථානවල අත්තනෝමතික ලෙස බෞද්ධ පිරිස් විසින් බුදු පිළිම, බෝ ගස් ආදිය ස්ථාපනය කර එම ස්ථානය බෞද්ධ පුදබිමක් යැයි කියන බව මඩකලපුවේ ප්‍රතිචාරකයකු විසින් සඳහන් කළේ ය. එසේ ම, හින්දු ප්‍රජාවන් වැඩි වශයෙන් වෙසෙන ඌව පලාතේ ප්‍රදේශවල සිංහල-බෞද්ධ ජනාවාස වැඩි වීම ද ඔවුන්ගේ ආගමික නිදහසට එල්ල වන තර්ජන වන බව මලෙහෙ දමිල

ප්‍රජාවේ ප්‍රතිචාරකයකු අනාවරණය කළේය.තවද උතුරු නැගෙනහිර යම් යම් ප්‍රදේශවල සිදුවන සිංහල ජනයා පදිංචි කිරීම් තුළින් ද මෙම බලපෑම් ඇතිවිය හැකි බව තවදුරටත් මෙම සාකච්ඡාවන්හි දී හෙළි විය.

- ***වෙනස්කම් කොට සැලකීමට භාජනය වීම***

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මෙන් ම හමුදාව වැනි රාජ්‍ය අධිකාරීන් කෙරෙහි විශ්වාසය තැබීමේ හැකියාව පිළිබඳව හින්දු ප්‍රජාවට ද ගැටලු පවතින බව වවුනියා දිස්ත්‍රික්කයේ ප්‍රතිචාරකයකු හෙළි කරයි. ආගමික නිදහස වැනි අයිතීන් උල්ලංඝනය වීම් ආරක්ෂා කිරීමට මෙම බලධාරීන් ඉතා පරමාදර්ශී ලෙස ක්‍රියාත්මක විම අපේක්ෂා කළත් මෙම බලධාරීන් සිංහල-බෞද්ධ අවශ්‍යතා නියෝජනය කරන බව බොහෝදුරට හින්දු ප්‍රජාවේ මතයයි. අධ්‍යයනයට සහාභාගීවූ ප්‍රතිචාරකයෙකුට අනුව,

> "හින්දු භක්තිකයන් හිතන්නේ හින්දු පුරාවිද්‍යාත්මක ස්ථාන පිළිබඳව පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුව උනන්දුවක් දක්වන්නේ නැහැ කියලා... පුරාවිද්‍යා එකෙන් උනන්දු වෙන්නේ බෞද්ධ පුරාවිද්‍යා ස්ථාන ගැන විතරයි කියලා හින්දු භක්තිකයන් සමහර වෙලාවට කරන චෝදනාවක් තමයි හින්දු භක්තිකයන් වැඳුම් පිදුම් කරන්න ඇතැම් ස්ථාන බෞද්ධ උරුමයන් විදිහට පෙන්නන්න හදනවා කියන එක"

මඩකලපු ප්‍රදේශයේ ප්‍රතිචාරකයකුට අනුව, නැගෙනහිර පළාතේ හින්දු ප්‍රජාව බොහෝ විට බෞද්ධයන් විසින් හින්දු ජනයා වෙසෙන ප්‍රදේශවල කරන ආගමික ඉදිකිරීම් වලට විරෝධය දැක්වීමට පසුබට වන්නේ බෞද්ධ ප්‍රජාවට හමුදාවේ ආරක්ෂාව හිමි වන බව විශ්වාස කරන නිසාය.

- ***ශිව සේනා බලපෑම***

හින්දු ප්‍රජාව තුළ ඉන්දියානු බලපෑමේ ව්‍යාප්තිය අනාගතයේදී ඔවුන්ගේ ආගමික නිදහසට තර්ජනයක් විය හැකි බව ප්‍රතිචාරකයන් සමග සිදුකළ සම්මුඛ සාකච්ඡාවලදී පැහැදිලි විය. යාපනය, මඩකලපුව සහ වවුනියාව වැනි ප්‍රදේශවල ශිව සේනා කණ්ඩායම සිටින බවට මෙම අධ්‍යයනය සඳහා සහභාගී වූ බොහෝ ප්‍රතිචාරකයන් අනාවරණය කර ඇත. ඔවුන් ප්‍රකාශ කළේ ශිව සේනා යනු ඉන්දියාවේ මහාරාෂ්ට්‍ර ප්‍රදේශයේ වඩාත් ප්‍රචලිත එම නමින්ම ඇති දක්ෂිණාංශික හින්දු සංවිධානය සමඟ සමීප සබඳතා ඇති කණ්ඩායමක් බවයි. ඉන්දියාව පුරා ප්‍රබල පැවැත්මක් ඇති හින්දු දක්ෂිනාංශික සංවිධානයක් වන රෂ්ට්‍රියා ස්වයාම්සේවක් සංග (ආර් එස් එස්) (Rashtriya Swayamsevak Sangh (RSS)) ට සහාය දක්වන පක්ෂ විසින් ප්‍රවර්ධනය කරනු ලබන "හින්දුත්ව"[75] හි (Hinutva) බලපෑම ද මෙම මතවාදය ව්‍යාප්තියට බලපා ඇති බව සමහර සම්මුඛ

[75] සමජාතීය බහුතරයක් සහ සංස්කෘතික ආධිපත්‍යයක් විශ්වාස කරන "දක්ෂිණාංශික" අනුවාදයක් ලෙස හින්දුත්ව ව්‍යාපාරය විස්තර කරයි. ඉන්දියානු සංස්කෘතිය, හින්දු සාරධර්ම අනුව නිර්වචනය කරන අතර ලෞකික ප්‍රතිපත්ති සහ ඒවායේ භාවිතයන්ට දැඩි ලෙස විරුද්ධ වේ. සමහර විශ්ලේෂකයින්ට අනුව, හින්දුත්වය යනු ගතානුගතිකවාදයේ හෝ "වාර්ගික නිරපේක්ෂවාදයේ" උග්‍ර මූලධර්මික අන්තයකි.

සාකච්ඡා මගින් අනාවරණය විය. මලයහ ප්‍රජාවේ ප්‍රතිචාරකයකුට අනුව, රටේ හින්දු ප්‍රජාව තුළ ශිව සේනා බලපෑම වැඩි වීම ශ්‍රී ලාංකේය හින්දු අනන්‍යතාවයට සැලකිය යුතු තර්ජනයක් එල්ල කරයි. ශිව සේනා සංවිධානයේ බලපෑම මත දිගු කලක් තිස්සේ හින්දු භක්තිකයන් විසින් වන්දනාමාන කරන බහිරව හෝ කතරගම දෙවියන්ට වන්දනාමාන කිරීම අධෛර්යමත් කරන අතරම, ශිව සහ විෂ්ණු දෙවියන්ට පමණක් නමස්කාර කිරීම ප්‍රවර්ධනය කරන බව ඔහු වැඩිදුරටත් පවසයි. මෙම බලපෑමෙන් ශ්‍රී ලාංකික හින්දු භක්තිකයන්ගේ ආගමික නිදහස සහ තම ආගම ඇදහීමේ හැකියාව සීමා විය හැකි බව සම්මුඛ සාකච්ඡා මගින් ගම්‍යමාන විය. අනෙක් අතට මෙම සම්මුඛ සාකච්ඡා මගින් මතු වූ තවත් කරුණක් වන්නේ උතුරු පළාතට වඩා නැගෙනහිර සහ මධ්‍යම පළාත්වල හින්දු ප්‍රජාවන්ට ශිවසේනා වැනි සංවිධාන පැවතීම විශාල තර්ජනයක් ලෙස සැලකූ බවයි. කෙසේ වෙතත්, වර්තමානයේ මෙබඳු සංවිධානවල බලපෑම සුළුවෙන් නිරීක්ෂණය වුවත් ශ්‍රී ලංකාව තුල ඉන්දියානු බලපෑම වැඩිවන අවධියක මෙවැනි සංවිධාන වල බලපෑමද අනාගතයේදී වැඩි වනු ඇති බව ප්‍රතිචාරකයන්ගේ අදහසයි .

- ***බැන වැදීම් වෛරී ප්‍රකාශ වලට ලක්වීම***

මෙම අධ්‍යයනය තුලදි වාර්තා වු ප්‍රධානම බැන වැදීමට ලක් වීමක් වුයේ හින්දු ආගමික වාතාවත් වලදී පිටවන ශබ්දය හේතුකොටගෙන සිදුවන බැන වැදීම් වලට ලක්වීමයි. මඩකලපුව ප්‍රදේශයේ ප්‍රතිචාරකයකු සමග සිදුකළ සම්මුඛ සාකච්ඡාවකට අනුව, හින්දු ප්‍රජාව කෝවිල් උත්සවවලදී සිදුකරන වන්දනාමානවලදී අධික ශබ්දයක් පිටවීම නිසා ඔවුන් බොහෝවිට චෝදනාවට ලක්වේ. නිදර්ශනයක් ලෙස පුත්තලමේ මුස්ලිම් ජනතාව මෙවැනි අධික ශබ්දයන් පිළිබඳව කෝවිල් බලධාරීන්ට පැමිණිලි කළ අවස්ථා ඇති බවද තවත් ප්‍රතිචාරකයෙකු ප්‍රකාශ කළේය. මෙම තත්ත්වය හින්දු ප්‍රජාවේ සමහර සාමාජිකයන් ඔවුන්ගේ ආගම ඇදහීමේ නිදහසට තර්ජනයක් ලෙස සලකන්නේ අනෙකුත් ආගමික ප්‍රජාවන් විසින් සිදුකරන ශබ්ද දූෂණයට සාපෙක්ෂව හින්දු භක්තිකයන් විසින් සිදු කරන ශබ්ද දූෂණය අල්ප වන බව දක්වමිනි.

ආගමික අනන්‍යතාව හේතු කොට ගෙන වෛරී ප්‍රකාශ වලට ලක්වීම ප්‍රධාන වශයෙන් වාර්තා වුයේ මධ්‍යම පලාතේ ජීවත් වන මලෙහ දමිළ ජන සාමාජය තුලිනි. මධ්‍යම පළාතේ ප්‍රතිචාරකයකු කියා සිටියේ

> "හින්දු අය වත්පිළිවෙතක් විදියට කිරිවලින් ශිව ලිංගය නෑවීම ගැන සිංහල අය විහිලු කරනවා. ඒ විතරක් නෙවෙයි ගිනි පෑගිම, ඇගේ කටු ගැසීම වගේ ආගමික චාරිත්‍ර දිහා අනිත් ජාතින් බලන්නේ සමච්චලයෙන් විහිලුවට ... "

ආගමික චාරිත්‍රවාරිත්‍ර සිදු කිරීමේදී හින්දු ප්‍රජාව ඉලක්ක කරගත් වෛරී ප්‍රකාශන සිදුවන බව මේ අනුව සඳහන් කළ හැකිය.

- ***ආගමික සිද්ධස්ථාන ආරම්භ කිරීමට ඇති බාධා***

  මඩකලපුව සහ පුත්තලම යන ප්‍රදේශවල ප්‍රතිචාරකයන් සමග සිදු කළ සම්මුඛ සාකච්ඡාවලින් හෙළි වන්නේ කෝවිල් ඉදිකිරීම සඳහා රජයෙන් ඉඩම් ලබා ගැනීමේ ක්‍රියා පටිපාටිය දුෂ්කර ක්‍රියාවලියක් බවයි. මේ හේතුවෙන් හින්දු ප්‍රජාව බොහෝවිට පෞද්ගලික ඉඩම්වල කෝවිල් ගොඩනඟන බවද ප්‍රතිචාරකයන් සඳහන් කළේය. ප්‍රතිචාරකයින් මෙය දකින්නේ හින්දු ප්‍රජාවේ ආගමික නිදහසට සහ ඔවුන්ගේ ඇදහිල්ල ප්‍රගුණ කිරීමට ඇති බාධාවක් ලෙස යි. හින්දු ප්‍රජාවට රජයෙන් ලැබෙන අවධානය සම්බන්ධයෙන් වඩාත් ආන්ත්‍රීකරණයට ලක් වී ඇත්තේ තමන් බවට මලෙයහ දමිල ප්‍රජාව විස්වාස කරයි. ඔවුන්ට අනුව හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙන් යම් ප්‍රතිපාදනයක් ලැබෙන්නේ ද එකී ප්‍රතිපාදන උතුරු සහ නැගෙනහිර පළාත්වල වෙසෙන හින්දු භක්තිකයන්ට ලැබීමට වැඩි නැමියාවක් ඇතිබව මලෙයහ දමිල ප්‍රජාව නියෝජනය කරන ප්‍රතිචාරකයන්ගේ විශ්වාසයයි.

**ආගමික නිදහස සහ හින්දු කාන්තාව**

මුස්ලිම් සමාජයේ මෙන් ම හින්දු සමාජයේද කාන්තාවට ඇති ආගමික නිදහස දෙයාකාරයකින් අභියෝගයට ලක්වන බව සම්මුඛ සාකච්ඡාවලින් පෙනී යයි. ඒ දෙයාකාරය නම් හින්දු කාන්තාවන්ට බාහිර සමාජයෙන් එල්ලවල අභියෝග සහ සිය ආගම ප්‍රජාව තුළින්ම එල්ලවල අභියෝගයි. බාහිර සමාජයෙන් එල්ලවන අභියෝග අතර ප්‍රධාන වන්නේ අන්‍යාගමිකරණයේ පහසු ඉලක්ක බවට කාන්තාවන් පත්වන බවයි. මේ සම්බන්ධයෙන් අදහස් දක්වන ලද ප්‍රතිචාරකයන් ප්‍රකාශ කළේ යුද්ධයෙන් පසු අවතැන් වූ බොහොමයක් යුධ වැන්දඹුවන් මෙම අනන්‍යාගමිකකරණයට ලක් වූ බවයි. යුධ වැන්දඹුවන්ව සිය ආගම වෙනස් කිරීමට හේතු වූ ප්‍රධාන කාරණාවන් දෙකක් සාකච්ඡාවල දී තවදුරටත් හඳුනාගැනීමට හැකි වේ. ඉන් එකක් වන්නේ, පශ්චාත් යුධ සමයේ යුධ වැන්දඹුවන් මුහුණ දුන් ආර්ථික අපහසුතාවයන් වලට පිළිසරණක් වූ ක්‍රිස්තියානි සභාවන්හි අනුගාමිකයන් වීමට ඔවුන් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූ බවයි. ඉන් අනෙක් කාරණය වුයේ පශ්චාත් යුධ සමය තුළ යුධ වැන්දඹුවන් විසින් මුහුණ දුන්නා යැයි කියන ලිංගික හිංසනයන්ට මුහුණදීමට අවශ්‍ය කරන ශක්තිය ක්‍රිස්තියානි සභාවන්හි කොටසක් බවට පත් වීමෙන් පසු ලැබුණ බව එම කාන්තාවන් විශ්වාස කිරීමයි.

හින්දු ආගමික කාන්තාවන්ගේ ආගමික නිදහස සිය ආගමික සංස්ථාව තුළ දීම අභියෝගයට ලක්වන අවස්ථා ද මෙම අධ්‍යයනය තුළදී වාර්තා විය. එනම්, හින්දු ආගම තුළ කාන්තාවන් කෙරෙහි පවතින ස්ථානය පුරුෂයන් හා සැසදුවිට දෙවැනි තැනක් ගන්නා බවත් හින්දු කාන්තාව බාහිර සමාජයෙන් සේම තම ආගම තුළත් සමච්චලයට හා නොවැදගත් කොට සැලකීමට ලක්වන බවත් බොහෝවිට දැකිය හැකි කරුණක් බව සම්මුඛ සාකච්ඡා මගිනි හෙළිදරව් විය. මෙහිදී ඔසප් වීමේදී හෝ ගැබ්ගෙන සිටියදී ආගමික කටයුතුවලට සහ චාරිත්‍ර වාරිත්‍රවලට පූර්ණ ලෙස සහභාගී වීමට කාන්තාවන්ට ඇති හැකියාව කෙරෙහි හින්දු ආගම තුළ ඇති පීතෘමූලික බලපෑම හේතුවන බව ප්‍රතිචාරකයන් පැහැදිලි කරයි. වැන්දඹුවන් සහ වඳභාවයට පත් කාන්තාවන් "අවාසනාවන්ත කාන්තාවන්" ලෙස සැලකීම නිසා ඔවුන්ගේ ආගමික නිදහස

තවදුරටත් අභියෝගයට ලක්වන බව ද සඳහන් කළ යුතු තවත් සුවිශේෂී කරුණකි. එසේම මෙම උල්ලංඝනයන් වීම කෙරෙහි ඒ ඒ කාන්තාවන්ගේ කුලය පදනම් වනු ඇති බව සඳහන් විය.

හින්දු ප්‍රජාව වර්තමානයේ තමන්ට ඇති ආගමික නිදහස පිළිබඳව මෙන් ම අනාගතයේදී සිය ආගමික නිදහසට ඇතිවිය හැකි අභියෝගයන් සම්බන්ධයෙන් ද කනස්සලෙන් සිටින ආගමික ප්‍රජාවක් බව පෙනීයයි. ඔවුන්ට සිය ආගම ඇදහීමට ඇති බාධාවන් අතර වඩාත් කැපී පෙනෙන බාධාවක් ලෙස හින්දු භක්තිකයන් හඳුනාගෙන ඇත්තේ අන්‍යාගමිකරණය ඔස්සේ සිය ප්‍රජාව ප්‍රමාණාත්මකව අඩුවීමේ තර්ජනයයි. අන්‍යාගමිකරණය ශ්‍රී ලංකාව තුළ හින්දු ප්‍රජාවට අනන්‍ය ආගමික කණ්ඩායමක් ලෙස පෙනී සිටීමට අභියෝගයට ලක් කරති. දිගුකාලීනව මෙම අභියෝගය ආගමික කාරණයකින් ඔබ්බට යන්න දේශපාලන බලය සම්බන්ධයෙන් කාරණයක් බවට පත්විය හැකි බව අධ්‍යයනය තුලින් පෙනීයයි. උදාහරණයක් ලෙස හින්දු භක්තිකයන් අඩු වීම හින්දු ප්‍රදේශවල සිංහල ජනවාස ඇතිවීම නැගෙනහිර පළාත් තුල මුස්ලිම් ජනතාවගේ ව්‍යාප්තිය වැනි කරුණු හේතු කොටගෙන් අඩු දේශපාලන නියෝජනයක් ලැබෙන දේශපාලනමය වශයෙන් කේවල් කිරීමේ හැකියාව අඩු කණ්ඩායමක් බවට පත්වීමේ තර්ජනයක් පිළිබඳව ද හින්දු ප්‍රජාව කනස්සල්ලට පත් වන බව මෙම අධ්‍යයනය තුල දැක්වූ අදහස් වලින් පෙනෙන්නට තිබුණි. අවසාන වශයෙන් පෙනෙන්නේ හින්දු ආගමික ප්‍රජාවට සිය ආගමික නිදහස සම්බන්දයෙන් ඇති ප්‍රශ්න දෙමළ ජනවාර්ගික ගැටලුවෙන් ද විතැන් කළ නොහැකි දේශපාලන බලය සම්බන්දයෙන් ඇති ගැටලුවක් ද වන බවයි.

## නිර්දේශයන්

මෙම පරිච්ඡේදයෙන් අපේක්ෂා කරන්නේ ශ්‍රී ලංකාව තුළ ආගමික නිදහස ඇති කිරීම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන්ගෙන් ඒ සඳහා අවශ්‍යය වන නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කිරීමයි. එම නිර්දේශයන්ගෙන් කිහිපයක් රාජ්‍ය මට්ටමේ මැදැහත්වීමකින් සිදුකල යුතු වුවත් ඇතැම් ඒවා ආගමික නායකයන් ඇතුලු සමාජයේ විවිධ කණ්ඩායම් වලට ද රාජ්‍ය නොවන සංවිධාන වලටද මෙම විෂය සම්බන්ධව උනන්දුවක් දක්වන අනෙකුත් පාර්ශවයන්වලට ක්‍රියාත්මක කළ හැකි ඒවාය. තවද මෙම නිර්දේශයන්ගෙන් සමහරක් කෙටිකාලීනව ක්‍රියාත්මක කළ හැකි වුවත් තවත් සමහරක් ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යකාලීන හෝ දිගුකාලීන මැදිහත්වීම් අවශ්‍යය වේ.

- ආගමික නිදහස පිළිබඳ සිදුකරන මැදිහත්වීමක දී එම මැදිහත් වීම ජාතික මට්ටමේදී ආගමික නිදහස සම්බන්ධයෙන් ඇති ගැටලුවලින් ඔබ්බට ගොස් ප්‍රාදේශීය මට්ටමේ යථාර්ථයන් පිළිබඳ දැනුවත් වීම වැදගත් වේ. මෙම අධ්‍යනයේදී ප්‍රධාන වශයෙන් ම විශ්ලේෂණයට භාජනය කළ හැකි දෙයක් වූයේ පසුගිය කාලය තුළ සිදු වූ ජාතික මට්ටමේ අවධානයක් දිනාගත් මුස්ලිම් විරෝධී ක්‍රියාවන්ට අමතරව ප්‍රාදේශීය මට්ටමේදී ක්‍රිස්තියානි සහ හින්දු භක්තිකයන් ආගමික නිදහස සම්බන්ධයෙන් විවිධ අභියෝගයන්ට මුහුණ දී ඇති බවයි. නමුත් පසුගිය කාලය තුළ ජාතික මට්ටමේදී ආගමික නිදහස සම්බන්ධයෙන් සිදු වූ සාකච්ඡා වලදී මුස්ලිම්වරුන්ගේ ප්‍රශ්නයට

ලැබුණු අවධානය තරම් ම අවධානයක් ක්‍රිස්තියානි සහ හින්දු භක්තිකයන්ට ලැබෙනු දැක ගත නොහැකි විය.

- කිසියම් ආගමික කණ්ඩායමක ආගමික නිදහස සම්බන්ධයෙන් සිදුකරන මැදිහත් වීමකදී එම ආගම අදහන සියලු අනුගාමිකයන් එක් පොදු කුලකයකට ගෙන මැදිහත්වීම නොකළ යුතුය. මන්ද එම ආගමික කණ්ඩායම තුළ සිටින අනුගාමිකයන් එකිනෙකට වෙනස් භූගෝලීය, සමාජීය, සංස්කෘතික හා ආර්ථික කරුණු පදනම් කරගෙන සිය ආගමට අදාළ වෙනස් ස්වරූපයන්ගෙන් යුතු අභියෝගයන් ලක්විය හැකි බැවිනි. නිදසුනක් ලෙස හින්දු ප්‍රජාවට ඇති අභියෝග හින්දු ප්‍රජාව ජීවත්වන භූගෝලීය පරිසරයට අදාළ ආර්ථික, දේශපාලන සහ සංස්කෘතික කරුණු අනුව වෙනස් වේ. එහිදී ශිව සේනා සංවිධානයේ බලපෑම ආගමික නිදහසට බලපාන ආකාරය නැගෙහිර පළාතේ සහ මධ්‍යම පළාතේ ජීවත් වූ හින්දු භක්තිකයන් ඉදිරිපත් කළ ආකාරය යාපනයේ හින්දු භක්තිකයන් ඉදිරිපත් කළ ආකාරයට වඩා වෙනස්ය. තවද, හින්දු භක්තිකයන්ගේ අන්‍යාගමිකකරණයට අදාළ කාරණා කුලය සහ සමාජ පන්තිය අනුව වෙනස් වන බවද මෙම අධ්‍යනයේදී පැහැදිලි විය. තවත් උදාහරණයක් ලෙස ක්‍රිස්තියානි ප්‍රජාව මුහුණ දෙන ආගමික නිදහස සම්බන්ධ ගැටලු ක්‍රිස්තියානි ප්‍රජාව තුළම තිබෙන විවිධ සභාවන් අනුව වෙනස් වන බව මෙම අධ්‍යනයේදී පැහැදිලි විය. එහිදී සුව කිරීමේ මෙහෙයවල කෘත්‍ය සම්බන්ධයෙන් සභාවෙන් සභාවට පොදු එකගතාවයක් නොමැති බවත් ඒ ඒ සභාවන්  සුවකිරීමේ මෙහෙයන් සිදු කරන ආකාරය අනුව  මුහුණ දෙන අභියෝගයන් එකිනෙකට වෙනස් වන බව මෙම අධ්‍යනයේදී පැහැදිලි වේ.
- ආගමික නිදහස සම්බන්ධයෙන් සාකච්ඡාවන් බොහෝවිට ඇති වෙන්නේ ආගමික නිදහසට තර්ජනයක් ඇති වූ විටය. එම නිසා ආගමික නිදහස සම්බන්ධයෙන් ජාතික මට්ටමේ ප්‍රවේශයන් වලට අමතරව ප්‍රාදේශීය මට්ටමෙන් ඇති විය හැකි අභියෝග සඳහා ඒ ඒ සිද්ධිය වෙන වෙනම අධ්‍යයනය කර ඊට අදාළව විසඳුම් ඉදිරිපත් කිරීමක් කළ හැකි යාන්ත්‍රණයක් ඇති කිරීම මගින් ආගමික නිදහස සම්බන්ධ ගැටලු වඩාත් අර්ථාන්විත ආකාරයකට විසඳාගත හැකිය.
- ශ්‍රී ලංකාව තුළ ආගමික නිදහස සම්බන්ධයෙන් කරන මැදිහත්වීමකදී අන්‍යාගමිකකරණය යන කාරණයට මූලික අවධානයක් යොමු කිරීම වැදගත් වේ. අන්‍යාගමිකරණය යන්න පිළිබඳව ආගමික ප්‍රජාවන් දැඩි ලෙස චෝදනාවන් එල්ල කරයි. ඊට ප්‍රතිවිරුද්ධ ලෙස ඉදිරිපත් වන අදහසක් වන්නේ කෙනෙකුට තමන්ගේ ආගම මාරු කිරීමට ඇති අයිතිය ආගමික නිදහස උල්ලංඝණය කිරීමකට වඩා ආගමික නිදහස සහතික කිරීමේ ක්‍රියාවක් ලෙසටය. මෙම මතවාද දෙක අතර ඇතිවන ගැටුමේ ප්‍රතිඵලයක් ලෙස සදාචාර විරෝධී අන්‍යාගමිකකරණය පිළිබඳ සාකච්ඡාවක් පැමිණ ඇත. නමුත් සදාචාර විරෝධී අනන්‍යාගමිකකරණය යන්න අර්ථ දැක්වීම එතරම් පහසු කටයුත්තක් නොවේ. උදාහරණයක් ලෙස යුධ වැන්දඹු කාන්තාවන් ක්‍රිස්තියානි සභා මගින් ලබන රැකවරණය එම කාන්තාවන්ට සිය ආගම ස්වේච්ඡාවෙන් වෙනස් කිරීමට අවශ්‍ය කරන පෙළඹවීමක් ඇති කළ බව සම්මුඛ සාකච්ඡා වලදී හෙළි විය. නමුත් ඊට ප්‍රතිවිරුද්ධව එල්ල වන මතය නම් ක්‍රිස්තියානි සභාවන් ආන්ථිකරණය ලක් වූ ප්‍රජාවන් ඉලක්ක කර ගන්නේ අන්‍යගමිකකරණය සම්බන්ධයෙන්

එම ප්‍රජාවන් තුළ අවස්ථාවක් පවතින බැවින් වන බවයි. මෙම පසුබිම තුළ ආගමික කණ්ඩයම් අතර ආතතියක් ඇති කරන ප්‍රශ්නයක් බවට අන්‍යාගමිකකරණය පත්ව ඇත. නමුත් මෙම ප්‍රශ්නයේ සංකීර්ණභාවය මෙම ප්‍රශ්නයට විසඳුම් ඉදිරිපත් කිරීමට ඇති අවශ්‍යතාවය අඩු නොකරයි.

- ආගමික නිදහස සම්බන්ධයෙන් යම් යම් ආගමික කණ්ඩායම් විසින් ඉදිරිපත් කරන චෝදනා මගින් කිසියම් ආගමික විශ්වාසයක් චෝදනාවට ලක් කරනවාට වඩා යම් යම් පූජකයන්ගේ පුද්ගලානුබද්ධ ආගම ඇදහීමේ ක්‍රම චෝදනාවට ලක් කිරීම දැක ගතහැකිය. මෙම ක්‍රම සමග එකග නොවන එම ආගමේ ම අනෙකුත් පූජකයන් සඳහන් කරන්නේ එක් පුද්ගලයකුගේ වැරදි නිසා ඔවුන්ටත් වන්දි ගෙවීමට සිදුවන බවයි. නිදර්ශනයක් ලෙස ක්‍රිස්තියානි සභාවක පූජකයෙක් සඳහන් කළේ ඇතැම් ක්‍රිස්තියානි පූජකයන් ධර්මය පිළිබඳ නිසි අවබෝධයකින් තොරව ධර්ම ප්‍රචාර කටයුතු සිදු කිරීමට යාම තුළින් හින්දු භක්තියන් තුළ ක්‍රිස්තියානි සභාවන් පිළිබඳ වැරදි වැටහීමක් ඇති කරගන්නා බවයි. එම පූජකයා තවදුටත් ප්‍රකාශ කළේ යම් යම් පූජකයින් තමන්ගේ ආගමික විශ්වාසය මිහිපිට තිබිය හැකි එකම ආගමික විශ්වාසය යන දැඩි මතයේ එල්බ සිට ධර්මය ප්‍රචාරය කටයුතු සිදු කිරීම නිසා මෙම ආතතීන් ඇති වන බවයි. මේ නිසා ආගමික කණ්ඩායම්වලට අවම ප්‍රමිතීන් පවත්වා ගැනීම, පුද්ගලානුබද්ධ ක්‍රියාවන් මගින් ඒ ඒ ආගම්වලට විය හැකි හානිත් එම ආගම්වලින් අනෙකුත් ආගම්වලට විය හැකි හානිත් අවම කර ගැනීමට උපකාර විය හැකිය.
- ආගමික නිදහස සම්බන්ධයෙන් අභියෝගයට ලක් වූ ඇතැම් ආගමික කණ්ඩායම් ප්‍රකාශ කර සිටින්නේ අනෙකුත් ආගමික කණ්ඩයම්වල නොදැනුවත්කම හේතුකොටගෙන සිය ආගමික නිදහසට අභියෝග එල්ල කරන බවයි. උදාහරණයක් ලෙස මුස්ලිම්වරුන්ගේ ආගමික පිළිවෙත් සම්බන්ධයෙන් ඇති නොදෙනුවත්කම හේතුකොටගෙන ඔවුන් දෙස සැකයෙන් බැලීමත් ඔවුන්ට තර්ජනය කිරීමත් අනෙකුත් ආගමික කණ්ඩායම් උත්සාහ කරනු ලබන බව මෙම අධ්‍යනයේදී වාර්තා විය. මෙම ආගමික කණ්ඩායම්වලට ඇති නොදැනුවත්කම ප්‍රයෝජනයට ගනු ලබන ඇතැම් මූලධර්මවාදී කණ්ඩායම් මුස්ලිම්වරුන් සම්බන්ධයෙන් වැරදි ප්‍රචාර ගෙන යන බවත් අනෙකුත් ආගමික කණ්ඩායම්වල නොදැනුවත්කම හේතුකොට ගෙන මෙම ප්‍රචාරණවලට ඔවුන් හසුවන බවත් සම්මුඛ සාකච්ඡාවලදී වාර්තා විය. මේ නිසා පාසල් මට්ටමේ සිටම අනෙකුත් ආගමික සිරිත් විරිත් සම්බන්ධයෙන් අධ්‍යාපනයක් ලබා දී සෑම ආගමික කණ්ඩායමකට ම වැදගත් වනු ඇත.
- ආගමික ස්ථාන වල සිදු කරනු ලබන පුදපූජාවන් වලදී නිකුත්වල ශබ්ධය සම්බන්ධ සෑම ආගමික කණ්ඩායමක් ම අනෙකුත් ආගමික කණ්ඩායම්වලට චෝදනා කරයි. මෙහිදී බොහෝවිට චෝදනා එල්ල වන්නේ ශබ්ධ විකාශන යන්ත්‍ර භාවිතා කිරීම සම්බන්ධයෙනි. අධික ශබ්ධය සම්බන්ධයෙන් චෝදනා එල්ල කරන පුද්ලයන් එය තම දෛනික ජිවිතයේ කටයුතුවලට බාධාවක් ලෙස දකී. එවැනි පුද්ගලයන්ගේ චෝදනාවට ලක්වන ආගමික කණ්ඩායම් එලෙස චෝදනා කිරීම සිය ආගමික නිදහසට බාධාවක් ලෙස දකී. මෙහිදී සෑම ආගමික කණ්ඩායමක්ම විටෙක් චූදිතයෙක් මෙන්ම විටෙක් වින්දිතයෙක් බවට පත් වේ. එම නිසා සිද්ධස්ථාන මගින් නිකුත් වන ශබ්ධයන් සම්බන්ධයෙන් අවම ප්‍රමිතීන් ඇති කිරීම මෙන්ම එම ප්‍රමිතීන් ප්‍රායෝගිකව අනුගමනය කරනවා යන සොයාබැලීම ආගමික නිදහස සම්බන්ධයෙන් වැදගත් කාරණයකි.

- ආගමික නිදහස අධ්‍යාත්මික කාරණයක් පමණක් නොව එය දේශපාලන කාරණයක් වශයෙන් ද සලකමින් ආගමික නිදහස ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් සැලසුම් සකස් කිරීම වැදගත් වේ. නිදසුනක් ලෙස මුස්ලිම්වරුන්ට සිය ආගමික නිදහසට ඇති බාධාවන් තුළ ක්‍රියාත්මක වුයේ අනෙකුත් ආගමික ප්‍රජාවන්ගේ ආධ්‍යාත්මික විශ්වාසයන්ට වඩා පක්ෂ දේශපාලනික අවශ්‍යතා බව මෙම අධ්‍යයනය තුළ නිරීක්ෂණය කිරීමට හැකි විය. එමෙන්ම  උතුරේ හින්දු භක්තිකයන්ගේ ආගමික නිදහසට එල්ලවන අභියෝග තුළ දකුණේ දේශපාලනික අවශ්‍යතා මෙන්ම ඉන්දියානු දේශපාලන අවශ්‍යතා බලපාන බව ද මෙම අධ්‍යනයේදී පෙනී ගියේය. රට තුළ වාර්තමානයේ පවතින දේශපාලන සහ ආර්ථික අර්බුද හමුවේ ආගමික නිදහසට සිදුවිය හැකි දේශපාලනික බලපෑම තවදුරටත් වැඩි විය හැකි බැවින් ආගමික නිදහස ඇති කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන විසින් ආගමික නිදහසට දේශපාලනයේ ඇති බලපෑම සැලකිල්ලට ගෙන කටයුතු කිරීම වැදගත් වේ.
- දේශපාලනය මෙන්ම ආගමික නිදහස අභියෝගයට ලක්වන තවත් කාරණයක් ලෙස නිදහස් වෙළඳපොල ආර්ථික ක්‍රමය තුළ ඇති වන ව්‍යාපාර තරගය හැඳින්විය හැකිය. මෙහිදී ආගම ව්‍යාපාරික ජයග්‍රහණ සඳහා මෙවලමක් ලෙස භාවිතා කරන බව මෙම අධ්‍යනයේදී පැහැදිලි වේ. එම නිසා ව්‍යාපාරය කටයුතු වලදී තම ලාභය උපරිම කර ගැනීම සඳහා සදාචාර විරෝධී ලෙස කටයුතු ආයතන වලට විරුද්ධව මතජන මතයක් ගොඩනැගීම මෙම ව්‍යාපාරික අවශ්‍යතා නිසා අභියෝගයට ලක්වන ආගමික ප්‍රජාවන්ගේ ආගමික නිදහස තහවුරු කිරීමට වැදගත් වනු ඇත.
- ඉහත දක්වන ලද නිර්දේශයන්ට අමතරව ආගමික නිදහසට බාධාවක් ලෙස මෙම අධ්‍යනයේදී හඳුනාගත් යම් යම් නීති සහ රෙගුලාසි සංශෝධනය කිරීම මෙන්ම නව නීති රීති සහ රෙගුලාසි හඳුනවා දීමට කටයුතු කිරීමද ආගමික නිදහස තහවුරු කිරීමට වැදගත් වේ. ඒවා අතර ප්‍රධාන වශයෙන්ම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මගින් නිශ්චිත ආගමික ප්‍රජාවන්ට සිදු විය හැකි හානි ඉවත් කිරීම , අලුතින් සිද්ධස්ථාන ඇති කිරීම සම්බන්ධයෙන් 2008 චක්‍රලේඛය අවභාවිතා කිරීමට එරෙහිව ක්‍රියාත්මක වීම, එක් - රටක් එක් නීතියක් යන කාර්ය සාධන බලකාය තුළ ඇති පක්ෂපාතී ස්වරූපය නැති කිරීම, අන්‍යාගමිකකරණය සම්බන්ධයෙන් පනත් කෙටුම්පත් කිරීමේදී සියලුම ආගමික කණ්ඩායම්වල අදහස් විමසීම, වෛරී ප්‍රකාශන සම්බන්ධයෙන් පවතින ප්‍රතිපාදන ප්‍රායෝගිකව භාවිතා කිරීම ආදිය දැක්විය හැකිය.
- අවසාන වශයෙන් ආගමික නිදහස සම්බන්ධයෙන් සඳහන් කළ යුත්තේ ආගමික නිදහසට තර්ජනයක් වී ඇතැයි ප්‍රකාශ කරන බොහෝ ආගමික කණ්ඩායම් සඳහන් කරන පරිදි රාජ්‍ය බහුතරයේ ආගමට පක්ෂපාතී වීම තුළ අනෙකුත් ආගමික කණ්ඩායම්වල අයිතීන් සීමා වීමට ලක්වන බවයි. මෙය වෙනස්කිරීම සම්බන්ධයෙන් මැදිහත් වීම කෙටිකාලීනව හෝ මධ්‍යකාලීනව සිදුකළ හැක්කක් නොවන අතර දීර්ඝකාලීනව ශ්‍රී ලංකා රාජ්‍යයේ ස්වරූපය කුමක් විය යුතු දැයි සිදු කරනු ලබන සාකච්ඡාවකින් තීරණය විය යුතුය. ඊට ව්‍යාවස්ථාව මගින් සිදුවන සංශෝධනයන් රාජ්‍ය ආයතනවල යම් යම් භාවිතාවන්, රටේ අධ්‍යපන ක්‍රමය සකස් වී ඇති ආකාරය, ජනමාධ්‍ය භාවිතය යන ආදිය ඇතුලත් විය හැකිය.

# ඇමුණුම

පහත ප්‍රස්තාර ජාතික සාම මණ්ඩලය විසින් 2018 දී පවත්වන ලද ආගමික නිදහස් දර්ශකයෙන් උපුටා ගන්නා ලදී.





**Figure 1: Generally how freely do you think religious activities of your religion can be practiced in the country?**





**Figure 2: Generally, how freely do you think religious activities of your religion can be practiced in the country? (by religion)**





**Figure 3: How freely can your religion be practiced in this area? (by religion)**





**Figure 4: Religio-Cultural Insecurities about the Current State of Affairs**





**Figure 5: Religious groups concerned regarding unethical religious conversions**





**Figure 6: Religious groups concerned about increased unethical religious conversions of their community members in the future**

| | Buddhist | Hindu | Muslim | Catholic | Christian |
|---|---|---|---|---|---|
| No worries about the current situation | 46.2% | 49.4% | 78.2% | 43.9% | 53.4% |
| Little worried about the current situation | 46.2% | 36.5% | 18.4% | 46.6% | 36.5% |
| Very worried about the current situation | 7.6% | 14.1% | 3.4% | 9.5% | 10.1% |
| Base | 197 | 156 | 174 | 148 | 148 |

**Table 1: Religio-Cultural Insecurities about the Current State of Affairs (by religion)**

| | | Agree | Disagree | Don't Know | Base |
|---|---|---|---|---|---|
| People of my religious group may have to leave this area/city | Buddhist | 12.2% | 87.3% | .5% | 197 |
| | Hindu | 14.1% | 71.2% | 14.7% | 156 |
| | Muslim | 4.0% | 89.1% | 6.9% | 174 |
| | Catholic | 10.8% | 79.1% | 10.1% | 148 |
| | Christian | 7.4% | 83.1% | 9.5% | 148 |
| People of my religious groups will gradually convert to other religion | Buddhist | 30.5% | 61.9% | 7.6% | 197 |
| | Hindu | 28.8% | 59.0% | 12.2% | 156 |
| | Muslim | 2.9% | 93.7% | 3.4% | 174 |
| | Catholic | 21.6% | 67.6% | 10.8% | 148 |
| | Christian | 12.8% | 76.4% | 10.8% | 148 |
| People of my religious group will not be able express their views freely | Buddhist | 13.2% | 83.8% | 3.0% | 197 |
| | Hindu | 23.7% | 61.5% | 14.7% | 156 |
| | Muslim | 10.3% | 80.5% | 9.2% | 174 |
| | Catholic | 8.8% | 77.7% | 13.5% | 148 |
| | Christian | 18.2% | 67.6% | 14.2% | 148 |
| People of my religious group will not be able to practice their religion freely | Buddhist | 13.2% | 84.3% | 2.5% | 197 |
| | Hindu | 20.5% | 64.7% | 14.7% | 156 |
| | Muslim | 12.6% | 75.9% | 11.5% | 174 |
| | Catholic | 6.8% | 79.7% | 13.5% | 148 |
| | Christian | 18.2% | 70.9% | 10.8% | 148 |
| People of other religious groups will be the rich class in this area in the future | Buddhist | 29.4% | 54.8% | 15.7% | 197 |
| | Hindu | 25.0% | 45.5% | 29.5% | 156 |
| | Muslim | 14.9% | 66.7% | 18.4% | 174 |
| | Catholic | 19.6% | 56.1% | 24.3% | 148 |
| | Christian | 20.3% | 54.7% | 25.0% | 148 |
| People of my religious group will not be able to get fair treatment from legal and law enforcement authorities in this area | Buddhist | 14.7% | 80.2% | 5.1% | 197 |
| | Hindu | 33.3% | 42.3% | 24.4% | 156 |
| | Muslim | 23.0% | 64.4% | 12.6% | 174 |
| | Catholic | 13.5% | 75.0% | 11.5% | 148 |
| | Christian | 20.3% | 66.9% | 12.8% | 148 |
| People of my religious group will not get the attention of the national politicians in the area | Buddhist | 16.8% | 77.7% | 5.6% | 197 |
| | Hindu | 33.3% | 41.7% | 25.0% | 156 |
| | Muslim | 22.4% | 62.1% | 15.5% | 174 |
| | Catholic | 20.3% | 58.8% | 20.9% | 148 |
| | Christian | 21.6% | 58.1% | 20.3% | 148 |

**Table 2: Perceived Religio-Cultural Insecurities about the Future (by religion)**

#MINORMATTERS